**ශීර්ෂය 102 - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු - 2013**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 244 | වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 247 | ශ්‍රී ලංකා රේගුව |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව |
| 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 296 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව |
| - | මිලෝදා ආයතනය |
| - | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන |

**2.** **ගිණුම්**

-------

2.1 **විසර්ජන ගිණුම්**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු විස්සක් (20) ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,260,827,756,685 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.1,190,354,168,158 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.972,525 ත් රු. 66,855,352,572 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.08 ත් සියයට 47.95 ත් අතර පරාසයක පැවැතිණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂය** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| 102 | 2,620,456,538 | 1,381,260,819 | 1,239,195,719 | 47.29 |
| 237 | 162,737,000 | 157,357,928 | 5,379,072 | 3.31 |
| 238 | 99,525,000 | 70,211,578 | 29,313,422 | 29.45 |
| 239 | 1,736,424,000 | 1,571,249,498 | 165,174,502 | 9.51 |
| 240 | 2,558,955,000 | 2,023,730,115 | 535,224,885 | 20.92 |
| 241 | 54,985,000 | 47,451,961 | 7,533,039 | 13.70 |
| 242 | 50,400,000 | 36,268,168 | 14,131,832 | 28.04 |
| 243 | 2,974,225,000 | 1,547,978,790 | 1,426,246,210 | 47.95 |
| 244 | 834,450,000 | 751,905,041 | 82,544,959 | 9.89 |
| 245 | 140,750,000 | 139,777,475 | 972,525 | 0.69 |
| 246 | 1,931,180,000 | 1,875,888,898 | 55,291,102 | 2.86 |
| 247 | 2,273,401,000 | 2,271,469,960 | 1,931,040 | 0.08 |
| 248 | 668,460,000 | 664,757,971 | 3,702,029 | 0.55 |
| 249 | 1,240,555,572,018 | 1,173,700,219,446 | 66,855,352,572 | 5.39 |

| | | | | |
|---|---|---|---|---|
| 250 | 47,785,000 | 43,581,211 | 4,203,789 | 8.80 |
| 251 | 2,298,940,000 | 2,294,908,211 | 4,031,789 | 0.17 |
| 252 | 1,650,471,129 | 1,628,508,165 | 21,962,964 | 1.33 |
| 280 | 81,245,000 | 68,163,107 | 13,081,893 | 16.10 |
| 296 | 46,120,000 | 42,873,288 | 3,246,712 | 7.04 |
| 323 | 14,365,000 | 13,204,907 | 1,160,093 | 8.08 |
| 324 | 27,310,000 | 23,401,621 | 3,908,379 | 14.31 |
| **එකතුව** | **1,260,827,756,685** | **1,190,354,168,158** | **70,473,588,527** | **5.59** |

2.2 **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු එකොළහක් (11) ක් විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත හැටක් (60) සඳහා එකතුව රු. මිලියන 1,179,544 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදායම් ලෙස රු. මිලියන 1,048,553 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 32 ත් සියයට 1852 ත් අතර පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | තථ්‍ය ආදායම | (අඩුවෙන් )/ වැඩියෙන් එකතුකිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 10.01.01.00 | 82,591,000,000 | 74,668,082,758 | (7,922,917,242) | 90.41 |
| - එම - | 10.01.02.00 | 20,000,000 | 21,663,617 | 1,663,617 | 108.32 |
| ආනයන අපනයන පාලක | 10.01.03.00 | 520,000,000 | 458,372,096 | (61,627,904) | 88.15 |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 10.01.04.00 | 61,004,000,000 | 61,505,872,213 | 501,872,213 | 100.82 |
| - එම- | 10.01.05.01 | 37,362,000,000 | 33,004,053,398 | (4,357,946,602) | 88.34 |
| - එම- | 10.01.05.02 | 3,120,000,000 | 3,087,148,683 | (32,851,317) | 98.95 |
| - එම- | 10.01.07.00 | -- | 1,346,970 | 1,346,970 | -- |
| - එම- | 10.01.08.00 | 50,106,000,000 | 46,704,765,201 | (3,401,234,799) | 93.21 |
| - එම- | 10.02.05.01 | 58,222,000,000 | 58,534,245,572 | 312,245,572 | 100.54 |
| - එම- | 10.02.05.02 | -- | 76,847 | 76,847 | |
| - එම- | 10.02.05.03 | 35,849,000,000 | 27,130,554,960 | (8,718,445,040) | 75.68 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - එම- | 10.02.05.04 | 71,906,000,000 | 55,517,438,890 | (16,388,561,110) | 77.21 |
| - එම- | 10.02.05.99 | 5,347,000,000 | 2,516,110,135 | (2,830,889,865) | 47.06 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.01.01 | 24,962,000,000 | 21,203,506,388 | (3,758,493,612) | 84.94 |
| - එම- | 10.02.01.02 | 63,504,000,000 | 56,174,589,835 | (7,329,410,165) | 88.46 |
| - එම- | 10.02.01.03 | 42,999,000,000 | 43,718,740,385 | 719,740,385 | 101.67 |
| - එම- | 10.02.01.04 | 123,888,000,000 | 96,590,086,435 | (27,297,913,565) | 77.97 |
| - එම- | 10.02.02.01 | 12,700,000 | 10,654,808 | (2,045,192) | 83.90 |
| - එම- | 10.02.02.02 | 2,500,000 | 5,321,938 | 2,821,938 | 212.88 |
| - එම- | 10.02.03.01 | 2,435,000 | 2,149,612 | (285,388) | 88.28 |
| සුරාබදු කොමසාරිස් ජනරාල් | 10.02.04.01 | 68,103,000,000 | 66,008,326,747 | (2,094,673,253) | 96.92 |
| - එම- | 10.02.06.00 | 35,000,000 | 33,042,507 | (1,957,493) | 94.41 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.08.00 | -- | -83,401 | (83,401) | |
| - එම- | 10.02.09.00 | 11,776,000 | 218,080,060 | 206,304,060 | 1851.90 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් | 10.02.10.00 | 14,000,000 | 32,398,568 | 18,398,568 | 231.42 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 10.02.11.00 | 26,795,000,000 | 24,445,219,973 | (2,349,780,027) | 91.23 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.12.01 | 18,242,750,000 | 13,698,077,514 | (4,544,672,486) | 75.09 |
| - එම- | 10.02.12.02 | 10,818,250,000 | 11,544,642,412 | 726,392,412 | 106.71 |
| - එම- | 10.02.12.03 | 19,721,000,000 | 15,693,950,765 | (4,027,049,235) | 79.58 |
| - එම- | 10.03.03.00 | 850,000,000 | 591,870,451 | (258,129,549) | 69.63 |
| - එම- | 10.03.04.00 | 2,000,000,000 | 1,197,409,071 | (802,590,929) | 59.87 |
| - එම- | 10.03.05.00 | 1,250,000,000 | 750,907,497 | (499,092,503) | 60.07 |
| - එම- | 10.03.09.00 | 82,000,000 | 96,741,230 | 14,741,230 | 117.97 |
| - එම- | 10.04.01.01 | 86,312,400,000 | 84,090,576,856 | (2,221,823,144) | 97.43 |
| - එම- | 10.04.01.02 | 9,450,000,000 | 9,767,479,326 | 317,479,326 | 103.36 |
| - එම- | 10.04.01.03 | 233,600,000 | 195,441,368 | (38,158,632) | 83.66 |
| - එම- | 10.04.04.00 | 12,763,000,000 | 6,595,600,863 | (6,167,399,137) | 51.68 |
| - එම- | 10.04.02.01 | 22,818,000,000 | 18,558,406,098 | (4,259,593,902) | 81.33 |
| - එම- | 10.04.03.01 | 98,519,000,000 | 77,679,122,230 | (20,839,877,770) | 78.85 |
| - එම- | 10.04.03.99 | 432,000,000 | 254,908,743 | (177,091,257) | 59.01 |
| - එම- | 10.04.02.99 | 8,990,000,000 | 8,524,096,082 | (465,903,918) | 94.82 |
| ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් | 20.01.03.00 | 253,000,000 | 82,000,000 | (171,000,000) | 32.41 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.02.01.01 | 612,000,000 | 620,889,832 | 8,889,832 | 101.45 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - එම- | 20.02.01.99 | 80,000,000 | 62,139,098 | (17,860,902) | 77.67 |
| - එම- | 20.02.02.01 | 8,167,000,000 | 8,178,888,527 | 11,888,527 | 100.15 |
| - එම- | 20.02.02.99 | 1,610,000,000 | 1,485,088,434 | (124,911,566) | 92.24 |
| රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් | 20.02.03.00 | 40,797,000,000 | 30,400,250,000 | (10,396,750,000) | 74.52 |
| - එම- | 20.02.04.00 | 4,708,000,000 | 4,768,286,230 | 60,286,230 | 101.28 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.01.00 | 125,000,000 | 108,144,039 | (16,855,961) | 86.52 |
| ප්‍රධාන තක්සේරු | 20.03.02.09 | 30,000,000 | 59,347,451 | 29,347,451 | 197.82 |
| රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.11 | 34,000,000 | 33,166,448 | (833,552) | 97.55 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.99 | 7,000,000,000 | 7,497,293,400 | 497,293,400 | 107.10 |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.17 | 95,000,000 | 91,519,377 | (3,480,623) | 96.34 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.03.00 | 6,000,000,000 | 2,274,461,399 | (3,725,538,601) | 37.91 |
| - එම- | 20.03.99.00 | 4,000,000,000 | 11,430,262,069 | 7,430,262,069 | 285.76 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් | 20.05.01.00 | 17,350,000,000 | 26,350,000,000 | 9,000,000,000 | 151.87 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.05.99.00 | 2,200,000,000 | 2,172,620,652 | (27,379,348) | 98.76 |
| - එම- | 20.06.02.00 | 800,000,000 | 280,283,429 | (519,716,571) | 35.04 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.06.04.00 | 16,825,000,000 | 15,968,526,609 | (856,473,391) | 94.91 |
| - එම- | 30.01.01.00 | 20,000,000,000 | 15,858,996,167 | (4,141,003,833) | 79.29 |
| | | 1,179,544,411,000 | 1,048,553,158,862 | (130,991,252,138) | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු විස්සක් (20) වෙත රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 10201 | 16,000,000 | 12,467,028 | 8,000,000 | 9,367,156 | 70,000,000 | 47,717,912 |
| 23701 | 5,000,000 | 4,768,895 | 2,500,000 | 3,204,984 | 30,000,000 | 16,816,024 |
| 23801 | 3,000,000 | 1,222,471 | 1,000,000 | 1,169,046 | 10,000,000 | 6,270,721 |
| 23901 | 4,500,000 | 3,398,541 | 2,500,000 | 3,948,814 | 32,000,000 | 16,842,744 |
| 24001 | 8,000,000 | 5,868,359 | 3,800,000 | 4,048,563 | 37,000,000 | 20,968,250 |
| 24101 | 4,000,000 | 3,437,485 | 1,500,000 | 2,781,752 | 18,000,000 | 9,854,119 |
| 24201 | 4,500,000 | 3,228,934 | 2,000,000 | 2,262,581 | 23,000,000 | 10,761,127 |
| 24301 | 2,500,000 | 784,543 | 400,000 | 785,536 | 7,600,000 | 3,595,805 |
| 24401 | 3,000,0000 | 1,490,716 | 1,200,000 | 2,010,483 | 12,000,000 | 6,568,406 |
| 24501 | 4,000,000 | 2,008,466 | 1,000,000 | 1,824,841 | 18,000,000 | 8,974,194 |
| 24601 | 85,000,000 | 83,993,642 | 50,000,000 | 56,164,415 | 295,000,000 | 254,694,571 |
| 24701 | 42,000,000 | 29,090,663 | 35,000,000 | 48,837,596 | 300,000,000 | 226,834,507 |
| 24801 | 40,000,000 | 28,157,639 | 22,000,000 | 26,403,655 | 198,000,000 | 762,039 |
| 24901 | 4,500,000 | 3,861,292 | 2,800,000 | 3,056,608 | 24,000,000 | 17,870,335 |
| 25001 | 4,000,000 | 1,911,961 | 1,500,000 | 1,727,470 | 18,000,000 | 6,716,844 |
| 25101 | 17,000,000 | 16,762,003 | 12,000,000 | 13,498,273 | 70,000,000 | 61,042,277 |
| 25201 | 50,000,000 | 23,007,040 | 22,000,000 | 30,743,047 | 215,000,000 | 131,355,351 |
| 28001 | 4,000,000 | 2,706,518 | 2,200,000 | 2,827,662 | 20,000,000 | 11,711,689 |
| 29601 | 4,000,000 | 1,530,266 | 2,000,000 | 2,202,514 | 18,000,000 | 12,783,664 |
| 32301 | 1,200,000 | 215,908 | 200,000 | 434,207 | 3,000,000 | 457,047 |
| 32401 | 2,000,000 | 1,486,994 | 1,200,000 | 1,350,714 | 11,000,000 | 7,371,542 |

### 2.3.2 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් කටයුතු දෙකක් (02) වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 250 | 25002 | 4,250,000 | 4,083,973 | 4,062,000 | 4,335,756 | 3,500,000 | 909,279 |
| 250 | 25003 | 10,000,000 | -- | 2,500,000 | 32,059,205 | 513,000,000 | 458,399,948 |

2.4 **අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

**2.4.1 අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හයක (06) 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂවල එකතුව රු. 39,774,601 ක් විය. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 7002/0000/00/0262/0013/000 | 83,325 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0069/0013/000 | 9,847,209 |
| ශ්‍රී ලංකා රේගුව | 7002/0000/00/0071/0013/000 | 4,751,600 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 7002/0000/00/0072/0013/000 | 24,492,707 |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0260/0013/000 | 7,500 |
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0037/0013/000 | 592,260 |
| **එකතුව** | | **39,774,601** |

**2.4.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දහහතරක (14) 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 12,353,753,546 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0016/000 | 119,475 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0118/000 | 33,325 |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0120/000 | 550 |
| වෙළඳ , තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0124/000 | 22,975 |
| රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0025/000 | 265,995 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0126/000 | 42,602,599 |
| | 6000/0000/00/0014/0003/000 | 1,594,368,043 |
| ශ්‍රී ලංකා රේගුව | | |
| - විවිධ තැන්පතු ගිණුම | 6000/0000/00/0015/0127/000 | 3,991,909.988 |
| - රේගු අතිකාල හා නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල | 6000/0000/00/0006/0032/000 | 1,498,725,835 |
| - රේගු නිලධාරින්ගේ කලමනාකරණ වන්දි අරමුදල | 6000/0000/00/0006/0061/000 | 3,752,154,695 |

| | | |
|---|---|---|
| - රේගු නිලධාරින්ගේ තැගි අරමුදල | 6000/0000/00/0006/0062/000 | 1,095,233,435 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | | |
| - පොදු තැන්පත් | 6000/0000/00/0015/0128/000 | 80,485,775 |
| - ක්ෂය සංචිත අරමුදල | 6000/0000/00/0008/0051/000 | 19,739,453 |
| - තැගි අරමුදල | 6000/0000/00/0006/0060/000 | 208,797,492 |
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0129/000 | (2,380) |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0130/000 | 2,678,235 |
| තක්සේරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0131/000 | 133,846 |
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0132/000 | 66,254,054 |
| ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0135/000 | 25 |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0151/000 | 230,131 |
| | | ----------------- |
| **එකතුව** | | **12,353,753,546** |
| | | =========== |

**2 කොටස**

------------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 102 - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 09 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි

හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

----------------------

2013 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.45,050,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 15 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,763,451,860 ක් වූ අතර ඉන් රු. 572,614,213 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.1,190,837,647 ක ඉතිරියක් අනාවරණය වූ අතර, එම ඉතිරිය වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

---------------------

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.119,475 ක් වූ අතර එම ශේෂය 2011, 2012 සහ 2013 යන වර්ෂවල ශේෂයන්ගෙන් සමන්විත වි තිබුණි.

### (ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------

විෂය අංක 10201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු අවුරුදු 5 ක් ඉක්මවූ හිඟහිටි ශේෂවල එකතුව රු.643,977 ක් වී තිබුණි.

## 1.4 අනුකූල නොවීම්

------------------

**නිති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම**
--- | ---

**1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත**

| | |
|---|---|
| (අ) 6 (1) (අ) උප වගන්තිය | පිරිවැය රු.මිලියන 5 ක් ඉක්මවන කොන්ත්‍රාත්තු පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ ලංසුකරුවන් වෙත පමණක් ප්‍රදානය කළ හැකි වුවද, එසේ ලියාපදිංචි නොවූ ලංසුකරුවෙකු වෙත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. |
| (ආ) 12 වන වගන්තිය | පනතේ 8 වන වගන්තියේ සඳහන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයාගේ ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවොත් මිස වෙනත් පුද්ගලයන් සමඟ කොන්ත්‍රාත්තුවට අදාල ප්‍රසම්පාදන කටයුතුවල නොයෙදිය යුතු වුවද, එසේ ලියාපදිංචි වූ බවට වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කර නොතිබූ ලංසුකරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුවක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන හා ඇගයීම් කටයුතු සිදු කර තිබුණි. |

## 1.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා

### ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩාගාර පරිශ්‍රයේ ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා 2010 වර්ෂයේ සිට පහත සඳහන් අයුරින් ප්‍රතිපාදන සළසා තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ නව නගර සංවර්ධන සැලැස්මට අනුව නැවත අනුමැතිය ලබා ගැනීමට සිදු වීම නිසා එම ඉදිකිරිම් කටයුතු ප්‍රමාද කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 98 ක් ඉතිරි වී තිබුණි. මෙම ඉදිකිරිම සඳහා 2010 වර්ෂයේ සිට වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයත් ඉතිරිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | සළසා තිබුණු ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2010 | 13,500,000 | 1,741,871 | 11,758,129 |
| 2011 | 500,000,000 | -- | 500,000,000 |
| 2012 | 200,000,000 | 4,202,754 | 195,797,246 |
| 2013 | 575,000,000 | 9,690,551 | 565,309,449 |

(ආ) 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් අමාත්‍යාංශයේ ශීර්ෂයෙන් මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපාතිය සඳහා විදේශ ණය මූල්‍යනය යටතේ රු.1,000,000,000 ක්ද, විදේශ මූල්‍යනය ආශ්‍රිත දේශීය පිරිවැය මූල්‍යනය යටතේ රු.100,000,000 ක් වශයෙන් එකතුව රු.1,100,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් පිළිවෙලින් රු.460,530,615 ක් හා රු.28,271,537 ක් වශයෙන් රු.488,802,152 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.539,469,385 හා රු.71,728,463 වශයෙන් එකතුව රු.611,197,848 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 54 ක් හා සියයට 72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම ඉතිරිය සම්බන්ධයෙන් විසර්ජන ගිණුමේ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියේ (අයි.ටී.එම්.අයි.එස්) කොන්ත්‍රාත්තුව පිරිනැමීම 2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී සිදු වූ බැවින් ඒ සඳහා අත්තිකාරම් පමණක් ගෙවා තිබුණු අතර එම අත්තිකාරම්වලට අදාළ බදු මුදල් සම්පූර්ණයෙන් නිදහස් කර ගැනිමට නොහැකිවිම නිසා මෙම ඉතිරිය සිදු වි තිබුණු බව සඳහන් කර තිබුණි.

## 1.6 කාර්යසාධනය

------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැසුමට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා අංශයේ, විශේෂ ශ්‍රේණියේ නිලධාරින්ගේ උසස්වීම් සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ඉලක්කගත දිනයන්වලදී සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා අංශයේ 1994 කණ්ඩායමේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම්, එම නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු සහ ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින්ගේ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම ඉලක්කගත දිනයන්වල සිදුකර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතට වැටෙන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ බඳවා ගැනීම් හා උසස් කිරිම් පරිපාටි සංශෝධනය, තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවා ව්‍යවස්ථා සැකසීම සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පිරවීම යන කාර්යයන් ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ඉටු කර නොතිබුණි.

**1.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 15 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 08 | 04 | 04 |
| (iii) | ද්විතීයික මට්ටම | 128 | 93 | 35 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 110 | 85 | 25 |
| | එකතුව | 270 | 197 | 73 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 73 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 237- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) යටතේ වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.810,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 44 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

විෂය අංක 23701 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ පහ ඉක්මවූ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.213,887 ක් විය.

**2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------- --**

**විගණන හා කළමණාකරන කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට

වරක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුවට අදාළව 2013 වර්ෂයේදී රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2011 වර්ෂය වෙනුවෙන් සිදු කර තිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 47 | 10 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 27 | 19 | 08 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 31 | 30 | 01 |
| | **එකතුව** | **117** | **97** | **20** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3. ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## 3.1 විගණන විෂය පථය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 11 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද

ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) යටතේ වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබූ එකතුව රු.68,395,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.39,884,730 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.28,510,270 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 42 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) ආදායම් ගිණුම**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් සංකේතය 20.05.01.00 - මහ බැංකු ලාභ ආදායම් ගිණුම අනුව, එකතුව රු.4,005,704,841 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම තුළ 2012 වර්ෂයට අදාල රු.1,005,704,841 ක් ඇතුළත්ව තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව ආදායම් සංකේත 10.02.10.00 සමාජ වගකීම් බද්දට අදාල පළමු අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(iii) 2011 අප්‍රේල් 01 දින සිට සමාජ වගකීම් බද්ද අහෝසි කර තිබුණු අතර 2011 හා 2012 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.85,858,156 ක් හා රු.84,485,473 ක හිඟ ආදායම් පැවතුණි.

(iv) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2014 පෙබරවාරි 26 දිනැති ලිපිය ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා අනුව, 2011 වර්ෂය අවසාන වන විට හිඟ ආදායම රු.225,478,525 ක් වුවද, ආදායම් ගිණුමේ එය රු.82,306,007 ක් වීම හේතුවෙන් එම හිඟ ආදායම රු. 143,172,518 කින් අඩුවෙන් ආදායම් ගිණුමේ දක්වා තිබුණි.

(v) 2013 දෙසැම්බර් 31 දිනට වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු.24,264,529,000 ක ශුද්ධ අලාභයක් පැවැතියද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරීගේ 2014 අප්‍රේල් 01 දිනැති අංක රහිත ලිපිය මඟින් 2013 වර්ෂයේ ලාභ වලින් රු.28,000,000,000 ක් ඒකාබද්ධ අරමුදලට මාරු කර තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2014 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට අපේක්ෂා කර තිබුණද, කාර්තුමය වශයෙන් ආදායම් ප්‍රභවයන් සමාලෝචනය කිරීම, ආදායම් පිළිබඳ දත්ත එක් රැස්කිරීම හා පිළියෙල කිරීම, ආදායම් ඇස්තමේන්තු හා මුදල් ප්‍රවාහ තත්ත්වය අධීක්ෂණය කිරීමේ රැස්වීම් 04 ක් හැරෙන්නට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අභිමුඛ කරගත් රැස්වීම් ප්‍රමාණවත් පරිදි පැවැත් වූ බවට වාර්තා වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබුණු රු.බිලියන 1,303 ක් වූ රජයේ මුළු ආදායම සංශෝධිත ඇස්තමේන්තුව මඟින් රු.බිලියන 1,212 ක් එනම් රු.බිලියන 91 කින් අඩු කර තිබුණි. 2013 වර්ෂයේ තථ්‍ය ආදායම විදේශ ප්‍රදාන සමඟ රු.බිලියන 1,082 ක් වීම හේතුවෙන් සංශෝධිත ඇස්තමේන්තුව අනුව එය රු.බිලියන 130 ක එනම් සියයට 11 ක හිඟයක් පැවැතුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 14 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතික මට්ටම | 25 | 13 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 10 | 05 |
| | **එකතුව** | **65** | **39** | **26** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට සේවක මණ්ඩලයේ පුරප්පාඩු 26 ක් පැවති අතර එම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 08 ක් ඇතුළත්ව තිබුණි.

(ආ) "රජයේ පුළුල් සංවර්ධන ක්‍රියා රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම" දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන අතර ඒ කරා යොමු වීමේදී ආදායම් හා වියදම් ඇස්තමේන්තු සමාලෝචනය කිරීම, විශ්ලේෂණය කිරීම, ඇගයීමට ලක් කිරීම හා ඊට අවශ්‍ය සංශෝධනයන් කිරීමට කටයුතු කළ යුතු වුවද, අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ, ආර්ථික විද්‍යාඥ සහ සංඛ්‍යා ලේඛනඥ තනතුරු පුරප්පාඩුව පැවැතුණි.

## 4. ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## 4.1 විගණන විෂය පථය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**4.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 4.4 හා 4.5 ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

---

වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.21,000,000 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.17,382,393 ක් වි තිබුණි. එම ඉතිරිය වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 41 සිට සියයට 90 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුවට අදාළව 2013 වර්ෂයේදී රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 41 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 3 | 2 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 64 | 44 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 27 | 2 |
| | **එකතුව** | **150** | **114** | **36** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 36 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 5. ශීර්ෂය - 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### 5.1 විගණන විෂය පථය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 09 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 5.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.30,020,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබූ එකතුව රු.1,721,856,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,218,342,266 ක් උපයෝජනය කළ පසු රු.503,513,734 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 83 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

### (ආ) අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0262/0013/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය තුළ 2008 වර්ෂයේ සිට පැවත එන රු.83,325 ක අග්‍රිම ශේෂයක් වූ අතර එම ශේෂය 2014 දෙසැම්බර් 23 දින වන විටත් පියවා නොතිබුණි.

### (ඇ) ජංගම නොවන වත්කම්

සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද වාහනවල වටිනාකම රු.7,600,000 ක් ලෙස විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ දක්වා තිබුණත් වර්ෂය තුළදී රු.1,300,000 ක පිරිවැය වූ කැබ් රථයක් පමණක් අපහරණය කර තිබුණි.

### (ඈ) ආදායම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ආදායම් ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව රු.39,082,168 ක ආදායම් හිඟහිට තිබුණි.

(ii) 2006 සැප්තැම්බර් 27 දිනැති අංක 187/2006 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාර ආදායම් රැස් කිරීමේ දෙපාර්තමේන්තු විසින් සපයනු ලබන දත්ත පදනම් කරගෙන පිළියෙල කරන මාසික ගිණුම් ප්‍රකාශන, ආදායම් ගණන්දිමේ නිලධාරීගේ දෙපාර්තමේන්තු පොත් සමඟ සසඳා ඒ බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු වුවත්,පරිගණක මුද්‍රිත සටහන් හැරෙන්නට මෙම දෙපාර්තමේන්තුව විසින් එවැනි පොත්පත් පවත්වා නොතිබුණු බැවින් අදාල සැසඳීම් සිදුකර නොතිබුණි.

(iii) හිඟ ආදායම්වල ආරම්භක සහ අවසාන ශේෂවල වෙනස්වීම්වලට හේතුව ආදායම් අය වී තිබීමද නැතහොත් වෙනත් හේතුවක්ද යන්න සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා රු.279,433,627 ක් වූ පෙර වර්ෂවලට අදාල හිඟ ආදායම් අයවීම්වල නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

(iv) ඉදිරිපත් කර තිබුණු ආදායම් ගිණුම අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව හිඟ මුදල් කිසිවක් නොමැති බව දක්වා තිබුණද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගබඩා අත්තිකාරම් ගිණුමේ හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික සහ කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ පිළිවෙලින් රු.1,051,778 ක් හා රු.38,030,390 ක් වූ ශුද්ධ ලාභ ආදායම් ගිණුමට ගෙන නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-------------------------------------------------------------------

විෂය අංක 24001 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට ස්ථාන මාරුවීම් ලබා ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය සහ තනතුරු අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.562,101 ක් වි තිබුණි.

**5.4 අනුකූල නොවීම්**

-----------------

**නිති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 103 (1) | වාහනයකට වූ හදිසි අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 104 (4) | 2013 වර්ෂයේදී අනතුරට ලක් වූ වාහන දෙකක් සම්බන්ධයෙන් අවසන් වාර්තා 2014 නොවැම්බර් 28 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. |

**5.5** **කාර්යසාධනය**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියදම් කරනු ලබන කාර්යයන්හි ඵලදායීතාවය සහතික කරනු සඳහා මුදල් වැය කරන නියෝජිත ආයතනය සමඟ සාකච්ඡා කිරිම හා මූල්‍ය මෙන්ම භෞතික ප්‍රගතිය අධීක්ෂණය සඳහා වියදම් විශ්ලේෂණය කිරිම දෙපාර්තමේන්තුවේ කාර්යයන් වුවත්, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සළසා නොමැති හෝ පවත්නා වූ ප්‍රතිපාදන අදාල කාර්ය සිදු කිරිම සඳහා ප්‍රමාණවත් නොවූ විට අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් රු.මිලියන 73,615 ක අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් එනම් රු.මිලියන 124,930 ක් වර්ෂය අවසානයේදී උපයෝජනය නොකර ඉතිරි වී තිබිම හේතුවෙන් එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

(ආ) වාර්ෂික අයවැය පිළියෙල කිරිමේ කාර්යයට අදාල උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කර ඇති බව 2012 හා 2013 වර්ෂවල කාර්යසාධන වාර්තාවල සඳහන්ව තිබුණත් එම මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරිම කෙරෙහි 2014 ජුලි මාසය වන විටත් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. විගණනය විසින් මේ පිළිබඳව විමසීමෙන් අනතුරුව 2015 අයවැය සැකසීමට අදාලව 2014 අගෝස්තු 18 දින අංක 03/2014 දරන අයවැය ඇස්තමේන්තු සකස් කිරිමේ මාගෝපදේශය නිකුත් කර තිබුණද ඒ වන විටත් එක් එක් ආයතන විසින් 2015 වර්ෂයට අදාල අයවැය ඇස්තමේන්තු සකස් කර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු බැවින් මෙම පොදු මාර්ගෝපදේශය හඳුන්වාදීමේ අපේක්ෂිත ප්‍රතිඵලද ලබා කර ගෙන නොතිබුණි.

**5.6** **මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 36 | 22 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 75 | 63 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 38 | 32 | 06 |
| | **එකතුව** | **151** | **117** | **34** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 34 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර එය අනුමත සංඛ්‍යා වෙන් සියයට 23 ක් වී තිබුණි.

## 6. ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

### 6.1 විගණන විෂය පථය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 6.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 6.4 සිට 6.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබූ රු.4,282,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කිරීමෙන් පසු රු. 1,122,839 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

---------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 128(2) හා 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව ආදායම් සංකේත 3 කට අදාල හිඟ ආදායම් පිළිබඳ වාර්තා හා හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව රජයට ලැබෙන ආදායම පහත වැටීම, වහාම හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරිම, ඒ පිළිබඳ වහාම පිළියම් යෙදීම කළ යුතු අතර ඒ පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග තම පාලනයන් බැහැර වන විට එම තත්ත්වය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඒ පිළිබඳ උපදෙස් ලබා ගත යුතු වුවද, පෙර වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.11,813,858,456 කින් අඩු වී තිබුණත් ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) පෞද්ගලික රාජ්‍ය සමාගම් තුනකට අදාලව 2011 සහ 2012 වර්ෂවලදී හිඟ හිටි රු.49,117,609 ක ආදායම්, සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. එම ලැබිම් ආදායම් ගිණුමේ ඉකුත් වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේදී රැස්කළ ආදායම් ලෙස ගිණුමේ සඳහන් නොකර සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ලෙස ගිණුමේ දක්වා තිබුණි.

(iv) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් හඳුනා ගැනීමෙන් පසු රු.1,000,000 ක් පෙර වර්ෂය සඳහා ලාභ ලෙස අයකරගෙන තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. ලාභ උපයන ආයතනද ඇස්තමේන්තු සැකසිමේදි අදාල කරගෙන නොතිබුණි.

(v) විගණනයට ඉදිරිපත් කරන ලද රජයේ ප්‍රාග්ධනයට දායක වූ ව්‍යාපාර ලැයිස්තුවේ ලාභාංශ ලැබීමට නියමිත ආයතන සංඛ්‍යාව 86 ක් ලෙස දක්වා තිබුණද, ආදායම් ඇස්තමේන්තු සැකසීමේදී ආයතන 45 ක් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.408,304 ක් විය.

**6.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුවට අදාළව 2013 වර්ෂයේ එක් වරක් පමණක් රැස්වී තිබුණි.

**6.5 කාර්යසාධනය**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකරන ලද කාර්ය පිළිබඳ විස්තර ඉල්ලා තිබුණද, එම තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරිමට නොහැකි විය.

**6.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 25 | 04 |
| (ආ) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 38 | 24 | 14 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 14 | 14 | - |
| | එකතුව | 82 | 64 | 18 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 18 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 7. ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 7.1 විගණන විෂය පථය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 7.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 7.4 සිට 7.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.10,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබූ එකතුව රු.900,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.630,671 ක් වූ එනම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් හා සියයට 95 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

**7.4 වත්කම් කළමනාකරණය**

---------------------------

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01/ දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එම වාර්තා 2014 ජුනි 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**7.5 කාර්යසාධනය**

-------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේ තෝරා ගත් ප්‍රදේශ 02 ක කාර්ය මණ්ඩලය සමාලෝචනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සාකච්ඡා පවත්වා කාර්ය මණ්ඩලය සමාලෝචනය කිරීම ඉලක්කගත කර තිබුණද, 2014 නොවැම්බර් 26 දින වන විටත් දිස්ත්‍රික්ක 14 ක වාර්තා කෙටුම්පත් කර තිබුණු අතර අනෙකුත් දිස්ත්‍රික්ක 11 හි තොරතුරු කැඳවමින් පැවතුණි.

(ii) වර්ෂය තුළ, පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමාලෝචනය කර අවසන් කිරීමට ඉලක්කගත කර තිබුණද, 2014 නොවැම්බර් 26 දින වන විටත් අනුමත කළයුතු නව තනතුරු පිළිබඳ අධ්‍යයනය කරමින් පැවැතුණි.

(ආ) තෝරා ගත් දෙපාර්තමේන්තු 5 ක ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් එම දෙපාර්තමේන්තුවල නව තනතුරු ඇති කිරීමට අදාල නිර්ණායක සහ ප්‍රමිතීන් සකස් කිරීම ඉලක්කගත කර තිබුණද, අදාල තොරතුරු 2014 නොවැම්බර් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 2013 වර්ෂයේ සංශෝධනය කිරීමට සැලැසුම් කර තිබුණත්, එය 2014 නොවැම්බර් 26 දින වන විටත් සංශෝධනය කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීමට 2013 වර්ෂයේදී ඉලක්කගත කර තිබුණත්, භාණ්ඩාගාර පරිගණක ජාලයෙහි වූ දුර්වලතාවයක් හේතුවෙන් එය භාවිතා කරන්නන් පුහුණු කිරීම අවසන් කිරීම 2014 නොවැම්බර් 26 දින වන විටත් නොහැකි වී තිබුණි.

**7.6 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 11 | 11 | - |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (ඇ) | ද්විතික මට්ටම | 42 | 34 | 09 | 01 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 | - |
| | **එකතුව** | **79** | **59** | **21** | **01** |

2013 දෙසැම්බර් 31 දින වන විට සේවක මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 11 ක පුරප්පාඩු පැවතුණි.

## 8. ශීර්ෂය 243 - සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුව

### 8.1 විගණන විෂය පථය

සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**8.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 8.4 සිට 8.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.21,700,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 99 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**8.4 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 1645 (අ) | වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ පවතින වාහනවල ලොග් පොත් විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරින් විසින් තමා භාරයේ පවතින වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉකුත් මාසයේ වාර්තා ඊ ළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර 10 දිනැති අංක | දෙපාර්තමේන්තුව සතු වාහන 06 ක මාස 06 |

41/90 දරන චක්‍රලේඛය කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි.

## 8.5 කාර්යසාධනය

----------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ හා ක්‍රියාකාරී සැලැසුම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ත්‍රස්තවාදී කණ්ඩායමක් යටතේ සිට හමුදාවන්ට යටත් වූ සාමාජිකයින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් පුනරුත්ථාපනය කර සමාජ ගත කොට තිබූ අතර මෙම සාමාජිකයෙකුට රු.250,000 ක උපරිමයකට යටත්ව දෙනු ලබන ණය මුදල සඳහා රජය මඟින් සියයට 8 ක සහනාධාර පොලියක් ගෙවනු ලබයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 මාර්තු 15 දිනැති අංක අමප/12/0237/541/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2012 පෙබරවාරි 29 දින ඉහත සඳහන් වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම තීරණය පරිදි වැඩසටහනට අදාලව ගිවිසුමකට එළඹීම දෙපාර්තමේන්තුවට පැවැරී තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා මාස 05 කාලයක් පමා කර 2012 ජුලි 24 දින ගිවිසුම පිළියෙල කර අත්සන් කර තිබුණි.

(ii) මෙම වැඩසටහන මඟින් පුනරුත්ථාපනය කර අවසන් සාමාජිකයන් 10,375 කට ණය ලබා දිමට සැලැසුම් කර තිබුණි. නමුත් ආරම්භක පියවරක් වශයෙන් සාමාජිකයන් 2011 දෙනෙකුට ණය ලබා දීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ණය අයදුම්පත් ලබා ගෙන තිබුණි. නමුත් 2013 වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වන විට ඉන් 1,560 දෙනෙකුට පමණක් ණය ලබා දී තිබුණි. මෙම ප්‍රමාණය අපේක්ෂිත මුළු සංඛ්‍යාවෙන් සියයට 14 ක් හා අයදුම්පත් ලබා දුන් සංඛ්‍යාවෙන් සියයට 75 ක් වී තිබුණි.

(iii) අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ණය ලබා දීමෙන් පසු, පසු විපරම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු විය. ඒ අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර තිබේද යන්න පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පසුවිපරම් කිරීමක් කර නොතිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නඟාසිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන නියෝජිතායතනය ලෙස ක්‍රියා කර තිබුණි. නමුත් එම ව්‍යාපෘතියේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව සිදු කර නොමැති බව පහත සඳහන් අඩුපාඩුවලින් නිරීක්ෂණය විය.

(i) ආසියානු සංවර්ධන බැංකුව මඟින් නිදහස් කර තිබූ රු. මිලියන 1,462 ක් වූ ණයවලට අදාලව ණය ගිවිසුමේ " ඉ " වගන්තිය අනුව ණය හා පොළී ආපසු අයවීමේ අවදානම සමනය කිරිම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ අවදානම බෙදා හැරීමේ කටයුතු සිදු කළ යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම අවදානම අවම කර ගැනිමට කිසිදු කටයුත්තක් කර නොතිබුණි.

(ii) 2013 නොවැම්බර් 06 දින ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ නියෝජිතයන් පිරිසක් විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයකට අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට තම ව්‍යාපාරවල සාමාන්‍ය පරිපාලනය හා තාක්ෂණික දැනුම පිළිබඳ වැඩිදුර පුහුණුව අවශ්‍ය වී තිබූ බව අනාවරණය වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය මඟින් ධාරිතා වර්ධනය සඳහා රු.මිලියන 427 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 33 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ධ වාර්ෂික සාමාන්‍ය ස්ථාවර තැන්පතු පොළී අනුපාතය යොදා ගැනීම වෙනුවට සහභාගීත්ව මූල්‍ය සඳහා ආයතන මඟින් සියයට 8.69 සිට සියයට 15.93 ක් වූ විවිධ පොළී අනුපාත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ණය ශේෂ මත අය කර ගෙන තිබුණි. ව්‍යාපෘතිය මඟින් සියළුම සහභාගීත්ව මූල්‍යායතන මඟින් අය කළ යුතු පොළී අනුපාතය නියම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ගිවිසුමේ උපලේඛනයෙහි (බී) 5.25 අනුව ව්‍යාපෘතිය අවසන් වී මාස 03 ක් ඇතුළත අවසාන වාර්තාව පිළියෙල කළ යුතු වුවත්, 2012 ජූනි 30 දින ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් වී තිබුණද 2013 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති අවසන් වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ, මැණික් හා ස්වර්ණාභරණ අංශයේ වෙනස්වෙමින් පවතින රෙගුලාසි පිළිබඳ ඇගයීම, පුද්ගල ඉඩම් හා කර්මාන්ත අධිකාරිය මඟින් ඉල්ලුම් කරනු ලබන පොළී සහනාධාර ගෙවීම් හා ඇගයීම සම්බන්ධ දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධනය ඇතුළත් කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේ අයවැය යෝජනාවක් මත සංස්ථාපනය කරන ලද වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ චක්‍රීය අරමුදලේ ප්‍රගතිය පිළිබඳ ඇගයීම සහ වියදම්වලට අදාල කාර්යයන් 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද එම කාර්යයන් සිදුකර නොතිබුණි.

## 8.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (ඇ) | ද්විතීක මට්ටම | 04 | 04 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 10 | 10 | - |
| | **එකතුව** | **28** | **25** | **03** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 03 ක් පිරවීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## 9. ශීර්ෂය - 244 - වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### 9.1 විගණන විෂය පථය

වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 19 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 9.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.65,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු.7,400,000 ක අධි ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.3,955,110 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.3,444,890 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ට අදාලව සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 36 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

(iii) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව එකතුව රු. 1,740,000 ක් වූ ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණ ද , එම ප්‍රතිපාදනවලින් එකතුව රු.1,023,096 ක් හෙවත් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් වර්ෂය අවසන් වන විටත් උපයෝජනය කර නොතිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව නිලධාරීන් දෙදෙනෙකුගේ එදිනට පැවැති ණය ශේෂය හා 2013 ජනවාරි 01 දිනට වූ සාමාජික ණය ලේඛනයේ සඳහන් ණය ශේෂය අතර රු.53,773 ක වෙනසක් පැවතුනි.

## 9.4 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 9.4.1 වත්කම් කළමනාකරණය

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එම වාර්තා විගණනය වෙත 2014 සැප්තැම්බර් 09 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව දෙපාර්තමේන්තුව සතු වත්කම්වල ඌනතා, අතිරික්තතා හා සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 03 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 9.5 අනුකූල නොවීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලිනව පවත්වා නොතිබීම නිසා පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව සතුව පවතින ජීප් රථයේ සහ වෑන් රථයේ පිරිවැය ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා නොතිබුණි.

(ආ) වෙනත් ආයතන වෙත පවරා දී තිබූ එකතුව රු.6,190,000 ක් වූ මෝටර් රථ දෙකක සහ රු.3,700,000 ක් වූ ජීප් රථයක පිරිවැය පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි.

## 9.6 කාර්යසාධනය

---------------

දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) ඉන්දු - ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වසර පුරාම ප්‍රගති සමාලෝචනය කළ යුතු බව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබුණද, ඉදිරිපත් කරන ලද ලිපිගොනුව අනුව සමාලෝචිත වර්ෂයට අදාළව කිසිදු කාර්යයක් කර තිබුණු බවට තහවුරු කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉන්දියාව සඳහා තවදුරටත් වෙළඳපොළ විවෘත කිරීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකාව සිය නිශේධන ලැයිස්තුවෙන් අයිතම 10 ක් ඉවත් කිරීමට තීරණය කළ බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි.

(ආ) ඉන්දියා ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුම (CEPA) ක්‍රියාත්මක කිරීමට අදාළව වර්ෂය මුළුල්ලේම සාකච්ඡා සඳහා සහභාගි වන බව සැලැස්මෙහි සඳහන් කර තිබුණත්, 2011 වර්ෂයේ සිට එම ගිවිසුමෙහි කාර්යයන් අවසන් කර තිබුණි.

(ඇ) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ (BIMSTEC) ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාල සාකච්ඡා සඳහා වර්ෂය මුළුල්ලේ සහභාගි වන බව සඳහන් කර තිබුණත්, ඊට අදාළ ලිපිගොනු පරීක්ෂා කිරීමේදී, සමාලෝචිත වර්ෂයේදී එම ගිවිසුමට අදාළව කිසිදු සාකච්ඡාවක් සිදු කළ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති අංශය යටතේ පහත සඳහන් කාර්යයන්වලට අදාල කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණි. එම කාර්යයන්ට අදාල අභියාචනා හෝ ඉල්ලීම් ලැබී නොමැති බවත්, යම් අමාත්‍යාංශයක් හෝ ආයතනයක් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සඳහා පමණක් ලිපිගොනුව මගින් පිළිතුරු ලබා දෙන බවත්, දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි. ඒ අනුව එම කාර්යයන්හි ප්‍රගතියක් නිරීක්ෂණය වී නොතිබුණි.

(i) තීරු බදු ප්‍රතිදාන ගෙවීම සම්බන්ධව අපනයනකරුවන් මුහුණපාන විවිධ ගැටළු නිරාකරණය කිරීම

(ii) 2010 දෙසැම්බර් 16 දිනැති අංක 01/2010 දරන වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ ය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සහ අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම.

(iii) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2000 අප්‍රේල් 07 දිනැති අංක 165 දරන විදේශ කටයුතු අමාත්‍යශයේ චක්‍රලේඛ ය හා ඊට අදාළ සංශෝධන ප්‍රකාරව අදාල කටයුතු කිරීම.

(iv) රේගු ආඥා පනතේ 164 හා 165 වගන්ති ප්‍රකාරව මුදල් විෂයභාර ඇමතිවරයා වෙත ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම.

(ඉ) දෙපාර්තමේන්තුවට අදාල නඩු සම්බන්ධ කටයුතු සිදු කරන බව සැලැස්මෙහි දක්වා තිබුණද, ඊට අදාළ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**9.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 09 | 05 |
| (ආ) | තෘතියික මට්ටම | - | - | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 25 | 22 | 03 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 13 | 10 | 03 |
| | **එකතුව** | **52** | **41** | **11** |

2013 දෙසැම්බර් 31 දින වන විට අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 11 ක් පැවති අතර මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 05 ක් ඇතුළත්ව තිබුණි.

## 10. ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

### 10.1 විගණන විෂය පථය

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ

වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**10.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම**

**---------------------------------------**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**-------------------**

වැය විෂයයන් දෙකක් සඳහා සළසා තිබුණු එකතුව රු.2,450,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කළ පසු ඉතිරියේ එකතුව රු.911,148 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් හා සියයට 65 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ගණන් බේරා වසා දැමීමේ අත්තිකාරම් ගිණුම්**

**----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව යටතේ ඇති අත්තිකාරම් ගිණුම් 04 ක කටයුතු ගණන් බේරා වසා දැමීමට යටත්ව වසර 15 සිට 20 ක පමණ කාලයක් ගතව තිබියදීත් ගණන් බේරා වසා දැමීම නිම කර නොතිබුණි.

(ii) අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන මුළුව සඳහා වූ විෂය අංක 999/408 දරන අත්තිකාරම් ගිණුමේ 1972 වර්ෂයේ සිට 1989 වර්ෂය දක්වා වූ රු.4,204,236 ක සමුච්චිත කාරක පාඩුවක් ගිණුමේ දක්වා තිබුණු අතර එය ඇති වීමට හේතු ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FS/Assets/ඇවාගි/2012 හා 2012 අප්‍රේල් 30 දිනැති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ඇමතූ ලිපිය මඟින් මෙම අත්තිකාරම් ගිණුමේ අනුමැතිය නොලත් කාරක පාඩුව කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි. එසේම රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FS/Assets/ඇවරගිණුම/2008 හා 2014 පෙබරවාරි 13 දිනැති ලිපිය මඟින් මෙම කාරක පාඩුවද ඇතුළුව අත්තිකාරම් ගිණුම් 5 ක

කාරක අලාභ කපා හැරීම සඳහා ප්‍රතිපාදනද ඉල්ලා තිබුණි. කෙසේ වුවද, භාණ්ඩාගාර පොත්වල මෙවැනි කාරක අලාභයක් පෙන්නුම් නොකරන බැවින් සමාලෝචිත වර්ෂයේදී වැරදි නිවැරදි කිරීමක් ලෙස එම කාරක අලාභය පොත්වලින් ඉවත් කර තිබුණි.

**10.4 වත්කම් කළමනාකරණය**

---------------------------

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 හා 2010 දෙසැම්බර් 17 දිනැති ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2014 මැයි 16 දින එම වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, රජයේ වත්කම් කළමනාකරණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස ඉහත සඳහන් චක්‍රලේඛය නිකුත් කර තිබුණේද මෙම දෙපාර්තමේන්තුව විසින් වන අතර ඊට අනුකූලවීමක් දෙපාර්තමේන්තුව විසින්ම සිදු කර නොමැති බවත් , 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වා දී තිබූ අතිරික්ත භාණ්ඩ සම්බන්ධයෙන් 2014 මැයි10 දින වන විටත් හා 2013 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සම්බන්ධයෙන් 2014 අගෝස්තු 06 දින වන විටත් ක්‍රියා කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**10.5 කාර්යසාධනය**

--------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත ප්‍රධාන කාර්යයක් වන "මුදල් රෙගුලාසි සංග්‍රහය සංශෝධනය කිරීම " 2014 අගෝස්තු 15 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට සැලැසුම් කර තිබූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සංශෝධනය කිරීම විගණිත දිනය වූ 2014 නොවැම්බර් 14 දින වන විටත් අවසන් වී නොමැති බවත් මේ සඳහා පත් කළ කමිටුව තවදුරටත් රැස්වෙමින් සාකච්ඡා පවත්වමින් සිටින බවත් නිරීක්ෂණය විය.

(ඇ) "විසර්ජන පනතින් ප්‍රතිපාදන ලබා නොගෙන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ පවත්වා ගෙන යනු ලබන අරමුදල් විධිමත් කිරීම, සමාලෝචනය හා පසු විපරම් කටයුතු කිරීම " දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන අතර ඒ සඳහා අනුගමනය කළ යුතු උපදෙස් දක්වමින් 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කර තිබුණි. එම චක්‍රලේඛය අනුව, මුදල් වර්ෂය අවසාන වී මාස දෙකක් ඇතුළත අරමුදල්වල අවසන් ගිණුම් විගණකාධිපති වෙත හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 නොවැම්බර් 13 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කෙරෙන අරමුදල් 60 කින් 2013 වර්ෂයට අදාල අරමුදල් 16 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් වී නොතිබුණු, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය මුදල්

චක්‍රලේඛය ප්‍රකාරව "රාජ්‍ය ආයතනවල ගෙවීම් සඳහා බැංකු පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදීම" සිදු කර තිබුණි. මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට රු.100,000 දක්වා සුළු මුදල් ගනුදෙනු ඉලෙක්ට්‍රොනික ගෙවීම් මාධ්‍යය හරහා සිදු කළ හැකි පරිදි වියදම් නියෝජිතායතනවල නිල බැංකු ගිණුම් හා සම්බන්ධ කර බැංකු හරපත් ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. ලංකා බැංකුවේ සහකාර මහා කළමනාකරුගේ අංක රහිත හා 2013 දෙසැම්බර් 03 දිනැති ලිපිය මගින් බැංකුව විසින් රු. 314,160 ක් වැයකර පෙර ගෙවුම් කාඩ්පත් 5000 ක් මුද්‍රණය කර තිබුණ ද, 2014 අගෝස්තු මාසය අවසානය වන විටත් ආයතන 11 ක් පමණක් කාඩ්පත් ලබා ගෙන තිබුණු අතර ඉන් සක්‍රීය තත්ත්වයේ කාඩ්පත් 02ක් පමණක් පැවැතුණි. කාඩ්පත් ලබාගත් ආයතන විසින් පෙන්වා දි ඇති පරිදි, එය භාවිතා කිරීමේදි ද ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී තිබුණු බව වාර්තා කර තිබුණි.

**10.6 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 14 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 34 | 30 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 13 | 04 |
| | **එකතුව** | **82** | **59** | **23** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දින වන විට සේවක මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් පැවති අතර මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 13 ක් ඇතුළත්ව තිබුණි.

(ii) ප්‍රසම්පාදන කළමනාකරණ විෂයෙහිලා ප්‍රතිපත්තීන්, ක්‍රියා පිළිවෙත් හා ව්‍යවහාරයන් සම්පාදනය, සමාලෝචනය, වැඩිදියුණු කිරීම, ප්‍රචලිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයෙහි ප්‍රධාන කාර්යයන් වුවද දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රසම්පාදන විශේෂඥ තනතුර හා ප්‍රසම්පාදන විධායක තනතුරු 4 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 11. ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 11.1 විගණන විෂය පථය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 මාර්තු 16 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 11.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 11.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 11.4 සිට 11.10 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සමහර විසර්ජන (වැය) ලෙජර විධිමත් ලෙස යාවත්කාලීන කර නොතිබුණි.

(ii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සියළු වත්කම් ඇතුළත් කර විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**-----------------**

වැය විෂයන් 03 කට එකතුව රු.201,000,000 ක අධිප්‍රතිපාදන සළසා තිබුණු අතර, එයින් එකතුව රු.150,411,710 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.50,588,290 ක ඉතිරියක් විය. එම ඉතිරිවීම් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 67 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

**------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 අප්‍රේල් 30 දින වන විට දෙපාර්තමේන්තුව විසින් පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු.3,467,059 ක් වි තිබුණි.

(ii) 2013 වර්ෂයේ විශ්ව විද්‍යාලයකින් පරිගණක දත්ත පරීක්ෂා කිරීම සඳහා සේවා ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු.1,400,000 ක් ගෙවා තිබුණි. අදාළ ගිවිසුම්ගත දිනට එම කටයුතු නිමකර නොතිබීම නිසා අදාල අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ රැස්කර තිබුණු මුද්දර ආදායම්වලින් රු.1,047,477,214 ක ආදායම් පළාත් සභාවලට ලබා දිය යුතු වුවත්, එම ආදායම් පළාත් සභාවලට ලබා නොදී 2014 දෙසැම්බර් 31 දින වන විටත් අංක 6000-0000-00-0014-0003-000 දරන තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ii) 6000-0000-00-0015-0126-000 දරන පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දින වන විට ශේෂය රු.42,602,599 ක් වී තිබුණි. එම ශේෂයෙන් වර්ෂ 2කට අධික කල් ඉකුත් වූ එකතුව රු.9,173,439 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි. එසේම 2012 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් ගෙවීම්වලින් අඩුකර පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු කොන්ත්‍රාත් කාර්ය අවසන් කර හා රඳවා තබා ගැනීමේ කාලයද ඉක්මවූ රු.85,665 ක තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට හෝ අදාළ පාර්ශවයන්ට ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ඉ) ආදායම් ගිණුම්**

---------------

දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු ආදායම් ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **ආදායම් ඇස්තමේන්තු කිරීම**

-------------------------------

දෙපාර්තමේන්තුව යටතේ වන ආදායම් සංකේතවලට අදාල ආදායම් ඇස්තමේන්තු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2013 වර්ෂය සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 547,864 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එයින් රු.මිලියන 467,162 ක් රැස්කර තිබුණි. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් රු.මිලියන 80,702 ක ආදායම් රැස්කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. රැස්කර තිබුණු ශුද්ධ බදු ආදායම වූ රු. මිලියන 467,162 න් රු.මිලියන 116,783 ක් එනම් සියයට 25 ක් විවිධ දෙපාර්තමේන්තු විසින් සෘජුවම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ආදායම් සංකේතයන්ට බැර කරන ලද ආදායම් වී තිබුණි.

- දළ බදු ආදායම වූ රු. මිලියන 478,881 න් රු. මිලියන 11,719 ක් හෙවත් දළ බදු ආදායමෙන් සියයට 2.44 ආපසු ගෙවා තිබුණි.

**(ii) හිඟ බදු ආදායම්**

------------------

විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2013 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ආදායම් වාර්තාව අනුව හිඟ බදු ආදායම රු.මිලියන 172,179 ක් වූ අතර එම හිඟ බදු ආදායම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව ප්‍රථම අර්ධ වර්ෂය සඳහා හිඟ ආදායම් වාර්තාව දින 67 කින් හා දෙවන අර්ධ වර්ෂය වෙනුවෙන් වූ හිඟ ආදායම් වාර්තාව දින 135 ක ප්‍රමාදයකින් පසුව රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.

- එම හිඟ බදු ආදායම්වලින් රු.මිලියන 2,725 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

- හිඟ බදු ආදායම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 10 ක් දක්වා හිඟ බදු ආදායම් රු.මිලියන 137,769 ක්ද, වර්ෂ10 සිට වර්ෂ 20 දක්වා කාල පරාසයට අයත් හිඟ බදු ආදායම රු.මිලියන 12,225 ක්ද, වර්ෂ 20 සිට වර්ෂ 40 දක්වා කාල පරාසයට අදාළ වූ හිඟ බදු ආදායම රු.මිලියන 135 ක්ද හා වර්ෂ 40 සිට වර්ෂ 50 දක්වා වූ කාල පරාසයට අදාල හිඟ බදු ආදායම රු.මිලියන 1 ක් වී තිබුණි.

- 2013 දෙසැම්බර් 31 දිනට වූ හිඟ බදුවලින් රු.මිලියන 11,699 ක් අවලංගු කරන ලද බදු පනත් 06 කට අදාලව පැවති හිඟබදු විය. එම බදු පනත් අවලංගු කර වර්ෂ 10 කට වැඩි කාල පරිච්ඡේදයක් ගතවී තිබුණත් එම හිඟබදු අයකර ගැනීමට විධිමත් හා කාලීන වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

- එකතු කළ අගය මත හිඟබදු පිළිබඳ කාල විශ්ලේෂණය අනුව 1995 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල හිඟ බදු ලෙස එකතුව රු.මිලියන 47 ක් දක්වා තිබුණත්, එම හිඟ බදු 2007, 2009 හා 2010 වර්ෂවලට අදාල හිඟ බදු වි තිබුණි.

**(iii) පැහැර හැර තිබුණු බදු, අයකර ගැනීමේ ඒකකයට මාරු කිරීම**

-----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනත අනුව 2009 දෙසැම්බර් 31 දින වන විට හිඟහිටි රු.මිලියන 91,154 ක ආදායම් 2011 වර්ෂයේදී "පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකයට" මාරු කර තිබුණි. හිඟ බදු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසන් විට එයින් තවදුරටත් රු.මිලියන 50,100 ක්වූ බදු හිඟ හිටව පැවතුණි. 2009 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂයට අයත් 2012 සහ 2013 වර්ෂවලදී පැහැර හරිනු ලැබූ බදු එකතු කිරීමේ ඒකකයට මාරු කර තිබුණු හිඟහිටි බදුවලින් 2013 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.මිලියන 495 ක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- "පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකය" විසින් සමාලෝචිත වර්ෂයේදී අයවීම්, කපා හැරීම් හා මාරුකිරීම් වශයෙන් එකතුව රු.මිලියන 20,977 ක්වූ බදු නිරවුල් කර තිබුණු අතර, එයින් රු.මිලියන 164 ක් එනම් සියයට 0.78 ක් පමණක් අයකර තිබුණි. එම අයකළ බදුවලින් සියයට 46.25 ක් නැවත දෙපාර්තමේන්තුවේ බදුවලට අයත් අංශවලට මාරු කර තිබුණි. මේ අනුව, හිඟ බදු මුදලින් අයවීම ඉතාමත් අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

- 2012 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ බදුවලින් සමාලෝචිත වර්ෂයේදී අයවීම් පිළිබඳ විස්තර ආදායම් ගිණුම්වල දක්වා නොතිබුණු අතර, රැස්කරන ලද රු.මිලියන 467,162 ක් වූ බදු ආදායමෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රැස්කරන ලද බදු ආදායමද සඳහන් කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුවේ පරිගණකගත කරන ලද හිඟ බදුවලට අදාලව දෙපාර්තමේන්තුවේ පරිගණක ජාල පහසුකම් (intranet) වාර්තාව අනුව 2013 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ප්‍රමාණයේ එකතුව රු.මිලියන 188,664 ක් ද හිඟබදු වාර්තාව අනුව හිඟබදු ප්‍රමාණයේ එකතුව

රු.මිලියන 81,023ක් ද සහ C - 49 වාර්තාව අනුව හිඟබදු ප්‍රමාණයේ එකතුව රු.මිලියන 95,743 ක් ද විය. මේ නිසා ඉහත සඳහන් එක් එක් වාර්තාවල දැක්වෙන හිඟ බදු ප්‍රමාණයේ පරස්පරතාවයන් පැවැතීම හේතු කොටගෙන තථ්‍ය හිඟ බදු ප්‍රමාණය කොපමණද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(iv) අංශ අනුව වර්ගීකරණය කරන ලද අවසන් මාසික ආදායම් වාර්තා**

---

දෙපාර්තමේන්තුවේ අංශ අනුව වර්ගීකරණය කරන ලද අවසන් මාසික ආදායම් වාර්තා පිළිබඳ කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- අදාල ආදායම් අංශ විසින් හඳුනා නොගත් (Unit Not Assign) බදු වර්ග 04 කට අයත් රු.මිලියන 837 ක බදු ආදායම්ද, බදු වර්ග 03 කට අයත් වැරදි ආදායම් සංකේත (Error Code) යටතේ ගිණුම්ගත කරන ලද රු.මිලියන 16 ක්වූ බදු ලැබීම්ද, බදු වර්ග 03 ක් සඳහා ලියාපදිංචි නොවූ බදුකරුවන්ගෙන් ලැබී තිබුණු රු.මිලියන 123 ක බදු ආදායම්ද, සමාලෝචිත වර්ෂයේ මාසික ආදායම් ලෙස දක්වා තිබුණි.

- ඉහත සඳහන් බදු ලැබීම්වලින් 2014 ජුනි 23 දින වන විට ආදායම් අංශ හඳුනා නොගත් බදු මුදල්වල එකතුව රු.මිලියන 146 ක්ද, වැරදි ආදායම් සංකේත යටතේ ගිණුම්ගත කළ බදු ලැබීම් එකතුව රු.මිලයන 4 ක්ද පවතින බව 2014 ජූලි 01 දිනැති පිළිතුරු ලිපිය මගින් විගණනයට දන්වා තිබුණි. එහෙත් එම බදුවලට අදාළ මූලාශ්‍ර ලිපිලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(v) භාණ්ඩාගාරයේ හා දෙපාර්තමේන්තුවේ පොත්වල සඳහන් ශේෂ වෙනස්වීම**

---

පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

- සෑම ගිණුම් වර්ෂයකම භාණ්ඩාගාරයේ ආදායම් වාර්තා සහ දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අතර පවතින වෙනස්කම්/ නොගැලපීම්/ විෂමතාවයන් ආදියට හේතු සොයා බලා වැරදි නිවැරදි කිරීමට (ගිණුම් අතර සැසඳීම් කිරීමට) කටයුතු කර නොතිබුණි.

- දෙපාර්තමේන්තු හා භාණ්ඩාගාර පොත් අනුව පැවති වෙනස්කම්වලට හේතු සොයා ගලපා නොතිබුණි. 10.02.01.00 දරන ආදායම් සංකේතයට අදාල පාලන ගිණුමේ පැවති රු.මිලියන 20 ක් වූ වෙනස ආපසු ගෙවීම් ලෙස (Refund) 10.02.01.02 දරන ආදායම් සංකේතයෙන් අඩුකර දක්වා තිබුණි. එමෙන්ම 10.02.02.00 දරන ආදායම් සංකේතයේ පාලන ගිණුම අනුව රු.10,933 ක් වූ වෙනස 10.02.02.01 දරන ආදායම් සංකේතයට එකතු කර තිබුණි. එසේම 10.04.02.99 දරන ආදායම් සංකේතයට අදාල පාලන ගිණුමේ වූ

රු.මිලියන 23 ක වෙනස එම ආදායම් සංකේතයටම නැවත එකතු කර තිබුණි.

**(vi) ආදායම් ආපසු ගෙවීම**

--------------------------

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් ආදායම් සංකේත 06 කට අදාළ භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව එකතුව රු.මිලියන 10,659 ක් ආදායම් ආපසු ගෙවා තිබුණි.

| බදු වර්ගය | ආදායම් සංකේතය | භාණ්ඩාගාරය විසින් ආපසු ගෙවා තිබුණු මුදල |
|---|---|---|
| | | රු. |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය) | 10.02.01.01 | 771,519,182 |
| එකතු කළ අගය මත බදු (අනෙකුත් සේවා) | 10.02.01.02 | 221,788 |
| එකතු කළ අගය මත බදු (ආනයන) | 10.02.01.04 | 805,215 |
| මුද්දර බද්ද | 10.02.07.00 | 3,132,932,099 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද (ආනයන) | 10.02.12.03 | 6,749,493,111 |
| ආදායම් බදු (අනෙකුත්) | 10.04.02.99 | 3,669,808 |
| එකතුව | | **10,658,641,203** |

මේ
ස
ම්
බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පහත සඳහන් ආදායම් සංකේතයන්ට අදාළව රු.මිලියන 775 ක වැරදි බැර කිරීම් සිදු කර තිබුණු අතර එම වැරදි නිවැරදි කිරීම පිණිස කර තිබුණු හර කිරීම් ආදායම් ආපසු ගෙවීම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

| ආදායම් සංකේත | බදු වර්ගය | භාණ්ඩාගාරය විසින් වැරදි බැර කිරීම් ලෙස දක්වා ඇති මුදල |
|---|---|---|
| | | රු. |
| 10.02.01.01 | එකතු කළ අගය මත බදු (මූල්‍ය) | 771,519,182 |
| 10.02.07.00 | මුද්දර බද්ද | 75,075 |
| 10.04.02.99 | ආදායම් බදු (අනෙකුත්) | 3,669,808 |
| | | **775,264,065** |

- ඉඑකතුව
පා

ර්තමේන්තුවේ ආදායම් වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආදායම් සංකේත 10.02.00.00 දරන එකතු කළ අගය මත බදු පාලන ගිණුම හා භාණ්ඩාගාර ආදායම් වාර්තා අතර රු.221,788 ක වෙනසක් පැවැතුණි. එම වෙනස නිවැරදි කිරීම සඳහා සිදු කර තිබුණු හර සටහන බදු ආපසු ගෙවීම් ලෙස 10.02.01.02 දරන ආදායම් සංකේතය යටතේ සිදු කර තිබුණි.

- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ලිපියකට අනුව භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් ආදායම් සංකේතවලට එකතුව රු.මිලියන 6,750 ක් බදු ආපසු ගෙවීම් ලෙස සටහන් කර තිබුණි.

| ආදායම් සංකේතය | බදු වර්ගය | බදු ආපසු ගෙවීම් |
|---|---|---|
| | | රු. |
| 10.02.01.04 | එකතු කළ අගය මත බදු (ආනයන) | 805,215 |
| 10.02.12.03 | ජාතිය ගොඩ නැගීමේ බද්ද (ආනයන) | 6,749,493,111 |
| | **එකතුව** | **6,750,298,326** |

මෙම ආදායම් සංකේතවලට බැරකර තිබුණු, එකතු කළ අගය මත බදු (ආනයන) සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන) සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරියා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වුවද, එම ආදායම් සංකේතවලින් බදු ආපසු ගෙවීම් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කර තිබුණි. නමුත් ඊට අදාල අධිකාර බලය පිළිබඳ විස්තරද එම ආපසු ගෙවීම්වලට අදාල විස්තරද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(vii) ආදායම් රැස්කිරීමේ ගිණුම්**

ආර්ථික සේවා ගාස්තු ආදායම්, එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැඟීමේ බදු සඳහා රාජ්‍ය බැංකු දෙකක ආදායම් රැස්කිරීමේ ගිණුම් පවත්වා තිබුණි. එම ගිණුම් සම්බන්ධයෙන් භාරව කටයුතු කළ ආදායම් ගණකාධිකාරී විසින් 2013 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2013 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ බැංකු ගෙවීම් පත්‍රිකා නොමැතිව (No Slips) ආර්ථික සේවා ගාස්තු රැස්කිරීමේ ගිණුමට රු.65,551,224 ද, එකතු කළ අගය මත බදු රැස්කිරීමේ

ගිණුමට රු.46,120,423 ක්ද හා ජාතිය ගොඩනැඟීමේ බදු රැස්කිරීමේ ගිණුමට රු.68,768,608 ක්ද බැර කර තිබුණි. ගෙවීම් පත්‍රිකා රහිතව වූ එම ලැබීම් නිවැරදිව ගිණුම්ගත කර තිබුණු බව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

- ගෙවීම් පත්‍රිකා නොමැතිවීම නිසා ගෙවන ලද බදු මුදල්, බද්ද ගෙවා තිබුණු බදුකරුගේ ගිණුම්වල සටහන් කර නොතිබුණි.

- ගෙවීම් පත්‍රිකා නොමැතිව ලැබී තිබූ බදු මුදල් පිළිබඳ විස්තර (මූලාශ්‍ර තොරතුරු) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් රඳවා ගැනීම් බදු (පොලී මත) සහ රඳවා ගැනීම් බදු (නිශ්චිත ගාස්තු) සඳහා රාජ්‍ය බැංකුවක පවත්වා ගෙන යනු ලබන රැස් කිරීමේ බැංකු ගිණුම් දෙකෙහි 2013 දෙසැම්බර් 31 දිනට පැවති පිළිවෙලින් රු.158,556,484 සහ රු.52,430,616 ක් ලැබීම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට මාරු කර නොතිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල වූ ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(viii) බදු පනත්වලින් පැනනැගී ඇති ගැටළු**

2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් කාර්තුවක පිරිවැටුම රු.මිලියන 3 ක් හෝ වර්ෂයකට රු.මිලියන 12 ක් ඉක්ම නොවූ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැඟීමේ බදුකරුවන්ගේ බදු ලියාපදිංචි කිරීම් අවලංගු කිරීමේදී හිඟ බදු පැවති බදුකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කර නොතිබුණි. මේ නිසා එම බදුකරුවන්ට තම ටින් අංක යටතේ, බදු ව්‍යාජ ලෙස අයකර ගැනීමට ඉඩ කඩ සැළැසී තිබුණි.

**(ix) බදු වෙනුවෙන් ලද චෙක්පත් අඟරුවීම**

2012 වර්ෂයේ සිට 2013 ජූනි මාසය දක්වා එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැඟීමේ බදු ගෙවීම්වලට අදාල චෙක්පත් අඟරුවීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- අගරු චෙක්පත් ලේඛනයෙහි දැක්වෙන පරිදි 2012 වර්ෂයේ ලැබී තිබුණු චෙක්පත් 385 කින් එකතුව රු.මිලියන 47 වූ චෙක්පත් 253 ක් ද, 2013 ජූනි 30 දින දක්වා කාලයට අයත් චෙක්පත් 116 කින් එකතුව රු.මිලියන 18 ක්වූ චෙක්පත් 77 ක් ද අඟරු වී තිබුණි. 2014 ජූනි 30 දින වන විටද ඉහත අගරු වී තිබුණු චෙක්පත්වලින් චෙක්පත් 234 කට අදාළව එකතුව රු.මිලියන 46 ක් තවදුරටත් අයනොවී පැවතුණි.

- අගරු චෙක්පත්වලට අදාලව පරිගණක පද්ධතියේ බදුකරුවන් 57 ක් පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවේදී එකතුව රු.මිලියන 103 ක් වූ චෙක්පත් 102 ක් අවලංගු වී තිබූ බව අනාවරණය වූ අතර, එම

චෙක්පත්වලින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් රු.මිලියන 44 ක් අය වී නොතිබුණි.

- බදුකරුවන් 17 ක ගෙන් රු.5,132,109 ක් වූ පෙරදාතම් කළ චෙක්පත් 17 ක් ලබා ගෙන තිබුණු අතර, ඉන් රු.272,918 ක් වූ චෙක්පත් 8 ක් අවලංගු වී තිබුණි. එම චෙක්පත්වලට අදාල මුදල් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ලබා ගෙන නොතිබුණි.

- අය නිෂ්කාෂණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2012 ජනවාරි 20 දිනැති උපදෙස් ලිපිය අනුව බදු ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන චෙක්පත් අගරු වූ විට, එම චෙක්පතේ වටිනාකමට සියයට 10 ක දඩ මුදලක් එකතු කර අයකළ යුතු වුවත්, නියැදි පරික්ෂාවේදී එකතුව රු.81,154,160 ක් වූ අගරු චෙක්පත්වලින් දඩ මුදල් වශයෙන් එකතුව රු.2,155,062 ක් පමණක් අයකර ගෙන තිබුණි.

**(x) ඵලදායී අනුපාතය**

2013 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මුළු වියදම රු.මිලියන 1,876 ක් වූ අතර තථ්‍ය බදු ආදායම රු.මිලියන 467,162 ක් විය. ඒ අනුව ඵලදායී අනුපාතය 249:1 ක් හෙවත් රු.100 ක් රැස් කිරීමේ පිරිවැය ශත 40 ක් වී තිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,395,787 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 11.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 11.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1)දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපත් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2014 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් තිබුණි.

**11.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණත්, එම සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

**11.4.3 අභ්‍යන්තර විගණනය**

**----------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු නමුත්, බදු ආදායම පිළිබඳ පරීක්ෂාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය බලතල පවරා විගණන කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**11.4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

**----------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති අතර 2013 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**11.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
| --- | --- | --- |
| ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර | 02 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී සපයා තිබුණු ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර දෙක 2009 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. |
| සී.සී.ටී.වී.කැමරා | 70 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී ගොඩනැගිල්ලේ මහල්වලට 2010 වර්ෂයේදී සී.සී.ටී.වී.කැමරා සවිකර තිබුණු නමුත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි. |

ඉහත සඳහන් වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-------------------------------------------**

දෙපාර්තමේන්තුව සතුව පැවැති විදුලි උත්පාදන යන්ත්‍රයක් 2009 වර්ෂයේ සිට රාජ්‍ය සංස්ථාවකට ලබා දී තිබුණි.

**(ඇ) ලැබිය යුතු ශේෂ**

**------------------**

රාජ්‍ය සංස්ථාවකට අයත් පර්චස් 100 ක ඉඩම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 28 දින රුපියල් මිලියන 50 ක් එම සංස්ථාවේ සභාපති වෙත ගෙවා තිබුණි. පසුව එම දේපල පවරා ගැනීම නවතා තිබුණද එම අත්තිකාරම් මුදල් අයකර ගෙන නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විසර්ජන ගිණුමේ වර්ෂ 01 ට අඩු නොපිය වූ බැරකම් ලෙස රු.60,263,549 ක් පමණක් දක්වා තිබූණද ඊට අතිරේකව වැය විෂයයන් 3 කට අදාළව තවත් එකතුව රු.7,715,839 ක් වූ බැරකම් පැවතුණි.

## 11.6 අනුකූල නොවීම

**-----------------**

**බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

**--------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

(අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 58(3)(අ) වගන්තිය ප්‍රකාරව යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක බදුකරුට දැන්වීමෙන් පසු නොගෙවා ඇති බද්දට එරෙහිව ආපසු ගෙවිය යුතු බදු මුදල් හිලව් කිරීමට කටයුතු කළ යුතුය. එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවකදී ඊට පටහැනිව බදුකරුවන් 20 කගේ පරිගණක ගිණුම් අනුව හිඟබදු වශයෙන් එකතුව රු.මිලියන 334ක් පැවතියද 2013 වර්ෂයේදී ඉන් රු.මිලියන 105 ක් එම බදුකරුවන්ට ආපසු ගෙවා තිබුණි.
පැරණි හිඟබදු සඳහා කරන ලද ගැලපීම් බදුකරුවන්ගේ ගිණුම්වල සටහන් නොවීමෙන් මෙම තත්ත්වය පැනනැගී ඇති බව දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පැහැදිලි කිරිමක් කර තිබුණි. එහෙත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම හිඟබදු එසේම තිබියදී ඒවා පිළිබඳව ගැලපීම් නොකර බදු ආපසු ගෙවා තිබුණි.

(ආ) 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධන 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වගන්තිය සහ 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 55 වගන්තිය ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර ගෙවීම් පැහැර හැර ඇති එකතු කළ අගය මත බදුද, 2010 මාර්තු 31 දිනට පෙර ගෙවීම් පැහැර හැර ඇති ආදායම් බදුද නිදහස් කිරීමට විධිවිධාන සළසා තිබුණි. මෙම බදු නිදහස් කිරීමට අදාලව 2011 වර්ෂයට අදාලව බදුකරුවන් 80 ක්ද, 2012 වර්ෂයට අදාලව බදුකරුවන් 86 ක්ද, 2013 සැප්තැම්බර් 30 දිනට අදාලව

බදුකරුවන් 21 ක්ද, බදු නිදහස් කිරීම් ඉල්ලා තිබුණු බවට 2013 දෙසැම්බර් 09 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් විගණනයට දන්වා තිබුණි. අදාල පනත් නිකුත් කර වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණත් දෙපාර්තමේන්තුවට එවා තිබුණු ඉහත දැක්වෙන බදු නිදහස් කිරීම්වලින් ඉල්ලීම් 118 ක් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) අවලංගු කරන ලද බදු පනත් 06 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට හිඟබදු ශේෂය රු.මිලියන 11,699 ක් පැවති අතර, එම හිඟ බදු 2014 අප්‍රේල් මාසයේ සිට පරිගණකයෙන් සහ ටින් අංකවලින් ඉවත් කර පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකයට මාරු කර තිබුණි. එම බදුවලට අදාල කටයුතු අතින් (Manual) පවත්වාගෙන යාම නිසා එහි අභ්‍යන්තර පාලනයේ පහත සඳහන් අඩුපාඩු විගණනයේදි නිරික්ෂණය විය.

(i) එකම බදුකරුවකුට අයත් සමස්ත හිඟ බදු, පැහැර හරිනු ලැබූ බදු අය කර ගැනීමේ ඒකකයේ වාර්තාවේ සහ පරිගණක පද්ධතියේ පැවතීම නිසා හිඟ බදු ශේෂ අත්හැරී යාමට ඉඩකඩ පැවතීම.

(ii) පැරණි හිඟ බදු අයකර ගැනීමට වඩා වර්තමාන හිඟ බදු අයකර ගැනීමට මූලිකත්වය දී කටයුතු කිරීමට පෙළඹීම.

(iii) මාරු කර තිබුණු හිඟ බදුවලට අදාල ලැබීම් පරිගණක පද්ධතියේ ප්‍රථමයෙන් සටහන් වීමත්, පසුව එම ලැබීම් ඉවත් කර හිඟබදු ලේඛණවල සටහන් කිරීමටත් සිදු වීම නිසා එකම ලැබීම දෙවරක් සටහන් කිරීමට සිදු වීම.

(iv) හිඟ බදු සඳහා කරනු ලබන ගෙවීම් පිළිබඳ වාර්තාවක් පරිගණක අංශයෙන් මාසිකව පැහැර හරිනු ලැබූ බදු අය කර ගැනීමේ ඒකකය වෙත ලබා දෙනු ලැබේ. මේ නිසා පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකය විසින් පවත්වා ගෙන යනු ලබන හිඟ බදු ලේඛවල අදාල ප්‍රේෂණ දෛනිකව සටහන් කිරීම වෙනුවට මාසිකව සටහන් කිරීමට සිදු වී තිබුණි.

## 11.7 ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා

2009 වර්ෂයේ දී රු.මිලියන 1,585 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය සංස්ථාවකට ලබාදී තිබුණු අතර එම නවීකරණ කටයුතු විධිමත් පරිදි සිදු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ගොඩනැගිල්ලේ සමහර මහල්වලින් වැසි ජලය ගලා ඒම නිසා කාර්යාල කටයුතු පවත්වා ගෙනයාමේදී දුෂ්කරතා පැවැතුණි.

(ii) නවීකරණ කටයුතු සඳහා වසර 4 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද, ඇස්තමේන්තුවේ සඳහන් මහල් 09 කින් යුත් වාහන අංගනයේ කටයුතු 2009 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු වුවත්, එය 2013 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(iii) නවීකරණ කටයුතු නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව යටතේ සපයන ලද කාර්යාල උපකරණ සවිකිරීම් හා යන්ත්‍රෝපකරණ විධිමත් ලෙස බාරදී නොතිබුණි.

(iv) නවීකරණය කරන ලද ගොඩනැගිල්ලේ සමහර ඉදිකිරීම්, සවිකිරීම් සහ සපයන ලද උපකරණ කැඩී බිඳී තිබුණි.

(v) ගොඩනැගිල්ලේ විදුලි පද්ධතියෙහි නවීකරණ කටයුතු රාජ්‍ය සංස්ථාවක් විසින් විධිමත්ව සිදු කර නොතිබුණි. මේ නිසා එම විදුලි පද්ධතියේ අඩුපාඩු සකස් කිරීම වෙනුවෙන් ලංසු කැඳවීමක් කර නොතිබුණු අතර බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට ඒ සඳහා රු.862,400 ක් ගෙවා තිබුණි.

## 11.8 අවිධිමත් ගනුදෙනු

--------------------

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අවිධිමත් ස්වභාවයේ ගනුදෙනු නිරීක්ෂණය විය.

### (අ) පරිගණක 235 ක් මිලදී ගැනීම

--------------------------------

දෙපාර්තමේන්තුව සඳහා Lenova think Centre M 72 e වර්ගයේ පරිගණක 210 ක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමකට රු.26,685,120 ක්ද H P Compac Elite 8300 වර්ගයේ පරිගණක 25 ක් මිලදී ගැනීම සඳහා තවත් පෞද්ගලික සමාගමකට රු.4,125,276 ක්ද ගෙවා තිබුණි. මෙම මිලදී ගැනීම් පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය රුපියල් මිලියන 30 කට වඩා අධික වී තිබුණත්, ඒ සඳහා රුපියල් මිලියන 5 ක පමණක් ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. ලංසු දැන්වීම් පල කිරීම, තාක්ෂණ කමිටු වාර්තා ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටුව විසින් මිලදී ගැනීම අනුමත කර තිබීම නිසා එළඹ තිබුණු බැරකම් මුදල් රෙගුලාසි 94(1) විධිවිධානයට අනුකූල නොවීම සළසා තිබුණු ප්‍රතිපාදනයේ ඉතිරිය ඉක්මවා තිබුණි.

(ii) 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන 2102 වැය විෂය යටතේ සළසා ගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් පරිගණක මිලදී ගැනීම් සඳහා ප්‍රතිපාදන 2103 වැය විෂය යටතේ සළසා ගෙන උපයෝජනයන් කර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:10 මාර්ගෝපදේශය ප්‍රකාරව පරිගණක සැපයූ පෞද්ගලික සමාගම් දෙක සමඟ සළසා තිබුණ කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:11මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ලබා ගැනිමටද කටයුතු කර නොතිබුණි.

(iv) මෙම පරිගණක මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(v) කොන්ත්‍රාත් පිරිනැමීමට අදාළව 2013 මැයි 15 දිනැති ලිපිය අනුව සති 02 ක් ඇතුළත පරිගණක සැපයිය යුතු වුවත්, පරිගණක මාස 2 ක ප්‍රමාදයකින් පසුව 2013 අගෝස්තු 01 දින හා අගෝස්තු 12 දින සපයා තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් අදාළ සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(vi) දෙපාර්තමේන්තුව විසින් මිලදී ගැනීමට තීරණය කර තිබුණු ලෙනෝවා තින්ක් සෙන්ටර් එම්72ඊ (Lenova think Centre M 72e) වර්ගයේ පරිගණක 210 සහ H P Compac Elite 8300 වර්ගයේ පරිගණක 25 අදාළ පිරිවිතරයන්ට අනුකූලව සපයා නොතිබුණු අතර ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු සකස් කර දීමට අදාළ සමාගම් එකඟතාවය පලකර තිබුණි. මේ අනුව අදාළ සමාගම් විසින් සපයා තිබුණු පරිගණක පිරිවිතරයන්ට අනුකූලව වී නොතිබුණු බව විගණනයේදි තහවුරු විය.

**(ආ) පරිගණක දත්ත පරික්ෂා කිරිම**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, බදු මුදල් ගෙවූ බවට පරිගණක ජාලයට ව්‍යාජ ලෙස දත්ත ඇතුළත් කිරීම මගින් රු.මිලියන 129 ක මූල්‍ය වංචාවක් සිදු කර තිබුණි. මෙම මූල්‍ය වංචාව සඳහා ලබා දී තිබුණු උසාවි නියෝගය අනුව පරිගණක පද්ධතියේ උපස්ථම්භක පිටපත් (Backup) පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනිමට රජයේ විශ්ව විද්‍යාලයක් රු.මිලියන 2.8 කට එකඟ වී තිබුණි. ඒ සඳහා එම විශ්වවිද්‍යාලයකට රු.1,400,000 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 50 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එම වාර්තාව අදාළ විශ්වවිද්‍යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ලබා දී නොතිබුණි. එසේම මේ පිළිබඳව අධිකරණයට දැනුම් දීම හෝ ඊට අදාල පරීක්ෂණ අවසන් කර, සිදුවී තිබූ අලාභ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ඇ) නුවරඑළිය ප්‍රාදෙශීය කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් නිල නිවස අළුත්වැඩියාව**

නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස් නිල නිවාසය අලුත්වැඩියා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ලංසු කැඳවා අඩුම මිල ඉදිරිපත් කර තිබුණු ආයතනයක් වෙත රු.මිලියන 11 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිල නිවස අලුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8:1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥතාවයකින් යුත් එක් සාමාජිකයෙක් හෝ තාක්ෂණ ඇගයීම්

කමිටුවෙහි සිටිය යුතු වුවත් මෙම කොන්ත්‍රාත් කාර්යයට අදාල තාක්ෂණ ඇගයීම් කමිටුවට එවැනි විශේෂඥ දැනුමක් ඇති නිලධාරියෙක් (ඉංජිනේරු වෘත්තියට අදාල) පත් කර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කර තිබූ ගිවිසුමෙහි 14 වගන්තියට අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිඛිත අනුමැතියක් නොමැතිව කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කාර්යයන් වෙනත් කිසිවෙකුට පැවරීමට නොහැකි වුවත්, ගෙවත්ත සාදා නිම කිරීමේ කටයුතු රු.1,141,400 කට උපකොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි.

(iv) 2013 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු 2013 පෙබරවාරි 15 දින ආරම්භ කර 2013 නොවැම්බර් 30 දිනට ප්‍රථම අවසන් කළ යුතුව තිබුණත්, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම 2014 ජූනි 26 දින සිදුකර තිබුණි.

**(ඈ) නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම**

නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තු ඉංජිනේරුවරිය විසින් රු.11,195,669 කට ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයට රු:8,467,818 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව සමඟ සියයට 24.36 ක විචලතාවක් පැවතුණද එම මිලට කොන්ත්‍රාත්තුව ඉටුකළ හැකි බවට ඉංජිනේරුවරිය සනාථ කර තිබුණි. එහෙත් අදාල කොන්ත්‍රාත් කාර්යය නියමිත පරිදි අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වී තිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත් කාර්යය මාස 03 දින 21 ක් තුළ එනම් 2013 දෙසැම්බර් 10 දින වන විට අවසන් කළ යුතු වුවත්, එම කාර්යය 2014 දෙසැම්බර් 31 දින වන විට ද අවසන් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) කොන්ත්‍රාත්කරුට බිල්පත් 05 ක් යටතේ රු.3,987,216 ක් 2014 ජුනි 25 දින ගෙවා තිබුණි. එහෙත් ප්‍රමාද කාලය සඳහා ගාස්තු අයකර නොතිබුණි.

**11.9 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

**පරිගණක පද්ධතියේ සටහන් ව්‍යාජ ලෙස වෙනස් කිරීම**

2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ සටහන් ව්‍යාජ ලෙස වෙනස් කිරීම මඟින් බදු ලිපිගොනු 07 ක රු.184,665,975 ක් සහ තවත් එක් බදු ලිපිගොනුවක රු.19,242,377 ක අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. මේ සම්බන්ධ නිලධාරීන් දෙදෙනා පිළිබඳව මූලික පරීක්ෂණ 2013 දෙසැම්බර් 31 දින වන විටද පවත්වා අවසන් කර නොතිබුණි.

**11.10 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 894 | 731 | 163 |
| තෘතියික මට්ටම | 1,024 | 552 | 472 |
| ද්විතියික මට්ටම | 662 | 542 | 120 |
| ප්‍රාථමික මට්ටම | 397 | 365 | 32 |
| එකතුව | 2,977 | 2,190 | 787 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 787 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**12. ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**

**---------------------------------**

**12.1 විගණන විෂය පථය**

**----------------------**

ශ්‍රී ලංකා රේගුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 පෙබරවාරි 05 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා

ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 12.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා රේගුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඔ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4 සිට 12.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රේගුව විසින් 2014 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය හා ගිණුම් අංකය | ගිණුමේ නම | ගිණුම විගණනයට ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 24701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය | 2014.05.07 |
| 7000/0000/000/0247/0002 | අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම | 2014.05.07 |
| 6000/0000/00/0015/0127/000 | විවිධ තැන්පත් ගිණුම | 2014.06.18 |
| 6000/0000/00/0006/0032/000 | රේගු අතිකාල හා නැවබඩු පරීක්ෂණ ගාස්තු අරමුදල | 2014.05.07 |
| 6000/0000/00/0006/0061/000 | රේගු නිලධාරීන්ගේ කළමණාකරන හා වන්දි අරමුදල | 2014.05.07 |
| 6000/0000/00/0006/0062/000 | රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | 2014.05.02 |

### (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා රේගුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
| --- | --- | --- |
| පරිගණක, උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු තහවුරු කිරිම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(i) එකතුව රු.117,195,709 ක් විටිනා ගෙවීම් වවුචර් 61 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අත්අඩංගුවට ගන්නා හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුමට අදාළ ඇතැම් විමර්ශන ලිපිගොනු සහ ත්‍යාග ලැයිස්තු ලිපිගොනු, වෙනත් ආයතනවලට ලබාදී ඇති වත්කම් හා මානව සම්පත් පිළිබඳ තොරතුරු 2012 වර්ෂයට පෙර සිදුවී තිබුණු වාහන අනතුරු ලිපිගොනු සහ බාහිර ආයතන වලට අයත් වත්කම් හා මානව සම්පත් භාවිතා කිරීම් පිළිබඳ තොරතුරු ආදී වූ අවශ්‍ය සාක්ෂි ශ්‍රී ලංකා රේගුව විසින් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ඈ) අයවැය විචලනය**

2012 දෙසැම්බර් 28 දිනැති අංක 157 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සළසා දී තිබුණු ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණය කර ගත යුතු වුවත්, එම උපදෙස්වලට පටහැනිව පහත පරිදි කටයුතු කර තිබුණු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ඉන්ධන වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.27,000,000 ක් වුවද, ඉන් රු.26,954,018 ක් උපයෝජනය කර තිබුණි. එම වියදමට අතිරේකව තවත් රු.13,404,494 ක් ත්‍යාග අරමුදලෙන් වැය කර තිබුණි.

(ii) ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම සඳහා එකතුව රු.3,800,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් එකතුව රු.3,751,156 ක් උපයෝජනය කර තිබුණි. එම කාර්යයන් සඳහා එම

ප්‍රතිපාදනවලට අමතරව රු.84,656,355 ක් කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කර තිබුණි.

(iii) ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය සඳහා රු.31,660,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.31,642,910 උපයෝජනය කර තිබුණු අතර ඊට අතිරේකව රු.9,358,916 ක් කළමනාකරණ වන්දි අරමුදලෙන් වැය කර තිබුණි.

**(ඉ) අග්‍රිම ගිණුම්**

**-------------**

ශ්‍රී ලංකා රේගුව විසින් 2013 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පියවිය යුතු රු.4,751,600 ක් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් පියවා නොතිබුණි. ඉන් රු.1,846,600 ක්වූ ශේෂ 2007 වර්ෂයේ සිටද, රු.2,880,000 ක්වූ ශේෂ 2008 වර්ෂයේ සිටද හා රු.25,000 ක්වූ ශේෂ 2010 වර්ෂයේ සිටද පැවත එමින් තිබුණි.

**(ඊ) විවිධ තැන්පත් ගිණුම**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 ජුලි 12 දිනැති අංක 209/2010 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3(1) ඡේදය ප්‍රකාරව තැන්පතු ලෙජරවල 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ දක්වා නොතිබුණි.

(ii) තැන්පතු ලෙජරවල වර්ෂ දෙකක් ඉකුත්වූ සියළු තැන්පතු සඳහා අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කිරීම, තුලන ගිණුම පවත්වා ගැනීම, ශේෂයන් ඉදිරියට ගෙන යාම හා මාසික තැන්පතු සාරාංශ පිළියෙල කිරීම යනාදිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(1), 565(3), (4) හා (5) වගන්තිවල ඇතුළත් ඇතැම් විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

(iii) පොදු තැන්පත් ගිණුමේ විවිධ තැන්පතු ලැබීම් හා ගෙවීම්වලට අදාලව උපයෝගී ලෙජරයන්හි දක්වා ඇති කේවල ශේෂ එකතුන් හා ගිණුම්වල දක්වා ඇති කේවල ශේෂ එකතූන් අතර පිළිවෙලින් රු.287,000 ක හා රු.18,608,074 ක ප්‍රමාණාත්මක වෙනස්කම් තිබුණි.

(iv) සැසඳුම් ප්‍රකාශයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂයට රු.336,674 ක්වූ අවලංගු කළ චෙක්පත් වටිනාකමද ඇතුළත් කර තිබුණි.

(v) මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ඉකුත්වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමේදී රු.7,663,624 ක තැන්පතු අඩුවෙන්ද, රු.2,174,624 ක තැන්පතු වැඩියෙන්ද බැර කර තිබුණි.

(vi) “ආනයන බාහිර පරීක්ෂණ ගාස්තු තැන්පතු ගිණුම” හා “පූර්ණ බහාළුම් මෙහෙයුම් ගාස්තු තැන්පතු ගිණුම” යන තැන්පතු ගිණුම්වල පැවති ශේෂ

ඉක්මවා වර්ෂය තුළදී ගෙවීම් කර ඇති බව වාර්තා කිරීම හේතුවෙන් වර්ෂ අවසානයට එම ගිණුම්වල ශේෂ රු.361,150 ක හර ශේෂ බවට පත්වී තිබුණි.

**(උ) ආදායම් ගිණුම්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ගිණුම් පහලොවට (15) අනුව එකතුව රු.මිලියන 13,226 ක ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය අතර කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) මුදල් රෙගුලාසි 128 (2) ප්‍රකාරව ආදායම් සංකේත 15 කට අදාල 2013 ජුනි 30 දිනට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(iii) 2013 වර්ෂයේ බහාළුම් නිදහස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- බහාළුම්වලට අදාලව වර්ෂය තුළ රේගු සටහන්කර 175,062 ක් ඉදිරිපත් කර තිබූ අතර එයින් සටහන් කර 140,624 ක් හෙවත් සියයට 80.33 පහසු නිදහස් කිරීම් (Amber Channel) යටතේ ද, සටහන්කර 18,748 ක් හෙවත් සියයට 10.71 ක් විස්තරාත්මක පරීක්ෂා කිරීම් (Detail Channel) යටතේද, සටහන්කර 2,257 ක් හෙවත් සියයට 1.29 ක් අධිඅවදානම් පරීක්ෂා කිරීම් (High risk Channel) යටතේද, සටහන්කර 6,217 ක් හෙවත් සියයට 3.55 ක් අවදානම් පරීක්ෂා කිරීම් (Red Channel) යටතේද සහ ආයෝජන මණ්ඩලීය බහාළුම් හා වෙනත් යටතේ සටහන්කර 7,216 ක් හෙවත් සියයට 4.12 ක්ද, නිදහස් කර තිබුණි. ඒ අනුව මුළු රේගු සටහන්කර අතරින් සියයට 15.55 කට ආසන්න ප්‍රමාණයක් විධිමත් පරීක්ෂණ ක්‍රියාවලියකට යොමු කර ඇති බවත්, සියයට 84.45 කට ආසන්න ප්‍රමාණයක් පූර්ණ බහාළුම් පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කර තිබූ බවත් නිරීක්ෂණය විය. එම ක්‍රමවේදය යටතේ, රේගු පනතේ විධිවිධානවලට පටහැනි ආනයනයන්, නිදහස් වීමට හැකි පුළුල් ඉඩකඩක් පැවැතී තිබුණි.

- ස්ක්‍රීනින් අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂකවරයෙක් විසින් රේගු පරීක්ෂාවේ ස්වභාවය තීරණය කරන අතර, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. අදාල නිලධාරියාගේ පළපුරුද්ද හා ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු අනුව පරීක්ෂණ ක්‍රමවේදය තීරණය කෙරෙන බවට කරුණු ඉදිරිපත් කර තිබුණත්, ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු සහ වැරදි හඳුනාගැනීමට අදාල තොරතුරු පද්ධතියක් ස්ක්‍රීන් අංශය තුළ ස්ථාපිත කර

නොතිබුණු බැවින්, පරීක්ෂණ ක්‍රමවේදය නිලධාරියාගේ අභිමතය පරිදි තීරණය කර තිබුණි.

- "ආසිකුඩා" පරිගණක මෘදුකාංගය විසින් ස්වයංක්‍රීයව තෝරාදෙනු ලබන පරීක්ෂණ ක්‍රමවේදය ස්ක්‍රීන් අංශයේ නිලධාරීන්ගේ අභිමතය පරිදි වෙනස් කෙරෙන අතර පහසු නිදහස් කිරීම් (Amber Channel) හි සිට විස්තරාත්මක පරීක්ෂා කිරීම් (Detail Channel), අවදානම් පරීක්ෂා කිරීම් (Red Channel), හා අධිඅවදානම් පරීක්ෂා කිරීම් (High risk Channel) යන චැනල් වෙත වෙනස්කිරීම යෝග්‍ය වෙතත්, එම පරීක්ෂණ ක්‍රමවලින් පහසු නිදහස් කිරීම් (Amber Channel) වෙත යොමුකිරීම වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවයද නිරීක්ෂණය විය.

- වාප්පු ලිපිකරුවන් නිතර නිතර දිගුකාමරයේ රාජකාරියෙහි නියුක්ත නිලධාරීන් අසල රැඳී සිටීමත් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක ආරක්ෂිත කැමරා පද්ධතියට සම්බන්ධ දිගු කාමරයේ සවි කර තිබෙන කැමරා දිගු කාමරයෙන් පිටත දර්ශනය වන අයුරින් සවිකර තිබුණි.

- සියයට 7.03 ක වාර්ෂික පොලී අනුපාතිකයකට ලංකා බැංකු ණය යෝජනා ක්‍රමයක් යටතේ ඇමරිකානු ඩොලර් 15,600,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු ස්කෑන් යන්ත්‍ර 04 සඳහා සේවා කිරීමට කාර්තුවකට රු.3,876,000 ක් සහ අමතර කොටස් සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් විශාල මූලික පිරිවැයක් සහ නඩත්තු පිරිවැයක් දරා තිබුණත්, 2013 වර්ෂයේ ඉදිරිපත් කළ මුළු රේගු සටහන්කර 175,062 ට අදාල බහාළුම් 261,165 ක් අතරින් 24,985 ක් හෙවත් සියයට 9.57 ක් වැනි සුළු සංඛ්‍යාවක් පමණක් ස්කෑන් පරීක්ෂාවකට ලක් කර තිබුණි.

- 2013 වර්ෂයේ රේගු සටහන්කර අතරින් සියයට 80.33 හෙවත් සටහන්කර 140,624 ක් පහසු නිදහස් කිරීම් (Amber Channel) යටතේ නිදහස්කර තිබුණි. එයින් වැඩිම ප්‍රමාණයක් කොළඹ වරාය පරිශ්‍රයේ සිට කිලෝ මීටර් 4 ක් පමණ දුරින් පිහිටි බහාළුම් අංගනයක රේගු පරීක්ෂණ කාර්යාලය වෙත යොමුකර තිබුණි. පරීක්ෂා කිරීම් සඳහා වරාය පරිශ්‍රයේ සිට මෙම අංගනය වෙත යොමු කෙරෙන බහාළුම් නිශ්චිතවම පරීක්ෂණ අංගනය වෙත පැමිණියේද යන්න තහවුරු කර ගැනීමට උපකාරී වන, බහාළුම් පාලන පරිගණක පද්ධතිය (Cargo Control System) එහි ඇති රේගු උපකාර්යාලයට ලබාදී නොතිබුණි.

(iv) පූර්ණ බහාළුම් යටතේ ගෙන්වනු ලබන බහාළුම් විශාල සංඛ්‍යාවක් අතරින් එකක් හෝ දෙකක් පමණක් රේගු පරීක්ෂා කිරීම් සඳහා ඉහත සඳහන් බහාළුම් අංගනයන් වෙතද ඉතිරි බහාළුම් ආනයනකරුගේ ගබඩා වෙතද යවනු ලබයි. එම ක්‍රියාවලියේදී බහාළුම් අංගනයන් වෙත යොමු කරන ලද නියැදිය මත ලබා ගන්නා තත්ත්ව සහතික අනුව රේගු නිදහස් කිරීම සිදු කරනු ලබයි. එසේ වුවත් ආනයනකරුගේ ගබඩා වෙත යවන ලද බහාළුම් පිළිබඳ රේගු

අධීක්ෂණයක් ක්‍රියාත්මක නොවන අතර ඒ තුළින් සිදු විය හැකි අක්‍රමිකතා ඇතිවීමේ ඉඩකඩක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) බොහෝ විට නිලධාරීන් මාස හයෙන් හයට කාර්ය ස්ථාන මාරු කිරීම කර තිබුණි. මේ හේතුවෙන් ප්‍රගති වාර්තා නිසි ලෙස පිළියෙල නොකිරීම හා ඒ හේතුවෙන් වෙනත් අවශ්‍ය අංශ විසින් තොරතුරු විශ්ලේෂණය කර තීරණ ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොතිබීම, සිද්ධි ලිපිගොනු සම්බන්ධයෙන් අඛණ්ඩ ක්‍රියා නොකිරීම හා බාහිර පරීක්ෂණවලට අදාල ලිඛිත තොරතුරු විධිමත් ලෙස ගොනුගත නොකිරීම වැනි දුර්වලතා පැවතුණි.

(vi) ජපානයේ වාහන වෙන්දේසිවලදී ඉහළ මිලක් ගෙවා මිලදී ගත් වාහන ශ්‍රී ලංකාවට ආනයනය කර තිබුණි. ශ්‍රී ලංකා රේගුව විසින් එම වාහනවල වටිනාකම ඉතා අඩුවෙන් සඳහන් කර බදු ගණනය කිරීම නිසා රජයට වාර්ෂිකව විශාල රේගු බදු ආදායමක් අහිමි කර තිබුණි. අන්තර්ජාල වෙබ් අඩවි ඔස්සේ ලබා ගත් තොරතුරු අනුව වෙන්දේසි මිල හා වැය කළ අතිරේක පිරිවැයද සැලැකිල්ලට ගෙන වරාය තෙක් පිරිවැය (FOB) ජපාන යෙන් 64,255,000 ක් වූ වාහන 33 ක නියැදියක් පරික්ෂා කිරීමේදී රේගුව විසින් එම වාහනවල බදු කටයුතු සඳහා වටිනාකම ලෙස ජපාන යෙන් 47,298,250 ක් ලෙස පාදක කර ගෙන තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රේගුව බදු කටයුතු සඳහා ජපාන යෙන් 16,956,750 ක අඩු වටිනාකම මත බදු ගණනය කිරිම නිසා විශාල බදු ආදායමක් රජයට අහිමි කර තිබුණි. එම වාහන 33 න්, වාහන 10 ක් සම්පූර්ණ බදු ගෙවීමේ පදනම මත ආනයනය කර තිබුණු අතර වටිනාකම අඩුවෙන් දැක්වීම නිසා එම වාහන 10 න් පමණක් රජයට දළ වශයෙන් රු.5,025,942 ක් බදු ආදායමක් අහිමි වී තිබුණි

(vii) 2013 මැයි 21 දිනැති අංක DOPL 854 B දරන රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි 2013 මැයි 21 දිනෙන් පසුව, වාහන සඳහා බදු ගණනය කිරීමේ වටිනාකම ලෙස එක් එක් වාහන වර්ගය සඳහා තථ්‍ය පිරිවැය මත බදු ගණනය නොකර සම්මත වටිනාකමක් මත බදු ප්‍රමාණය තීරණය කර තිබුණි. මෙම ස්ථාවර මිල ප්‍රතිපත්තිය තීරණය කිරීම සඳහා අදාල වාහන කාණ්ඩ සඳහා දේශීය නියෝජිතයන් ඉදිරිපත් කළ මිල ගණන් පදනම් කර ගෙන තිබුණි. වාහන 11 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී එම එක් වාහනයකින් අවම වශයෙන් ජපාන යෙන් 178,500 සිට ඊට වඩා අඩුවෙන් සම්මත මිල සඳහන් කර තිබීමෙන් රජයේ බදු ආදායම අහිමිවිම ඉහළ මට්ටමක පැවැතුණි.

(viii) 1988 වර්ෂයේ අයවැය යෝජනා අනුව අපනයනය සඳහා ඇඟළුම් නිෂ්පාදනය කරනු ලබන ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි නොවූ ආයතනවලට ආනයන හා අපනයන් සිදු කිරිම සඳහා පහසුකම් සළසා දී තිබුණි. එම කටයුතු ශ්‍රී ලංකා රේගුවේ ආයෝජන පහසුකම් අංශය (INFAC) විසින් අධික්ෂණය කර තිබුණි. මෙම ආයෝජන පහසුකම් ක්‍රියාත්මක කරන අංශය (INFAC) හා රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණයක් නොතිබීම, ආනයන සහ අපනයන සැසඳීම සඳහා භාවිතා කෙරෙන අනුපාතයන් තහවුරු කිරීමට අවශ්‍ය දත්ත නොවීම, ආනයනිත අමුද්‍රව්‍ය මගින් කරන ලද නිෂ්පාදනයන්, තථ්‍ය වශයෙන් අපනයනය කරන ලැබුවේද, නැතහොත්

තීරුබදු ගෙවීමකින් තොරව දේශීය වෙළඳපොළට නිකුත්කර ඇත්ද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් නොවීමද, නියැදි පරීක්ෂාවකදී අනාවරණය වූ රේගු සටහන්කර 12 කට අදාලව රු.3,933,662 ක හිඟ එකතු කළ අගය මත බදු ආදායම් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම වැනි අඩුපාඩුද නිරීක්ෂණය විය.

(ix) රේගු සටහන් කර ව්‍යාජ ලෙස භාවිතා කර නීති විරෝධී ලෙස රේගු බදු නොගෙවා ආනයනය කරන ලද හෝ සකසන ලද විවිධ වර්ගයේ වාහන 10 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමෙන් රු.මිලියන 60 කට ආසන්න බදු ආදායමක් රජයට අහිමි කර තිබුණි. ආනයනිත වාහනවලට අදාල සියළුම දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සන්නිවේදනය නොකිරීම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලබන සියළුම වාහනවලට අදාල දත්ත, ශ්‍රී ලංකා රේගුව විසින් නැවත ලබාගෙන ආනයනිත දත්ත සමග සසදා නොතිබීම හා පසු ක්‍රියාමාර්ග නොගැනීම, වංචනික ලෙස ආනයනය කළ වාහන රේගු පරීක්ෂාවකින් තොරව ආනයනකරුවන් අතට පත් වූ ආකාරය විමර්ශනය නොකිරීම හා ඊට සහාය දුන් පුද්ගලයන් හඳුනාගෙන නෛතික ක්‍රියාමාර්ග නොගැනීම යනාදි හේතු නිසා ඉහත වංචනික ක්‍රියා කිරීමට හැකි වී තිබුණි.

(x) එක් සිද්ධි ලිපිගොනුවකට අනුව ප්‍රකාශ නොකළ අයිතම වශයෙන් එල්සීඩී (LCD) මොනිටර් 45 ක් ඉලෙක්ට්‍රොනික් උඳුන් 06 ක්, අධිශීතකරණ 05 ක්, මධ්‍යම ප්‍රමාණයේ ශීතකරණ 05 ක්, කුඩා අධිශීතකරණ 06 ක් රයිස් කුකර් 10 ක් සහ තවත් විදුලි උපකරණ රාශියක්, පාවිච්චි කළ භාණ්ඩ වශයෙන් වර්ග කර රු.148,330 කට තක්සේරු කර රු. 400,000 දඩයකට යටත්කර මුදාහැර තිබුණි. මෙලෙස ලිහිල් දණ්ඩන පැනවීම තීරුබදු වංචාවල නිරත ජාවාරම්කරුවන් දිරිමත් කිරීමක් විය. මෙයට අමතරව ප්‍රකාශ නොකර අයිතම හඳුනාගත් විට රාජසන්තක කිරීම වෙනුවට, නිදහස් කළ අවස්ථා රාශියක් විගණනයේදී නිරීක්ෂණය විය.

(xi) සුරක්ෂිත ගබඩාවට අදාලව විධිමත් ගබඩා ක්‍රමවේදයන් පිළිපැද නොතිබීම නිසා බහාළුම් පරීක්ෂණ අංගනයේ අයිතම රාශියක් දිරාපත් වෙමින් හා විනාශ වෙමින් පැවතුණි. මෙයට අමතරව ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්වලදී ගබඩාව විධිමත් ලෙස භාර දී නොතිබුණු අතර ගබඩා ලේඛන නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. මේ නිසා භාණ්ඩ/අයිතම සොයාගැනීමට අපහසුවී තිබුණු අතර නියැදි පරීක්ෂාවකට භාජනය කළ ඇතැම් අයිතමයන් භෞතිකව ඉදිරිපත් කිරීමටද අපොහොසත් විය.

(xii) මධ්‍යම අපහරණ අංශය මගින් අලෙවියට ඉදිරිපත් කරන ලද භාණ්ඩ අලෙවි වී නොතිබුණි. මේ නිසා එම භාණ්ඩ වරින්වර අලෙවියට ඉදිරිපත් කිරීමට සිදු වී තිබුණි. මෙම භාණ්ඩ අයිතමයන්ගේ වටිනාකම තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අඩුපාඩු, ගැණුම්කරුවන් විසින් භාණ්ඩ පරීක්ෂා කරන අවස්ථාවේදී භාණ්ඩවල සමහර කොටස් නොතිබීම, අවිධිමත් ගබඩා ක්‍රමවේද හේතුවෙන් භාණ්ඩ අයිතම විනාශ වී තිබුණි. මේ හේතුවෙන් මධ්‍යම අපහරණ

අංශය මගින් අලෙවියට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩවලින් අපේක්ෂිත ආදායම රජයට ලබා ගැනීමට නොහැකි වි තිබුණි.

(xiii) උපයන විට ගෙවීම් බදු (උ.වි.ගෙ.) පිළිබඳ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- නිලධාරීන්ට එකවර ගෙවනු ලබන දීමනාවලින් අයකරන උපයන විට ගෙවීමේ බදු ( උ.වි.ගෙ.) ගණනය කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ උ.වි.ගෙ. ආදායම් බදු චක්‍ර ½ සිට 12 ගුණයක් දක්වා රේටයන් පැවති අතර ඊට වැඩි ගුණයක් අදාල වන අවස්ථාවලදී එම රේටය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් විමසා ලබා ගත යුතුව තිබුණි. එසේ වැඩි ගුණයක් අවශ්‍ය වූ අවස්ථා 121 ක් සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අදාල රේටය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

- තක්සේරු වර්ෂය තුළ නිලධාරියෙකුගේ මාසික නිත්‍ය සේවා ආදායම රු.50,000 ට අඩු වුවද, එකවර ලබන ගෙවීම්ද එකතු කළ විට වාර්ෂික ආදායම රු.600,000 ඉක්මවන අවස්ථාවලදී එම නිලධාරීන්ගෙන් උ.වි.ගෙ බදු අඩුකළ යුතු වුවත් එසේ අඩු නොකළ අවස්ථා 06 ක් අනාවරණය විය.

- මාසික නිත්‍ය සේවා ආදායම ගණනය කිරීමේදී බාහිර පරීක්ෂණ ගාස්තු, සංචිත දීමනා වැනි අමතර ගෙවීම් නොසළකා ගණනය කළ අවස්ථා පැවතුණි.

- එකවර ගෙවීම්වලින් උපයන විට ගෙවීම් බදු අයකිරීම සම්බන්ධ උපදෙස් මාලාවේ බදු චක්‍ර අංක 02 ප්‍රකාරව එම ගෙවීම් සිදු කරන සෑම අවස්ථාවකදීම තක්සේරු වර්ෂය තුළ, ඊට පෙර ගෙවන ලද එකවර දීමනා සමුච්චිත කර එය මාසික ස්ථිර ඉපැයීම් හා අනුපාත කර, බදු අනුපාතය නියමිත පරිදි යොදාගත යුතු වුවත්, එසේ කර නොතිබුණු බැවින් නියැදි පරීක්ෂාවකට භාජනය කරන ලද නිලධාරීන් 234 දෙනෙකුගෙන් අඩුවෙන් අයකර තිබුණු උපයන විට ගෙවීම් බදු මුදල රු.4,823,846 ක් වී තිබුණි.

(xiv) මධ්‍යම තැපැල් හුවමාරු රේගු කාර්යාලීය කාර්යසාධනය පරීක්ෂාවේදී විදේශ තැපැල් අංශයට මසකට පාර්සල් 50,000 කට ආසන්න සංඛ්‍යාවක් ලැබෙන බව අනාවරණය වූ අතර අතර, ඒ අතරින් රේගු කාර්ය මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි තෝරාගන්නා සියයට 1 ක පමණ ප්‍රමාණයක් පරීක්ෂාවට ලක්කරන හෙයින් රේගු බදු බැඳියාවන් සහිත භාණ්ඩ බදු ගෙවීමෙන් තොරව නිදහස්වීමට ඇති අවස්ථාවන් පැවතුනි.

(xv) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ වැඩි වටිනාකම් සහිත මෝටර් රථ 41 ක වැසි අංක, නීත්‍යානුකූල ලෙස රේගු බදු ගෙවා ආනයනය කර තිබූ බව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධති තොරතුරු අනුව සනාථ වී නොතිබුණි.

(xvi) රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායේ රේගු නිවාරණ අංශය සඳහා සහකාර නිවාරණ නිලධාරීන් දෙදෙනෙක්, රේගු පරීක්ෂක නිලධාරියෙක් සහ රේගු පරීක්ෂකවරයෙක් අනුයුක්ත කර තිබුණි. නමුත් නාවික යාත්‍රා සම්බන්ධ සම්ප්‍රදායික රේගු කටයුතු හැර වෙනත් රේගු ක්‍රියාකාරකම් හා විමර්ශන කිසිවක් පැවැත්වූ බවට ලිඛිත තොරතුරු නොතිබුණු අතර සිද්ධි ලිපිගොනු කිසිවක්ද ආරම්භ කර නොතිබුණි.

(xvii) 2009 වර්ෂයේදී හමුදා භාරයට පත්වුණු 'පාරා - 3' නෞකාවේ අබලි යකඩ, යුධ හමුදාව විසින් බාහිර පාර්ශවයක් වෙත විකිණීමෙන් ලැබුණු රු.80,300,000 ක් හමුදා නිලධාරීන්ගේ සුභසාධන අරමුදලකට බැර කර තිබුණි. 1971 අංක 52 දරන වෙළඳ නාවික පනතේ 238 වගන්තිය අනුව මෙරටට ආනයනය කළ අබලි යකඩ සේ සළකා, රේගු ආඥා පනතේ 129 වගන්තිය ප්‍රකාරව එම අබලි යකඩවලට රේගු බදු අය කර නොතිබුණි.

(xviii) විධිමත් අනුමැතියකින් තොරව ආනයනය කර තිබූ රු.4,590,000 ක් වටිනා පක්ෂීන් 121 ක් අත්අඩංගුවට ගෙන රාජසන්තක කර දෙහිවල සත්වෝද්‍යානයට භාරදීමෙන් අනතුරුව නැවත ආනයනකරු වෙතම නිදහස් කර තිබුණි. මේ නිසා රුපියල් මිලියන 2.46 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(xix) ආනයනකරුවන් විසින් අත්හරින ලද වාහන හා උපකරණ වෙන්දේසියේ විකිණීමේදී රේගුව විසින් ඒ සඳහා නිර්දේශ කරනු ලබන මිලට වඩා ගැණුම්කරුවන් ඉල්ලුම් කරනු ලබන මිල ඉහළ අගයක් ගෙන තිබුණු අවස්ථා පැවැතුණි. මේ නිසා රේගුව විසින් වාහන හා උපකරණ සඳහා නිර්දේශ කරන වටිනාකම එහි සැබෑ වෙළඳපල වටිනාකම නිරූපණයවේද යන්න මතභේදාත්මක විය.

**(ඌ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 24701 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,947,978 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර තවදුරටත් පැවති රු.56,557 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

(iii) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දහසය දෙනෙකුගේ (16) එකතුව රු.1,766,620 ක්වූ ණය ශේෂ මුදල් රෙගුලාසි 485(4) ප්‍රකාරව හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 ඡේද ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි.

(iv) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන එකතුව රු. 3,935,067 ක්වූ විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. මේ පිළිබඳව ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව ආපදා ණය සීමාව වූ රු.250,000 ඉක්මවා නිලධාරීන් 13 කට එකතුව රු.976,387 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණු අතර, 2013 ජනවාරි 31 දිනැති අංක 157(1) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02 ඡේදයේ උපදෙස් ප්‍රකාරව ආපදා ණය සීමාවන් ඉක්මවා ගෙවා ඇති ණය මුදල් ප්‍රමාණය ආපසු අයකර ගෙන නොතිබුණි.

(vi) අවස්ථා 07 කදී දේපල ණය ලබා ගත් නිලධාරින් 06 දෙනෙකු විසින් සති 06 ක් ඇතුළත ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.1.3 හා 11.9.1 වගන්ති ප්‍රකාරව මුළු ණය මුදල ආපසු ගෙවා අවසන් වන තුරු මාසික ණය වාරිකය දෙගුණ කර පොළී අනුපාතිකය සියයට 5 කින් වැඩිකර වාරික අයකර නොතිබුණි.

**(එ) වෙනත් අත්තිකාරම් ගිණුම්**

**අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාණ්ඩාගාර මුද්‍රිත සටහන හා මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගෙවීම් ශේෂය සම්බන්ධව රු.35,765 ක්වූ විචලතාවය සැසඳුම්කර ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ත්‍යාග මුදල් ගෙවීමේදී මුළු අත්තිකාරම් වටිනාකම පියවා නොගැනීම, අත්තිකාරම් වටිනාකමින් කොටසක් පියවීම සහ ලේඛන පැවැත්වීමේ අඩුපාඩු හේතුවෙන් හෝ පියවා ගැනීමේ දෝෂ හේතුවෙන් අතිරික්ත ලැබීම් ලෙස 2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන රු.2,764,113 ක් රාජ්‍ය ආදායමට බැර කර හෝ වෙනත් ආකාරයකින් නිරවුල් කර හෝ නොතිබුණි.

(iii) අත්තිකාරම් ගෙවීමට අදාල විමර්ශන අවසානයේ රේගු වරදක් නොමැතිව හෝ ලැබෙන ආදායම අත්තිකාරම පියවීමට ප්‍රමාණවත් නොවීම හෝ යන කරුණු මත දීර්ඝ කාලයක් තුළ නොපියවී පවතින හෝ පියවා ගැනීම සැක සහිත ශේෂ හඳුනාගෙන මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කපා හැරීමට ක්‍රියාකර නොතිබුණි.

(iv) අත්තිකාරම් ශේෂයයන් සම්බන්ධයෙන් වාර්තා හා ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබීම, ප්‍රමාණවත් අධීක්ෂණයක් පවත්වා නොතිබීම හා ශේෂයයන් වරින් වර තහවුරු කර ගෙන නොතිබුණි.

## 12.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 12.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම

-------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 12.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුවක එක් වරක් හෝ රැස්විය යුතු වුවත්, 2013 වර්ෂය සඳහා කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

## 12.5 වත්කම් කළමනාකරණය

---------------------------

ශ්‍රී ලංකා රේගුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත දක්වා ඇති සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i). ශ්‍රී ලංකා රේගුව විසින් රු. 859,500 ක් වැය කර 2007 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 07 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එසේම මෙම ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා වාර්ෂිකව රු.153,380 ක සේවා ගිවිසුම් ගාස්තුද ගෙවා තිබුණු අතර, රේගු නිලධාරීන් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii). බහාළුම් පරීක්ෂණ කටයුතු සඳහා සියයට 7.03 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුවෙන් ලබා ගත් ඇමරිකානු ඩොලර් 15,600,000 ක ණය මුදලක් උපයෝජනය කර 2005 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ස්කෑන් යන්ත්‍ර 04 ක් ඌන උපයෝජිතව පැවතුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් අංශ අසූහතකට (87) අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයට අදාළ නිම කර තිබූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති වත්කම්**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 36' X 15' ප්‍රමාණයේ ඉඩමක් ලබා දී තිබුණි.

**(ඈ) ජංගම නොවන වත්කම්**

**-------------------------**

ජංගම නොවන වත්කම් වාර්තාගත කිරීම හා වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මුදල් රෙගුලාසි 802(3) ප්‍රකාරව හා 2009 ජුනි 08 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 4.2 ඡේදය පරිදි වාහන පිළිබඳ සියළු තොරතුරු වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත් එසේ සටහන් කර නොතිබුණි.

(ii) නව රේගු ගොඩනැගිල්ලට පැරණි රේගු ගොඩනැගිල්ලේ සිට රැගෙන ආ භාණ්ඩ පිළිබඳව විස්තර ඇතුළත් ලිපිගොනු කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වසර 01 ට අඩු බැරකම් රු.167,338,727 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 නොවැම්බර් 04 දිනැති අංක 231/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.11 ඡේදය පරිදි 2013 වර්ෂයේ අවසානයේ පියවීමට අදාල බැරකම් ලෙස රු.167,338,727 ක් දක්වා තිබුණත්, 2014 වර්ෂයේදී එම බැරකම්වලට අමතරව රු.193,430,043 ක 2013 වර්ෂයේ බැරකම් නිරවුල් කර තිබුණි.

(ii) සැපයුම් හා සේවා වියදම් සම්බන්ධයෙන් බැරකම්වලට එළඹීමේදී මුදල් රෙගුලාසි 94(2) පටහැනිව 247-1-1-1403 වැය විෂය වෙනුවෙන් සීමාව ඉක්මවා රු.9,562,102 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 12.6 අනුකූල නොවීම්

--------------------

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය. | අවස්ථා 23 කදී රු.25,000 ක ට වැඩියෙන් කළ ගෙවීම් සඳහා රු.25 ක් බැගින් වූ මුද්දර ගාස්තු අය කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය | විධිමත් අනුමැතියකින් තොරව නිලධාරියෙකුට වසර 05 කට වැඩි කාලයක් සඳහා නිල නිවාසයක් ලබා දී තිබුණි |
| (ii) XIX වැනි පරිච්ඡේදයේ 6.3 සහ 6.14 වගන්ති | 2011 මාර්තු මාසයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකු නිල නිවාසය භාර දී නොතිබුණ අතර එම නිලධාරියාගේ සොහොයුරිය අනවසරයෙන් එම නිල නිවාසයේ පදිංචි වී තිබුණි. 2013 ජනවාරි මාසයේදී විශ්‍රාම ගිය තවත් නිලධාරියෙකු 2013 මැයි මාසය දක්වා කුලී ගෙවීමකින් තොරව නිල නිවාසයේ පදිංචිවී තිබුණි. |
| (iii) XIX වැනි පරිච්ඡේදයේ 6.10 වගන්තිය | 2012 සැප්තැම්බර් මාසයේදි මිය ගිය නිලධාරියෙකුගේ නමින් 2013 අප්‍රේල් මාසය දක්වා නිල නිවාසය පරිහරණය කර භාරදී තිබුණු අතර එම කාලය සඳහා නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |
| (iv) XIX වැනි පරිච්ඡේදයේ 7.2 වගන්තිය | නිල නිවාස 02 ක් සඳහා හිඟ නිවාස කුලී වශයෙන් රු.153,110 ක් හා ඉන් එක් නිල නිවාසයක් සඳහා හිඟ දණ්ඩන කුලී රු.27,802 ක්ද අයකර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | XIX වැනි පරිච්ඡේදයේ 9.1 වගන්තිය | නිල නිවාසවල අනවසරයෙන් පදිංචිව සිටි නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් එකී වගන්තියේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (vi) | XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය | නියෝග නිකුත් කරන අවස්ථාවේදී මූලික විමර්ශනය නිම කළ යුතු කාලය නියම කළ යුතු වුවත්, එසේ නොකළ අවස්ථා 08 ක් විය. |
| (vii) | XLVIII වැනි පරිච්ඡේදයේ 13.12 වගන්තිය සහ 22.1 වගන්තිය | නියමයන්ට අනුව කටයුතු නොකළ අවස්ථා 11 ක් විය. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 2011 දෙසැම්බර් 30 දිනැති අංක 06/2004 (1) දරන චක්‍රලේඛය | චූදිත නිලධාරියෙකුට චෝදනා පත්‍රයක් නිකුත් කර වසරක් ඇතුළත පරීක්ෂණය නිම කිරීමට විනය බලධාරියා අවශ්‍ය පියවර ගත යුතු වුවත්, එසේ කර නොමැති අවස්ථා 02 ක් විය. |

**(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

| | |
|---|---|
| 5.6 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණු අවස්ථාවක් පැවතුණි. |

## 12.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**(අ) ගැළපුම් කළ යුතු ශේෂ**

ශ්‍රී ලංකා රේගුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැළපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැළපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවූ තැන්පතු | - | 4,166,667 | - | 4,166,667 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 18,303 | - | - | 18,303 |
| හඳුනානොගත් බැර ශේෂ | - | - | 4,166,667 | 4,166,667 |

(i) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.18,303 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ දෙකක් ඉක්මවූ රු.4,166,167 ක් වූ චෙක්පතක්, උපලබ්ධි නොවූ ලැබීම් ලෙස හා හඳුනානොගත් ලැබීම් ලෙස වාර්තා කර තිබුණි. ඒ සම්බන්ධ නිවැරදි ගිණුම් පරිපාටි අනුගමනය කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 396(ආ) ප්‍රකාර ගෙවීමට තිබෙන සෑම චෙක්පතක්ම වලංගු කාලය අවසන් වූ විට එය නැවත වලංගු කිරීම සඳහා එවන මෙන් හැකි ඉක්මනින් ආදායකයාට ලියා දැන්විය යුතු වුවත්, කාලය ඉකුත් වූ චෙක්පත් සම්බන්ධව එවැනි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) චෙක්පත් භාරදීමේ ලේඛනය චෙක්පත් අංක අනුපිළිවෙලට පවත්වා නොතිබුණි. මේනිසා බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වලින් අදාල පාර්ශවයන් විසින් භාර නොගත් චෙක්පත් පිළිබඳ තොරතුරු නිවැරදිව හඳුනා ගැනිමට නොහැකි විය.

(v) රේගු නිලධාරීන්ට ත්‍යාග ගෙවීම් සඳහා වූ චෙක්පත්, චෙක්පත් භාරදීමේ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(vi) අනුක්‍රමික අංක අනුව චෙක්පත් නිකුත් විය යුතු අතර එසේ නිකුත් වන චෙක්පත්, මුදල් පොතේ අනුක්‍රමිකව වාර්තා විය යුතු වුවත් එසේ චෙක්පත් අංක පිළිවෙලට අනුක්‍රමිකව වාර්තා නොවූ අවස්ථා පැවතුණි.

(vii) මුදල් රෙගුලාසි 386 (3) ප්‍රකාරව ලියනු ලබන සෑම චෙක්පතකම උප පත්‍රිකාවෙහි වවුචර් අංකය සඳහන් කර නොතිබුණි.

## 12.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගිණුම් අංශයේ වැටුප් සාරාංශ සකස් කිරීමේ නියුක්තව සිටි නිලධාරියෙකු විසින් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ රු.26,150,604 කට ආසන්න රජයේ මුදල් වංචා කර තිබුණි. ඒ පිළිබඳ අදාල පරීක්ෂණ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී වැටුප් ගෙවීම සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර නොතිබීම, වැටුප් ගෙවීමේ නිරවද්‍යතාවය පිළිබඳව සන්නිරීක්ෂණය නොකිරීම සහ වර්ෂ 05 කට ආසන්න කාලයක් වැටුප් ගෙවීම් සම්බන්ධ දත්ත පරිගණකගත කිරීමේ කාර්යයෙහි එකම නිලධාරියෙකු නියුක්ත කර තිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. විගණනය සඳහා ඉල්ලා තිබූ ඉහත වංචාවලට අදාල මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) සම්බන්ධ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, වංචාවන්ට අදාල මුදල් ආපසු අයකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ගද වාර්තා කර නොතිබුණි.

(ආ) රේගු නිලධාරීන් දෙදෙනෙකු 2013 මාර්තු හා අප්‍රේල් මාසවලදී විදේශ ගතවී සිටි කාලය සඳහා රු.15,558 ක අතිකාල දීමනා ලෙස ලබාගෙන තිබුණි.

## 12.9 පාඩු හා හානි

--------------

වාහන දෙකක් අනතුරට පත්වීම හේතුවෙන් සිදුවූ එකතුව රු. 25,736 ක් වූ අලාභය වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 12.10 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළැඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) නියමිත කාල සීමාව තුළදී විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් රු.999,323 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි.

(ආ) පත්වීම් භාරදීමට පෙර පුහුණුව ලද රේගු නියාමක තනතුරක් සඳහා තෝරාගත් අයදුම්කරුවකු පත්වීම් භාර නොගැනීම හේතුවෙන් එම නිලධාරියා බඳවා ගැනීමට හා පුහුණු කිරීමට දැරූ රු.43,684 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## 12.11 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ගබඩා පරිගණක පද්ධතිය සහ ගබඩාවේ තොග පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ආ) භාණ්ඩ මිලට ගැනීමේදී තොග මට්ටම් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු අතර තොග පාලනය සඳහා වූ පරිගණක මෘදුකාංගය අක්‍රියව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පළමු මාස 06 තුළ නිලධාරීන් හැත්තෑ දෙදෙනෙකුගේ විදේශ ගමන් තිස්හතරක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් හා කළමනාකරණ හා වන්දි අරමුදලෙන් එකතුව රු. 23,661,267 ක් වැය කර තිබුණි. එම විදේශ ගමන්වලට වැය කළ මුදල හා එමගින් අත් කරගත් ප්‍රතිලාභ පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණි. එසේම, විදේශ පුහුණුව සඳහා සහභාගි

වූ සමහර නිලධාරීන් එම පුහුණුව පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකළ අවස්ථාද, විදේශ ගත වූ දිනය හා වේලාව ශ්‍රී ලංකාවට පැමිණි දිනය හා වේලාව තහවුරු කර ගැනීමට විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් ලිපිගොනුවට ඇතුළත් කර නොතිබුණු අවස්ථාද පැවතුණි.

(ඇ) තක්සේරු දෙපාර්තමේන්තුවේ මාසික කුලී තක්සේරුවට අනුව රේගු නිලධාරීන් සඳහා යාපනයේ ස්ථානයක ලබාගත් නිවාසයේ මාසික කුලිය රු.20,000 ක් වුවද, නිවාස හිමියා සමඟ එළඹ තිබූ කුලී ගිවිසුම අනුව රු.25,000 ක් හා වාර්ෂිකව සියයට 5 බැගින් කුළිය වැඩිවන පරිදි ගෙවීම් කිරීමට එකඟව 2011 පෙබරවාරි 01 දිනයේ ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ බදු කුලිය ලෙස මාසිකව රු.27,560 බැගින් ගෙවා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රේගුවට අයත් යාපනයේ රේගු කාර්යාලය පිහිටා තිබූ ඉඩම මිනුම්කර සැලැස්ම සකස් කිරීම සඳහා 2013 අගෝස්තු 30 දින රු.111,542 ක් යාපනය මිනින්දෝරු අධිකාරි වෙත ගෙවා තිබුණද ඉඩම මිණුම් කර සැලැස්ම පිළියෙල කර ඇති බවට විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ඊ) නව රේගු මූලස්ථානයට ගෘහභාණ්ඩ සැපයීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ලංසු කැඳවීමේ අවසාන දිනය 2011 මැයි 09 දින වුවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශවලට පටහැනිව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම මාස 15 කට පසු එනම් 2012 සැප්තැම්බර් 12 දින සිදු කර තිබුණි. ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරුන් විසින් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි ප්‍රගතිය නියාමනය කිරීමට හා සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ලංසුවල වලංගු කාලය දින 120 ක් වුවද සැපයුම් කරුවකු තෝරා ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත කිරීම නිසා අවස්ථා 05 කදී ලංසුවල වලංගු කාලය දීර්ඝ කිරීමට සිදුවී තිබුණි. ආයතන 04 ක් විසින් වලංගු කාලය දීර්ඝ නොකර කොන්ත්‍රාත්තුවෙන් ඉවත්වී තිබුණි. එම හේතුවෙන් එක් එක් ලී බඩු අයිතමයන් සඳහා මනා තරඟකාරිත්වයකින් තොරව කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි.

(iii) ගබඩා පහසුකම සැපයීමේ කොන්ත්‍රාත්තුව (Storage Facilities Compact Storage and Lockers) සඳහා ලංසු ලේඛන ඉදිරිපත් කර තිබුණු පුද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කළ පිරිවිතරයන් අනුමත පිරිවිතරයන්ට අනුකූල නොවීම නිසා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මුල් අවස්ථාවේදීම එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණද, නැවත එම ආයතනයටම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබුණි.

(iv) රාජ්‍ය සංස්ථාවක වාර්තාවකට අනුව කොන්ත්‍රාත්තුව සඳහා තාක්ෂණ හා මූල්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබූ පුද්ගලික සමාගමක මූලික ලංසු ලේඛන සඳහා වලංගු කාලය දින 120 ට පසුවත් අවස්ථා 3 ක් දක්වා වලංගු කාලය දීර්ඝ කර තිබුණි. ඒ වන විටත් සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම නිසා එම සමාගම ප්‍රසම්පාදනයෙන් ඉවත්වීම හේතුවෙන් ඊට පසු

සුදුසුකම් ලැබූ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීම මත රු.44,462,794 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(v) ගෘහභාණ්ඩ සැපයීමේ කොන්ත්‍රාත්තුවට ලංසු ඉදිරිපත් කිරීම සඳහා සැපයුම්කරුවන්ට තිබිය යුතු පශ්චාත් සුදුසුකම් උපමානයන් පිළිබඳ පුවත්පත් දැන්වීම් මගින් ප්‍රචාරණය කර තිබුණි. පශ්චාත් සුදුසුකම් උපමානවලට ප්‍රමාණවත් ලෙස සුදුසුකම් සපුරා නොතිබුණු ආයතන ඉදිරිපත් කළ ලංසු ලේඛන ප්‍රතික්ෂේප නොකර ඇගයීමටද එම ආයතනවලට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමටද කටයුතු කර තිබුණි.

(vi) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවසන් ඇගයීම අනුව විධායක කාර්ය මණ්ඩලය සඳහා වූ ලී බඩු දේශීය නිෂ්පාදනයන් විය යුතු බව දැක්වුවද, සපයා තිබූ ලී බඩු දේශීය වශයෙන් නිපදවා නොතිබුණි.

(උ) රේගුවේ ආපනශාලාව සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව සිදුකළ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා විශේෂඥ දැනුමක් ඇති නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුව සැපයුම්කරුට නොමිලේ සපයන ආපනශාලා පරිශ්‍රය, ලී බඩු, මුළු තැන්ගෙයි උපකරණ, පිඟන් කෝප්ප, විදුලිබලය හා ජල සැපයුම යන පහසුකම් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමක් කර ප්‍රධාන ආහාර වේල්වල ඇස්තමේන්තු මිල ගණන් සකස් කර එම මිල ගණන් පදනම් කරගෙන ඉදිරිපත් කර තිබුණු ලංසු ඇගයීමට කටයුතු කර නොතිබුණි.

**12.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 343 | 304 | 39 |
| (ii) | තෘතියික මට්ටම | 1,876 | 1,218 | 658 |
| (iii) | ද්විතියික මට්ටම | 237 | 237 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 488 | 311 | 177 |
| | **එකතුව** | **2,944** | **2,070** | **874** |

2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 874 ක් පැවතුනි.

## 13. ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව

### 13.1 විගණන විෂය පථය

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 මාර්තු 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 13.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 13.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඌ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 13.4 සිට 13.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| මෝටර් වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1647 (ඉ) |
| පරිගණක හා පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ආදායම් ලේඛන / ආදායම් වාර්තා | මුදල් රෙගුලාසි 175 (1) (ආ) |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 272(3) ප්‍රකාරව එකතුව රු.176,710 ක් වූ ගෙවීම් වවුචර් 04 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගාස්තු ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විසර්ජන ගිණුමෙහි දැක්වෙන රු.18,129,743 ක බැරකම් විගණනයේදී සනාථ කර ගැනීමට නොහැකි විය.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2015 ජනවාරි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තු පොත් අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.109,669,060 ක අග්‍රිම භාණ්ඩාගාරයට පියවිය යුතුව තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රේෂණය කර තිබුණු රු. 85,176,353 ක් භාණ්ඩාගාර පොත්වල ගලපා තිබුණේ මාස 09 ක ප්‍රමාදයකින් පසුව එනම්, 2014 සැප්තැම්බර් මාසයේදීය.

(ii) විධිමත් අනුමැතියක් රහිතව රු.7,500 ක සීමාව ඉක්මවා රු.50,000 හා රු.60,000 සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

2013 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/000/0015/0128/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.80,485,775 ක් වූ අතර, එම තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් කේවල ශේෂ ලේඛන හා කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඊ) ආදායම් ගිණුම්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අංක 10.02.04.01 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 1,527ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම් මාස 06 සිට වර්ෂ 15 ක් අතර කාල පරාසයක සිට පැවැත එන නමුත් එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) ස්ප්‍රීතු දේශීයව මිලදී ගැනීමේදී හා ආනයනයේදී අය කරනු ලබන රඳවා ගැනීමේ බදු මුදල්, එම ස්ප්‍රීතු යොදා ගනිමින් නිෂ්පාදනය කළ මත්පැන් සඳහා අදාල සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට ඉඩ දී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට නිෂ්පාදනයට යොදා නොගත් ඉතිරි ස්ප්‍රීතු තොගයට අදාල හිලව් කිරීමට ඉඩදෙනු ලබන රු.762,458,068 ක් රඳවා ගැනීමේ බදු මුදල් ඉදිරි වර්ෂයේදී සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් සළකා 10.02.04.01 දරන ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(iii) දුම්කොළ බදු ආදායම (10.02.06.00) යටතේ ගිණුම්ගත කළයුතු එකතුව රු.2,007,948 ක් සුරාබදු ආදායම (10.02.04.01) යටතේ ගිණුම්ගත කර තිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**---------------------------------------------------------------------**

විෂය අංක 24801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,933,571 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**13.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, 2013 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සියළුම අංශ ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**13.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**13.5.1 නිෂ්කාර්ය වත්කම්**

**--------------------**

2010 දෙසැම්බර් මාසයේදී මිලදී ගන්නා ලද රු.331,272 ක් වූ විධායක පුටු 15 ක්, ඇඳි පුටු 50 ක්, කබඩ් 02 ක් හා මේස 02 ක් 2013 වර්ෂයේ කළුතර සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කරන තුරු, එම ගොඩනැගිල්ල තුළ නිෂ්කාර්යව පැවතුණි.

**13.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ සියලුම භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 දෙසැම්බර් 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව 2014 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**13.6 අනුකූල නොවීම්**

**------------------**

**(අ) නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(i) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| • 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනත | මත්පැන් බද්ද නියමිත දිනයේදී නොගෙවීම මත අය කරනු ලබන ප්‍රමාද ගාස්තු, සුරාබදු ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, එකතුව රු.14,018,503 ක්වූ ප්‍රමාද ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 20.03.02.99 (විවිධ) දරන ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි. |
| • 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු තැගි අරමුදලක් ස්ථාපිත කළ යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| • මුදල් රෙගුලාසි 85(2)(ආ) | ආදායම් ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය වන්නේනම්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඊට හේතු සහිතව ඒ බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 110(2) | ගණන්දීමේ නිලධාරියා මුදල් වර්ෂයේදී සිදුවූ සියලුම හානි පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු දෙකක් හෙළිදරව් කර නොතිබුණු අතර, අලාභයද තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 272(1) | තැගි අරමුදලින් කරනු ලබන ගෙවීම්වලට අදාල වවුචර් වෙනම ගොනුකර නොතිබුණි. |
| • මුදල් රෙගුලාසි 316 | බලපත්‍ර පොත්, කුවිතාන්සි පොත්, උප පත්‍රිකා පොත් හා මූල්‍ය වටිනාකමක් ඇති වෙනත් පෝරම සේප්පු හා ආරක්ෂක පෙට්ටි ආදියේ තැන්පත් කොට තැබිය යුතු වුවත්, මෙම ලේඛන ලේඛණාගාරය තුළ ආනාරක්ෂිතව ගබඩාකර තිබුණි. |
| • මුදල් රෙගුලාසි 342 | උප පත්‍රිකා පොත් ලබාගන්නා දෙපාර්තමේන්තුව එම පොත් සුරක්ෂිත භාරයේ තබා ගැනීමත් ඒවා නිසි පරිදි පරිහරණය කිරීමත් ගැන වගකිව යුතු වුවත්, එවැනි වගකීමකින් උපපත්‍රිකා පොත් පරිහරණය කර නොතිබුණි. |

- මුදල් රෙගුලාසි 371(2) — මාණ්ඩලික නොවන නිලධාරියෙකුට අවස්ථා හයකදී එකතුව රු.56,980 ක තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.
  අවස්ථා 4 කදී ලබා දුන් තත් කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී සති 02 සිට මාස 2 1/2ක් අතර කාල ප්‍රමාදයකින් පසුව එම අතුරු අග්‍රිම නිරවුල් කර තිබූ අවස්ථා 4 ක් විය.

- මුදල් රෙගුලාසි 371(2)(ආ) — එක් අවස්ථාවකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමයක වටිනාකම රු.20,000 ක් වුවත්, ඊට පටහැනිව අවස්ථා 04 ක දී එකතුව රු.111,298 ක් වූ අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

- මුදල් රෙගුලාසි 447 (7) — දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලැජරයේ ගිණුම් එක් එක් මාසයේ අවසාන දිනයට තුලනය කළ යුතු වුවත්, වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

- මුදල් රෙගුලාසි 756 — දෙසැම්බර් 15 දින වන විට හෝ ඒ ආසන්න දිනයකදී සමීක්ෂණ මණ්ඩල පත් කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි.

- මුදල් රෙගුලාසි 1646 — සෑම මාසයකම දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

---------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

(i) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වගන්තිය හා ඊට අදාල සංශෝධනයන්ට අනුව යම් ආයතනයකට ලැබෙන සැපයුම් හා සේවා වටිනාකම කාර්තුවට රුපියල් මිලියන 3 ක් හෝ වර්ෂයකට රුපියල් මිලියන 12 ක් හෝ ඊට වැඩි වන්නේ නම්, එකතු කළ අගය මත බදුවලට අනිවාර්යෙන්ම ලියාපදිංචි විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

(ii) 2010 පෙබරවාරි 12 දිනැති අංක 912 දරන සුරාබදු නිවේදනය අනුව අයවීමට නියමිත දිනයේදී බදු නොගෙවන බලපත්‍රධාරියෙකු ඒ බදුවලට අමතරව ගාස්තුවක් වශයෙන් ඒ බද්ද මත මාසයකට සියයට තුන බැගින් වූ අධිභාරයක් ගෙවීමට යටත් වුවත්, දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාද වන දින ගණන මත

අධිභාරයක් අයකර තිබුණි. මේ හේතුවෙන් සුරාබදු නිවේදනය අනුව අධිභාරය ගණනය කළ යුතු ආකාරය හා දෙපාර්තමේන්තුව අධිභාර අයකරනු ලබන ආකාරය අතර පරස්පරතාවයක් පැවතුණි.

**13.7 කාර්යසාධනය**

---------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) සුරාබදු බලපත්‍ර ලිපිගොනු විධිමත්ව පවත්වා නොතිබීම.**

-------------------------------------------------------------

එක් එක් සුරාබදු බලපත්‍රය සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක වු දා සිට සියලු තොරතුරු ලිපිගොනුවේ ඇතුළත් විය යුතු වුවත්, ඇතැම් ලිපි ගොනුවල පහත සඳහන් තොරතුරු ඇතුළත් කර නොතිබු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වීය .

(i) ස්ථාන මාරු කිරීම
(ii) බලපත්‍රධාරියා මාරුවීම
(iii) ඇප මුදල් තැන්පත් කිරීමට අදාල ලියකිවිලි
(iv) සිදුකරන ලද කාර්මික අපරාධවලට අදාල තොරතුරු

**(ආ) සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබීම**

-------------------------------------------------------------------------------------

සුරාබදු බලපත්‍ර සම්බන්ධව තොරතුරු පද්ධතියෙන් පහත සඳහන් තොරතුරු ලබා ගැනීමේ හැකියාව නොතිබුණි.

(i) බලපත්‍ර ස්ථානය ආරම්භ කළ දිනය
(ii) ගෙවා ඇති ඇප තැන්පතු මුදල්
(iii) බලපත්‍ර ස්ථානය වෙනස්වීම්වලට අදාල තොරතුරු
(iv) බලපත්‍රධාරියා වෙනස්වීමට අදාල තොරතුරු
(v) බලපත්‍රධාරියා හෝ බලපත්‍ර ස්ථානය වෙනස්වීමකදී ගෙවා ඇති මුදල

**13.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------

බැංකු ගිණුම වෙත සෘජුව බැර කරනු ලබන මුදල් හඳුනාගෙන අදාල ආදායම් සංකේතවලට ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.43,989,776 ක ශේෂයක් හඳුනා නොගත් තැන්පතු ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

**13.9 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

කළුතර සුරාබදු කාර්යාලයේ 2014 පෙබරවාරි 06 දින සිදු කරන ලද සුළු මුදල් පරීක්ෂාවේදී රු.10,572 ක මුදල් හිඟයක් අනාවරණය විය.

**13.10 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් සිදු වූ හානිය තක්සේරු කර විසර්ජන ගිණුමෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) වාහන දෙකකට සිදුවී තිබුණු අලාභහානිය රු.93,843 ක් අඩුවෙන් විසර්ජන ගිණුමෙහි දක්වා තිබුණි.

**13.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සුරාබදු නිවේදන අංක 937 ට අනුව මත්පැන් අපනයනකරුවන්ට අපනයනයෙන් දින 30 ක් ඇතුළත අදාල ලියකියවිලි ඉදිරිපත් කිරීම මත බදු සහන ලබා දිය හැකි වුවත්, නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි දින 30 ක් ඉක්මවීමෙන් පසුවද නිෂ්පාදන ආයතන 03 කට එකතුව රු.11,728,950 ක බදු සහන ලබා දීමට කටයුතු කර තිබුණි.

(ආ) කළුතර සුරාබදු ස්ථානයේ කාර්මික අපරාධ වාර්තා ලේඛනයට අනුව 2009, 2010, 2011 හා 2012 වර්ෂවල නොවිසඳී ඇති කාර්මික අපරාධ 54 ක් පැවතුණි.

13.12 **මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 37 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 379 | 308 | 71 |
| (iii) | ද්විතියික මට්ටම | 856 | 575 | 281 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 129 | 126 | 03 |
| | එකතුව | 1,421 | 1,046 | 375 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 375 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) නිවාඩු ලේඛන**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛන ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම හා නිවාඩු පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ii) නිලධාරියෙකු එක් දෙපාර්තමේන්තුවක සිට තවත් දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරු කිරීමේදී ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයෙහි 1.9 වගන්තියට අනුව එම මාරු කරනු ලැබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නව දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිලධාරින්ගේ නිවාඩු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ස්ථානමාරු වී පැමිණි නිලධාරින්ගේ එම තොරතුරු නිවාඩු ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 14. ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**------------------------------------------------------------**

### 14.1 විගණන විෂය පථය

**---------------------**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 23 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 14.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

**------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා

ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**14.3 විගණන නිරීක්ෂණය**

----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 14.4 සිට 14.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 06 ක් සඳහා සළසා තිබූ එකතුව රු.198,464,300,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.158,086,618,997 ක් උපයෝජන කිරීමෙන් පසුව රු.40,377,681,003 වූ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 92 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව යටතේ වූ ආදායම් සංකේත 13 කට අදාළව සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම අතර වෙනස්විම සියයට 1 සිට සියයට 186 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) ඉදිරිපත් කළ ආදායම් ගිණුම් 06 කට අනුව එකතුව රු.7,785,283,388 ක ආදායම් හිඟහිට තිබුණි. එම හිඟහිටි ආදායම් වර්ෂ 1 සිට වර්ෂ 3 ක් අතර කාල පරාසයකට අදාල විය.

(iii) ආදායම් සංකේත 20.02.01.99 දරන අනෙකුත් කල් බදු කුලී ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේදී රැස්කළ ආදායම ලෙස රු.1,492,058 ක් දක්වා තිබුණත්, වැරදි බැරකිරීම් නිවැරදි කිරීමට 2014 සැප්තැම්බර් 03 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) ආදායම් සංකේත 20.02.02.01 දරන පොලිය - ණය දීම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රාජ්‍ය සංස්ථා මගින් අය විය යුතු රු.1,987,890 ක් වූ හිඟ ණය පොලී අය කර ගැනීමට හැකියාවක් නොමැති බව විගණනය වෙත දන්වා තිබුණි.

(v) ආදායම් සංකේත 20.02.02.01 දරන පොලිය - ණය දීම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන දිනට සංගමයකින් අය විය යුතු රු.2,814,034 ක් වූ හිඟ පොලී අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(vi) ආදායම් සංකේත 20.06.04.00 දරන ණය ආපසු අයකර ගැනීම් ගිණුමට අදාළව රාජ්‍ය සංස්ථාවකින් අයවිය යුතු රු.773,340,000 ක හිඟ ණය ශේෂය අය කර ගැනීමට හැකියාවක් නොමැති බව වාර්තා කර තිබුණි.

(vii) රජයට අයත් සංගමයකට, සංස්ථාවකට හා සමාගමකට එකතුව රු.147,714,479 ක් වූ හිඟ ණය ශේෂයන් අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව විගණනයට වාර්තා කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24901 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.149,251 ක් විය.

## 14.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 දෙසැම්බර් 31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2014 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රජය විසින් ආයෝජනය කර තිබුණු කොටස් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) වසර 50 කට වඩා පැරණි සමාගම් කොටස් සහතිකවල ආරක්ෂාව, පැවැත්ම, වර්තමාන වටිනාකම සහතික කර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ii) සුරක්ෂිතාගාරයේ ඇති සමාගම් කොටස් සහතික පත් 218 න් සහතික පත් 21 ක් ජනරජයේ මූල්‍ය ප්‍රකශනවලට ගෙන නොතිබුණි.

(iii) භෞතික සත්‍යාපනයේදී අනාවරණය වූ සමාගම් කොටස් සහතිකවල කොටස් ප්‍රමාණය සහ නාමික වටිනාකම්, ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් උපලේඛනයේ සඳහන් කොටස් ප්‍රමාණයෙන් නාමික වටිනාකම් අතර නොසැසඳීම් අනාවරණය විය.

(iv) ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සමාගම් 53 ක, මිලදී ගන්නා ලද කොටස් ප්‍රමාණයන්ගේ විස්තර භෞතිකව පරීක්ෂා කර සමීක්ෂණ මණ්ඩල වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

**14.5 කාර්යසාධනය**

අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම සඳහා බලයදීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, 1997 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා, දෙපාර්තමේන්තුවකට, අමාත්‍යාංශ 02 කට සහ කොමිෂන් සභාවකට ලබා දුන් රු. 1,945,933,340 ක් වූ අග්‍රිම ශේෂ 10 ක් නිරවුල් කිරීම වසර 01 සිට වසර 16 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

**14.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 15 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතීක මට්ටම | 82 | 70 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 18 | 18 | - |
| | **එකතුව** | **122** | **104** | **18** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට සේවක මණ්ඩලයේ පුරප්පාඩු 18 ක් පැවති අතර මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි තනතුරු 06 ක් ඇතුළත්ව තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව, වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය 123 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් තනතුරු 01 ක වෙනසක් පැවතුණි.

(ඇ) එම කාර්යසාධන වාර්තාව අනුව, වර්ෂය අවසානයට පහත සඳහන් තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලයට වඩා නිළධාරීන් 09 ක ගේ අතිරික්තතා පැවතුණු අතර කාර්යය මණ්ඩල අවශ්‍යතා සළකා බලා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනිමට දෙපාර්තමේන්තුව ක්‍රියාකර නොතිබුණි.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය I | 05 | 08 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර I | 05 | 09 | 04 |
| කාර්යාල කාර්යය සහායක | 01 | 03 | 02 |
| **එකතුව** | **11** | **20** | **09** |

## 15. ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

### 15.1 විගණන විෂය පථය

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 18 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 15.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

### 15.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සහ පොත් අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 15.4 ඡේදයේ සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25001 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවීම් හිඟහිටි තිබුණ ශේෂවල එකතුව රු.301,936 ක් වූ අතර, එම හිඟහිටි ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) වාණිජ නොවන අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 25003 දරන විවිධ අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 13 ක් සඳහා වී මිලදී ගැනීමට, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා දෙපාර්තමේන්තුවක් වෙත 2001 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා අවස්ථා 15 කදී ලබා දී තිබුණු අත්තිකාරම්වලින් 2013 දෙසැම්බර් 31 දින වනවිට නොපිය වූ අත්තිකාරම් ශේෂය රු.468,267,162ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි නිරවුල් නොකළ ශේෂය රු.454,991,711 ක නියෝජනයක් වී තිබුණි.

(ii) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු වී මිලදී ගැනීම සඳහා වූ අත්තිකාරම්වලින් 2013 දෙසැම්බර් 31 දින වන විට විවිධ සේවා සමුපකාර සමිතියක් වෙත ලබා දී තිබුණු රු.5,023,818 ක මුදල එම සමිතිය ඈවර කිරීමෙන් පසුව පියවන බව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා තිබුණද එසේ කටයුතු කර නොතිබුණි. ගොවි සමාගමකින් අයවිය යුතු රු.480,000 ක අත්තිකාරම් හා සමුපකාර සංගමයකින් අයවිය යුතු රු.4,264,300 ක අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කර තිබුණද, එම අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(iii) ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සතොස ආයතනයෙන් අයවිය යුතු රු.1,652,916 ක මුදල කපා හැරීමට 2013 දෙසැම්බර් 27 දිනැති අංක SA/ACCTS/04/7000/422 දරන ලිපියෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා තිබුණත්, 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අත්තිකාරම් මුදලින් වී මිලදී ගත් සමුපකාර සමිතියක් විසින් මිලදී ගත් වී සහල් බවට පත් කර රජයේ අනුමත මිලට වඩා අඩුවෙන් විකිණීම නිසා ඇති වී තිබුණු පාඩුව රු.8,757,384 කි. මෙම පාඩුව අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට හෝ ගිණුම්වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iv) මහවැලි අමාත්‍යාංශය විසින් වී මිලදී ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල රු.3,605,525 ක් ගෙවා ඇති බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 මැයි 25 දිනැති අංක SA/ACCTS/04/7000/431 දරන ලිපියෙන් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත දන්වා යවා තිබුණද, එම ශේෂය නිවැරදි බවට අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් සනාථ කර නොතිබුණි. මෙම අත්තිකාරම් කාර්ය යටතේ මහවැලි අමාත්‍යාංශයට පියවිය යුතු රු.3,605,525 ක මුදල පියවා නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 106 ප්‍රකාරව නැතිවූ මුදල් , මුද්දර හා ටිකට්පත් ආදිය සඳහා රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත ලබා දී තිබුණු රු.10,096,624 ක අත්තිකාරම්වලින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අත්තිකාරම් රු.2,442,080 ක් රෙගුලාසි 109 ප්‍රකාර කටයුතු කර කපා හැරීමට නියෝග ලබා ගෙන ඒ සඳහා ප්‍රතිපාදන සළසා ගෙන තිබුණද,

එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන 2013 දෙසැම්බර් 31 දින වන විටත් අත්තිකාරම් පියවීමට කටයුත කර නොතිබුණි.

**15.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 08 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 34 | 29 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 08 | 07 |
| | එකතුව | 69 | 47 | 22 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 22 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**16. ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**

**16.1 විගණන විෂය පථය**

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 05 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබි ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**16.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

## 16.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා හා පොත් අනුව, තක්සේරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 16.4 සිට 16.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) පොදු තැන්පත් ගිණුම

2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙක ඉක්මවූ රු.14,283 ක තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### (ආ) ආදායම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ආදායම් ගිණුමට අනුව, එකතුව රු.391,348,397 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 06 ක් අතර කාල පරාසයකට අදාල විය.

(ii) මුදල් රෙගුලාසි 128(2)(ඇ) පරිදි ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින්, එම රාජ්‍ය ආදායමේ කොටස් වෙනත් කාර්යාල මගින් එකතු කරනු ලබන්නේ නම්, එම කාර්යාලවලින් වාර්තා ලබා ගෙන එම තොරතුරු රාජ්‍ය ආදායම් ගිණුම්වල හා වාර්තාවල අන්තර්ගත කළ යුතු වුවත්, පළාත් කාර්යාල කීපයකින් පමණක් මාස කීපයකට අදාලව වාර්තා කැඳවා තිබුණි. සියළුම පළාත් කාර්යාලවලින් ආදායම් වාර්තා ලබාගෙන මුදල් රෙගුලාසි 128(2)(උ) පරිදි භාණ්ඩාගාරයේ ගිණුම් සමඟ සැසඳිය යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

### (ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 25101 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.706,378 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනිමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිට තිබූ මුළු ණය ශේෂ වටිනාකමින් සියයට 91 ක් එනම් රු.639,852 ක් වර්ෂ 1 කට වඩා වැඩි ශේෂ වූ අතර මුළු හිඟ හිටි ණය ශේෂ වටිනාකමින් සියයට 30 ක් එනම් රු.214,669 වර්ෂ තුන ඉක්මවූ ණය ශේෂ විය.

(iii) ණයදීම් සම්බන්ධයෙන් වූ විධිවිධානයන් ප්‍රකාරව පවත්වාගත යුතු සී.සී.10 ලේඛන සහ ස්ථාන මාරුවී පැමිණි, ස්ථාන මාරු වී ගිය, වැඩ තහනම් කළ, සේවය අතහැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ සම්බන්ධ ලේඛනය යාවත්කාලිනව පවත්වා නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 427 ප්‍රකාර දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි.

**16.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**16.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා**

--------------------------------

2002 සැප්තැම්බර් 12 දින දරන අංක 402 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා 2004 පෙබරවාරි 20 දින දරන අංක 402(1) රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ජුලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**16.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම පිළියෙල කර නොතිබුණි.

**16.5 වත්කම් කළමණාකරණය**

-----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත 2014 සැප්තැම්බර් 29 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ,යන්ත්‍රෝපකරණ,ගොඩනැගිලි හා ඉදිකිරිම්වල වටිනාකම පිළිවෙලින් රු.27,255,402, රු.16,711,508, රු.24,557,244 ලෙස දක්වා තිබුණද එම වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම අනුව 2013 වර්ෂයේ මිලදිගත් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වටිනාකම රු.5,972,347 ක් වූ අතර යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.475,002 ක් විය. කෙසේ නමුත් ස්ථාවර වත්කම් ලේඛනය අනුව වර්ෂය තුළ මිලදි

ගැනිම් ලෙස රු.306,242 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර හා රු.189,280 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍රය පමණක් දක්වා තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තු පරිශ්‍රය පිහිටි ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ රු.115,000,000 ක් ලෙස සටහන් කර තිබුණද, එය විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ (සටහන් අංක 1) ඇතුළත් කර නොතිබුණි. දෙපාර්තමේන්තුවට අයත් පිළිවෙලින් හෙක්ටයාර 0.071 ක් හා පර්චස් 70 ක් විශාල කතරගම හා නුවර සංචාරක බංගලා දෙක ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණද ඊට අදාල පිරිවැය එහි දක්වා නොතිබුණි. එසේම එම වත්කම් විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් ලෙස පවත්වා නොතිබිම හේතුවෙන් 2013 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.245,200,000 ක් වූ ඉඩම් සහ ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 16.6. අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 110 | හානි පිළිබද ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) **දෙපාර්තමේන්තු චක්‍රලේඛ** | |
| 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන ආදායම් රැස්කිරිම පිළිබද චක්‍රලේඛය. | රාජ්‍ය මුලාධාර මත යැපෙන ආයතන වලින් තක්සේරු ගාස්තු අය නොකළ යුතු වුවත් ඊට පටහැනිව තක්සේරු ගාස්තු ලෙස රු.4,452,598 ක් ඉහත සඳහන් ආයතනවලින් වලින් අයකර තිබුණි. |

## 16.7. කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබද නිරික්ෂණ පහත දැක්වේ.

**සැලැසුම් කිරිම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරිම**

පහත සඳහන් අවස්ථාවලදි ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ඉලක්ක කරා ළගා වී නොතිබුණු බව නිරික්ෂණය විය.

| | විස්තර | 2013 ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක (ඒකක) | 2013 තථ්‍ය කාර්යසාධනය (ඒකක) | ඉලක්ක කරා ලඟාවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ තත්ත්ව වාර්තා | 13,818 | 5,772 | 42 |
| (ආ) | ඉඩම් - විවිධ | 58,653 | 26,269 | 45 |
| (ඇ) | පෞද්ගලික දේපල කුලී තක්සේරු කිරීම | 6,851 | 6,247 | 91 |
| (ඈ) | ගොඩනැගිලි වර්පනම් තක්සේරු කිරීම | 1,676 | 1,317 | 79 |
| (ඉ) | විරෝධතා නැවත තක්සේරු කිරීම | 10,665 | 7,646 | 72 |

**16.8. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

දෙපාර්තමේන්තුවට අයත් බැංකු ගිණුමට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| (අ) උපලබ්ධි නොවූ තැන්පතු | 12,075 | 262,900 | 15,415 | 290,390 |
| (ආ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 81,694 | - | - | 81,694 |
| (ඇ) හඳුනා නොගත් හර | 199,334 | 12,120 | - | 211,454 |
| (ඈ) ප්‍රමාණවත් පියවර නොගත් අගරු චෙක්පත් | 12,075 | - | - | 12,075 |

**16.9 ආර්ථික නොවන ගනුදෙනු**

**මානව සම්පත් සංවර්ධනය- විදේශ පශ්චාත් උපාධි පාඨමාලාව (ආර්අයිසිඑස් )**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අපේක්ෂකයන් දස දෙනෙකු සහභාගී වී තිබූ අතර 1998 පෙබරවාරි 21 දිනැති අංක 05/1998 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පාඨමාලාව ආරම්භයේදී ගිවිසුමකට ඇතුළත් විය යුතු වුවත්, නිලධාරින් නව දෙනෙකු ප්‍රමාද වී ගිවිසුම්වලට එළඹී තිබූ අතර එක් නිලධාරියෙකු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ඉහත පාඨමාලාව හැදෑරීමට තෝරාගත් එක් නිලධාරියෙකු තව දුරටත් පාඨමාලාවට සහභාගි නොවන බවට දැනුම් දී තිබුණ නමුත් ඒ වන විටත් නිලධාරියා වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කර තිබූ ස්ටර්ලින් පවුම් 4,170 ක මුදල රජයට නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) 2012 සැප්තැම්බර් 13 දිනැති අංශ ප්‍රධානින්ගේ රැස්වීමේදි ඉහත පාඨමාලාවට අදාලව අසමත් වන විෂයයන් දෙකකට පමණක් දෙපාර්තමේන්තුව නැවත වරක් ප්‍රතිපාදන ලබාදෙන බවත්, විෂයයන් දෙකකට වඩා අසමත් වුවහොත් එම ගාස්තුව අදාල නිලධාරියා විසින් පුද්ගලිකව දැරිය යුතු බවත් තිරණය කර තිබුණද, ඊට පටහැනිව විෂයයන් දෙකකට වඩා අසමත් වූ නිලධාරින් තිදෙනෙකුට ස්ටර්ලින් පවුම් 1,735 ක් සමාලෝචිත වර්ෂයේදි නැවත ගෙවා තිබුණි.

**16.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 86 | 53 | 33 |
| (ii) | තෘතියික මට්ටම | 362 | 353 | 09 |
| (iii) | ද්විතියික මට්ටම | 144 | 106 | 38 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 90 | 80 | 10 |
| (v) | වෙනත් (අනියම් පදනම) | -- | 02 | -- |
| | **එකතුව** | 682 | 594 | 90 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව 90 ක් විය. ඉන් 33 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු විය.

## 17. ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### 17.1 විගණන විෂය පථය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 17.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 17.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 17.4 සිට 17.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) අයවැය විචලනය**

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.91,300,000 ක ශුද්ධ ප්‍රතිපාදන සළසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.80,818,379 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.10,481,621 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 96 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අංක 6000/0000/00/0015/0132/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.66,254,054 ක් විය. එම ශේෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 මැයි 05 දින දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පොදු තැන්පත් ගිණුම් ප්‍රකාශයට අනුව 2013 ජනවාරි 01 දිනට ගිණුමේ ශේෂය රු. 23,018,245 ක් වුවත් විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති පොදු තැන්පත් ගිණුමේ සඳහන් ශේෂය රු. 39,803,307 ක් වූයෙන් එම ශේෂ දෙක අතර වෙනස රු. 16,785,061 ක් වූ අතර එම වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ii) පොදු තැන්පත් ගිණුමේ ශේෂය තුළ රු. 6,264,164ක් වූ වර්ෂ දෙක ඉක්මවූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,309,500 ක් වී තිබුණි.

## 17.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 17.4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2013 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා 03 ක් පමණක් නිකුත් කර තිබුණි.

### 17.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(01) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෑම විගණන හා කළමනාකරණ කමිටුවක්ම යටත් පිරිසෙයින් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 17.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 715(2) හා (3) ප්‍රකාර ගබඩා භාරකරුවන්ගේ හා ගබඩා නිලධාරින්ගේ රාජකාරි වෙනම දක්වා ඇති නමුත් දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන ගබඩාවේ, ගබඩා භාරකරුවන් හා ගබඩා නිලධාරින් ඉහත මුදල් රෙගුලාසිය මඟින් අවධාරණය කර තිබූ රාජකාරි නිසි ලෙස ඉටු කර නොතිබුණි.

## 17.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| යන්ත්‍ර සූත්‍ර | ඒකක ගණන | නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මධ්‍යම වායු සමීකරණ පද්ධතිය | 01 | 2012 සිට 2013 අවසානය දක්වා |
| සංඛ්‍යාන දත්ත පිටපත් කිරීමේ යන්ත්‍ර | 02 | වසර 10 |
| විදුලි පණිවිඩ සැකසීමේ යන්ත්‍ර | 01 | වසර 20 |
| පොත් බැඳීමේ යන්ත්‍ර | 01 | වසර 10 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම

වාර්තාව 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 17.7 කාර්යසාධනය

----------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් මට්ටමින් ජන හා නිවාස සංගණනය 2011 වාර්තාව අවසන් කිරිම කළ යුතු වුවත් එම කාර්ය 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු කර නොතිබුණි.

(ආ) වී අස්වැන්න ඇස්තමේන්තු කිරිමේ සමීක්ෂණයේ 2012/13 මහ කන්නය සහ 2013 යල කන්නයට අදාල වාර්තා ප්‍රකාශයට පත් කිරිම මෙම වර්ෂයේ කාර්යයක් වුවත්, 2012/13 මහ කන්නයට අදාල දිස්ත්‍රික් වාර්තා පිළියෙල කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර තිබුණ අතර 2013 යල කන්නයේ අවසන් වාර්තාව 2013 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි.

(ඇ) තේ, රබර් හා පොල්වල ඒකක නිෂ්පාදන පිරිවැය ගණනය කිරිම සිදු කළ යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දින වන විටත් ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් තොරතුරු රැස් කිරිම හා ප්‍රශ්ණාවලි මඟින් තොරතුරු රැස් කිරිම පමණක් සිදු කර තිබුණි.

(ඈ) 2012 වර්ෂයේ වාර්ෂික කර්මාන්ත සමීක්ෂණ කටයුතු අවසන් කර කර්මාන්ත සංඛ්‍යාන ඉදිරිපත් කිරිම 2013 වර්ෂයේදී සිදු කිරිමට සැලැසුම් කර තිබුණද, 2012 වර්ෂයේ සමීක්ෂණයට අදාලව දත්ත සංස්කරණය කිරිම, කේත කිරිම හා පරිගණකගත කිරිම පමණක් සිදු කර තිබුණි. 2013 වර්ෂයට අදාල කර්මාන්ත සමීක්ෂණයෙහි ක්ෂේත්‍ර පරික්ෂණ සම්පූර්ණ කිරිම ක්‍රියාකාරි සැලැස්ම මගින් සැලැසුම් කර තිබුණද ප්‍රශ්ණාවලිය හා අනෙකුත් ලේඛන අදාල ආයතන වෙත තැපැල් කිරිමේ කටයුතු පමණක් 2013 වර්ෂයේදී සිදු කර තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තුවල කාර්මික අංශයේ නිෂ්පාදනවල වර්ධන අනුපාතය ගණනය කිරිමට සැලැසුම් කර තිබුණද එම කාර්යය 2013 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව විසින් කාර්මික සමීක්ෂණය 1990 වර්ෂයේ සිට කාර්තු පදනමින් සිදු කරන අතර, මෙම වර්ෂයේදී කාර්තු පදනමින් වාර්තා නිකුත් කිරිමට සැලැසුම් කර තිබුණද, අවසන් කාර්තු තුනේ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. එසේම 2012 වර්ෂයේ අවසන් කාර්තු තුනේ වාර්තා ප්‍රකාශයට පත් කර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ මහ සහ 2013 වර්ෂයේ යල කන්නවලට අදාල සංඛ්‍යාති වාර්තා ප්‍රකාශයට පත් කිරිමට ක්‍රියාකාරි සැලැස්මෙහි සැලැසුම් කර තිබුණද, මෙම වර්ෂයේදී 2012/13 වර්ෂයේ මහ කන්නයේ අවසන් වාර්තාව පිළියෙල කර ප්‍රකාශයට පත් කර තිබුණද, 2013 වර්ෂයේ යල කන්නයේ වාර්තාවට අදාල දත්ත පුරෝකථනය කිරිම පමණක් සිදු කර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරිමේ නිල වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ අතර වර්ෂයක් හෝ කාර්තුවක් අවසන් වූ විගසම එම කාලයට අදාල ජාතික

ගිණුම සකස් කිරිමට අවශ්‍ය දත්ත රැස් කිරිම හා වර්ෂය අවසන් වී දින 75 ක් ඇතුළත ප්‍රකාශයට පත් කිරිම දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි. නමුත් ජාතික ගිණුම් සැකසීම සැලැසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) නිෂ්පාදන මිල දර්ශකය මඟින් නිෂ්පාදන මිල වෙනස්වීමේ සාමාන්‍ය මැනීම සිදු කරන අතර සමාලෝචිත වර්ෂයේදී ආර්ථික කටයුතු ආයතන සඳහා බර තැබීම පමණක් සිදු කර තිබුණි. ඒ අනුව අදාල ඉලක්ක කරා ලඟා වී නොතිබුණි.

(ඒ) දේශිය මට්ටමින් සිල්ලර හා නිෂ්පාදන මිල ගණන්වලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට සැලැසුම් කර තිබුණද, 2013 වර්ෂයේදී හා 2012 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ සතිපතා සිල්ලර මිල ගණන්හි මිල විවරනිකාව පමණක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කර තිබුණි.

(ඔ) දෙපාර්තමේන්තු පුහුණු අංශය මඟින් පරිගණක හා සංඛ්‍යාන පුහුණු වැඩසටහන් සඳහා පිළිවෙලින් නිලධාරින් 80 ක් සහ 120 ක්ද පිට දිස්ත්‍රික්කවල නිලධාරින් 40 ක්ද, පුහුණු කිරිමට අපේක්ෂා කර තිබූ නමුත් කාර්යසාධන වාර්තාවේ පුහුණු වැඩසටහන් පැවැත්වූ බව සඳහන් වී තිබුණද නිලධාරින් කොපමණ ප්‍රමාණයක් පුහුණු කළේද යන්න පිළිබඳව සඳහන් කර නොතිබුණි.

## 17.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය වූ පරිදි සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 37 කදී සිදු කරන ලද රු. 616,443 ක වාහන අළුත්වැඩියා පහත සඳහන් කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා විනිවිධභාවයෙන් යුතුව සිදු කර නොතිබුණි.

(අ) අදාළ අළුත්වැඩියාව සිදු කර තිබූ ගරාජය හා අළුත්වැඩියාව සිදුවන දිනට වාහනය ධාවනය කර තිබූ ප්‍රදේශය අතර සැලකිය යුතු නොසැසඳීමක් විය.

(ආ) අළුත්වැඩියාවලට අදාල විධිමත් අනුමැතිය නොතිබුණි.

(ඇ) අළුත්වැඩියා සිදු කළ බවට අදාල වාහනවල දෛනික ධාවන සටහන් මඟින් තහවුරු වී නොතිබුණි.

(ඈ) විධිමත් අනුමැතියක් සහිත වවුචර් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සිදු කර තිබූ අළුත්වැඩියාවන් හා ඒවායේ ගෙවීම් දින අතර පරස්පරතාවයන් පැවැතුණි.

## 17.9 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අවිධිමත් ස්වරූපයේ ගනුදෙනු නිරික්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ආර්ථික සංගණන කටයුතු සඳහා රු. 6,027,840 ක් වැයකර සංගණන බෑග් 18,000 ක් ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු පැවති බව අනාවරණය විය.

(i) ප්‍රසම්පාදනය කර තිබූ සංගණන බෑග් නියමිත පිරිවිතරවලට අනුකූලව නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (v) මාර්ගෝපදේශය ප්‍රකාරව නියමිත ප්‍රමිතීන්ට අනුකූලව බෑග් සපයන බවට සැපයුම්කරුගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටි සංග්‍රහයේ 6.3.6 (සබැඳි) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තා සටහන් ආකෘතියේ මූල්‍යමය තොරතුරු යටතේ ඇති ලංසු සුරක්ෂණය තිබෙන බවට වූ, බැංකුවේ නම හා මුදල පිළිබඳව තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ සහ ඒ යටතේ පවත්නා සියලුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වා ගැනීම සිදු කළ යුතුය. පෞද්ගලික ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබා ගැනීමට අවසර දෙනු ලබන්නේ රජයේ තක්සේරුව අනුව සුවිශේෂී තත්ත්වයන් යටතේ පමණක් බවත් දක්වා තිබුණද ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකක් කුලියට ලබා ගෙන 2011 ජනවාරි 01 දින සිට 2013 නොවැම්බර් 30 දින දක්වා රජයේ තක්සේරුවට වඩා රු. 2,347,480 ක් වැඩිපුර කුලී ගෙවා තිබුණි.

## 17.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 259 | 131 | 128 | -- |
| (ii) | තෘතියික මට්ටම | 494 | 347 | 147 | -- |
| (iii) | ද්විතීයික මට්ටම | 920 | 694 | 226 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 202 | 176 | 26 | -- |
| (v) | වෙනත් (උපාධිධාරී අභ්‍යාසලාභීන්) | -- | 05 | -- | 05 |
| | **එකතුව** | **1,875** | **1,353** | **527** | **05** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 527 ක් පිරවීමට හා උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර කිරිමට කටයුතු කර නොතිබුණි.

## 18. ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

-----------------------------------------------------------------------------

### 18.1 විගණන විෂය පථය

---------------------

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 27 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 18.3 විගණන නිරීක්ෂණය

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 18.4 සිට 18.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.100,000 ක ශුද්ධ ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 91 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.3,930,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සළසා ගෙන තිබුණද, ඉන් එකතුව රු.614,268 ක් පමණක් උපයෝජනය කර තිබීම නිසා එකතුව රු.3,315,732 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

**18.4 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 371 | එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත් එම රෙගුලාසියට පටහැනිව එක් අවස්ථාවකදී දෙපාර්තමේන්තු නිලධාරියෙකු වෙත රු.25,000 ක අත්තිකාරමක් ලබා දී තිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2008 මැයි 28 දිනැති අංක 428 දරන චක්‍රලේඛය | සුළු මුදල් අග්‍රිමයෙන් කළ හැකි එක් ගෙවීමක උපරිම වටිනාකම රු.1,000 ක් වුවත්, ඊට පටහැනිව අවස්ථා තුනකදී සුළු මුදලින් ගෙවීම් කර තිබුණි. |
| **(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | |
| 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි වත්කම් සංකේත අංකනය කර නොතිබුණි. |

## 18.5 කාර්යසාධනය

---------------

2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේදී රජය විසින් ප්‍රධාන සංවර්ධන තේමාවන් යටතේ කුඩා, මධ්‍යම හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් 1,967 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් බිලියන 481 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් ව්‍යාපෘති 125 ක් පමණක් 2013 වර්ෂය තුළදී ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය මඟින් අධීක්ෂණයට ලක්කර තිබුණි. එමෙන්ම දේශීය ව්‍යාපෘති 1,751 න් කිසිදු ව්‍යාපෘතියක් ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය මඟින් අධීක්ෂණයට ලක් කර නොතිබුණි.

(ආ) දේශීය හා විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ත්‍රෛමාසිකව විමසා බැලීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සබැඳි වෙබ් අඩවිගත දත්ත පද්ධතියක්ද දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණි. 2013 වර්ෂය අවසාන වන විට විදේශ අරමුදල් ව්‍යාපෘති 216 න් 195 ක සහ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 1,751 න් ව්‍යාපෘති 400 ක තොරතුරු පමණක් මෙම පද්ධතියට ඇතුළත් කර තිබුණි.

(ඇ) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමට ක්ෂේත්‍ර චාරිකා 31 ක් පමණක් සිදු කර තිබුණි. 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ව්‍යාපෘති 65 ක ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කිරීමට සැලසුම් කර තිබුණද, එම ව්‍යාපෘතිවලින්, ව්‍යාපෘති 18 ක ක්ෂේත්‍ර නිරීක්ෂණ පමණක් සිදු කර තිබුණි. ව්‍යාපෘති අධීක්ෂණයේදී ක්ෂේත්‍ර චාරිකා මඟින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබුවද ක්ෂේත්‍ර චාරිකා මඟින් ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ඉතා පහළ මට්ටමක පැවැතුණි.

(ඈ) විදේශ අරමුදල් භාවිතයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රගතිය වේගවත් කිරීමට සහායවීම දෙපාර්තමේන්තුවේ අරමුණක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂයේ වැඩ ආරම්භ කළ යුතු ව්‍යාපෘති 37 ක වැඩ 2013 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) ව්‍යාපෘති කාලය අවසන් වීමට ආසන්නව තිබියදීත් මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 50 කට අඩුවෙන් වැය කර තිබූ ව්‍යාපෘති 20 ක් පැවතුණි.

(iii) ව්‍යාපෘතිය විසින් ඇස්තමේන්තු කර තිබූ මුළු වටිනාකමට වඩා සියයට 101 සිට සියයට 136 දක්වා පරාසයක ප්‍රමාණයකින් උපයෝජනයන් කර තිබුණු ව්‍යාපෘති 3 ක් පැවතුණි.

**18.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 22 | 12 |
| (ආ) | තෘතියික මට්ටම | 35 | 17 | 18 |
| (ඇ) | ද්විතීක මට්ටම | 01 | 01 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 18 | 16 | 02 |
| | **එකතුව** | **88** | **56** | **32** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 32 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**19. ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

**19.1 විගණන විෂය පථය**

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 25 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**19.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන

යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 19.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 19.4 සිට 19.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ත් සියයට 93 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) ආදායම් ගිණුම

සමාලෝචිත වර්ෂයේ රු.545,000,000 ක් වූ මුලික ආදායම් ඇස්තමේන්තුව රු.520,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණ ද වර්ෂය තුළ රැස් කර තිබුණු ශුද්ධ ආදායම රු.458,372,096 ක් වි තිබුණි. ඒ අනුව රැස්කළ ආදායම මුලික ඇස්තමේන්තු ආදායමෙන් සියයට 84 ක් හා සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88 ක් වි තිබුණි.

## 19.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### විගණන හා කළමණාකරන කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009 (1) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුවට අදාළව 2013 වර්ෂයේදී රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

## 19.5 අනුකූල නොවීම්

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා තිබුණද, 2013 වර්ෂයේදී මිලදී ගත් රු.473,750 ක් වටිනා ලී බඩු එම ලේඛනයේ සටහන් කර නොතිබුණි. එසේම 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනයක් පවත්වා තිබුණත්, 2013 වර්ෂයේදී මිලදී ගත් රු.839,927 ක් වටිනා පරිගණක

උපාංග හා මෘදුකාංග එම ලේඛනයේ සටහන් කර නොතිබුණි.

**19.6 කාර්යසාධනය**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිලිබද නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සදහා පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්මෙහි ඒකක 5 ක් යටතේ ආදායම් ඉලක්කයන් සදහන් කර තිබුණද එම ඉලක්කයන් ලඟා කර ගැනීමට කළ යුතු කාර්යයන් හා වගකිව යුතු නිලධාරින් නම් කර නොතිබුණි. 2013 වර්ෂය සදහා මූලික ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 545 ක් වුවද, රුපියල් මිලියන 320 ක ඉලක්කගත ආදායමක් සදහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයට අදාලව පිළියෙල කරන ලද කාර්යසාධන වාර්තාවට අනුව බලපත්‍ර නිකුත් කිරිමට අදාල ප්‍රගතිය පහත දැක්වේ.

| | ඒකකය | බලපත්‍ර සංඛ්‍යාව | ආදායම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | ඖෂධ (1) | 2104 | 83,036,455 |
| (ii) | වාහන (2) | 1288 | 125,202,590 |
| (iii) | රසායන ද්‍රව්‍ය (3) | 4301 | 190,727,940 |
| (iv) | විදුලි සංදේශ උපකරණ හා වෙනත් | 3406 | 46,973,837 |
| (v) | වෙනත් ආනයන හා අපනයන | 1427 | 1,205,917 |
| | එකතුව | 12526 | 447,146,739 |

**19.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 06 | 02 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 60 | 57 | 03 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 19 | 15 | 04 |
| | **එකතුව** | **89** | **79** | **10** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 20. ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව

### 20.1 විගණන විෂය පථය

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 14 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 20.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 20.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 20.4 සිට 20.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.450,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 48 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**20.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

**------------------------------**

2013 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම 2014 ජූලි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**20.5 කාර්යසාධනය**

**------------------**

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

(අ) **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාට, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හා අනෙකුත් නිලධාරින්ට විරුද්ධව පනවන නඩු කටයුතු සම්බන්ධීකරණය කිරීම**

**----------------------------------------------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දින වන විට නීති කටයුතු දෙපාර්තමේන්තුවට ලැබී තිබූ නඩු කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2012 වර්ෂයෙන් ඉදිරියට ආ නඩු | 2013 වර්ෂයේ ලැබී ඇති නඩු සංඛ්‍යාව | 2013 වර්ෂයේදි අවසන් වී ඇති නඩු සංඛ්‍යාව | 2013 දෙසැම්බර් 31 දිනට පවත්නා නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 35 | 40 | 22 | 53 |
| අභියාචනාධිකරණය | 25 | 11 | 06 | 30 |
| මහාධිකරණය | 02 | - | 02 | - |
| දිසා අධිකරණය | 02 | 03 | - | 05 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 03 | 06 | 01 | 08 |
| **එකතුව** | **67** | **60** | **31** | **96** |

2013 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු 127 ක් මෙම දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද එම වර්ෂයේදී නඩු කටයුතු 31ක් පමණක් අවසන් කර තිබුණි. 2009 වර්ෂයේ

පවරන ලද නඩු 04 ක් හා 2010 වර්ෂයේ පවරන ලද නඩු 08 ක් 2014 ජූලි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**(ආ) නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව අතර ගිවිසුම් හා පනත් කෙටුම්පත් සම්බන්ධීකරණ කටයුතු කිරීමේ ප්‍රගතිය**

2013 දෙසැම්බර් 31 දින වන විට නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව අතර ගිවිසුම් හා පනත් කෙටුම්පත් සම්බන්ධීකරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | 2012 වර්ෂයෙන් ඉදිරියට ආ ගිවිසුම් සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ ගිවිසුම් පිළිබඳ යොමු වී ඇති ලිපි ගොනු සංඛ්‍යාව | වැඩ කටයුතු අවසන් වී නොමැති ලිපි ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් වී ඇති ලිපි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 23 | 96 | 19 | 100 |
| අනෙකුත් දෙපාර්තමේන්තු | 01 | 01 | 01 | 01 |
| **එකතුව** | **24** | **97** | **20** | **101** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් සම්බන්ධීකරණය සඳහා යොමු කර තිබූ ලිපි ගොනු 119 න් ලිපි ගොනු 100 ක සම්බන්ධීකරණ කටයුතු අවසන් කර තිබූ නමුත් ලිපිගොනු 19 ක සම්බන්ධීකරණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) වෙනත් දෙපාර්තමේන්තුවලින් සම්බන්ධීකරණය සඳහා ලැබී තිබූ ලිපිගොනු 02 න් ලිපිගොනු 01 ක සම්බන්ධීකරණ කාර්යයන් නිම කර තිබුණ අතර ලිපි ගොනු 01 ක සම්බන්ධීකරණ කාර්යයන් නිම කර නොතිබුණි.

**(ඇ) නීති,රෙගුලාසි හා අදාල කෙටුම්පත් සම්බන්ධීකරණය කිරීමේ ක්‍රියාවලිය**

2013 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් සංශෝධන පනත් 21 ක් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සම්බන්ධීකරණ කටයුතු සිදු කර තිබුණි.

## 20.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 08 | 15 | - |
| (ආ) | ද්විතියික මට්ටම | 06 | 03 | 03 | - |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 07 | 04 | 03 | - |
| (ඈ) | වෙනත්(අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 36 | 16 | 21 | 01 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 21 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය ප්‍රකාර රාජ්‍ය සේවයේ සෑම තනතුරකම, තනතුරෙහි වැටුප් ප්‍රමාණය, අවශ්‍ය සුදුසුකම්, වයස් සීමාවන් සහ අදාල අනෙකුත් විස්තර නිශ්චිතව ඇතුළත් කර බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමැතිය ලබාගත යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් පරිපාටියක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් වැඩබැලීමේ පදනම මත ගණකාධිකාරිවරියක් සහ තාවකාලික පදනම මත කාර්යාල කාර්යය සහයකයෙකු ලබාගෙන තිබුණි.

## 21. ශීර්ෂය 324 - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව

### 21.1 විගණන විෂය පථය

කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 24 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**21.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 21.4 සිට 21.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

---

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 44 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**21.4 කාර්යසාධනය**

---

2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාවලිය මඟින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම සඳහා මඟ පෙන්වීම සහ භාණ්ඩාගාර නියෝජනය ලබා දෙමින් ඊට ඍජු ලෙස සම්බන්ධවීම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්යය වේ. ඒ අනුව

කාර්තුවකට එක බැගින් වසරකට අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් පැවැත්විය යුතු වුවත්, 2013 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 01 ක් පමණි.

(ආ) තවද 2013 වර්ෂයේදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණු අමාත්‍යාංශ 02 ක්ද, එක් රැස්වීමක් පමණක් පවත්වන ලද අමාත්‍යාංශ 05 ක්ද, රැස්වීම් දෙකක් පමණක් පවත්වන ලද අමාත්‍යාංශ 09 ක් සහ රැස්වීම් තුනක් පමණක් පවත්වන ලද අමාත්‍යාංශ 13 ක්ද පැවතුණි.

(ඇ) ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යසාධන විගණනය පිළිබඳ මාර්ගෝපදේශ සහ විශේෂ විමර්ශන පැවැත්වීම සම්බන්ධව මාර්ගෝපදේශ සකස් කිරිම කළ යුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නිකුත් කර නොතිබුණි.

(ඈ) වෙනත් අභ්‍යන්තර විගණන ඒකකවල අභ්‍යන්තර විගණන සැලැසුම් සමාලෝචනය කිරිම දෙපාර්තමේන්තුවේ කාර්යයක් වුවද එවැනි සැලැසුම් කොපමණ ප්‍රමාණයක් සමාලෝචනය කළ යුතුද යන්න ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කර නොතිබුණි. එසේම කාර්යසාධන විගණනය හඳුන්වාදීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් වුවද, එවැනි අභ්‍යන්තර විගණන ඒකක කොපමණ ප්‍රමාණයකට ඒ පිළිබඳ දැනුවත් කිරිම් කළ යුතුද යන්න ක්‍රියාකාරි සැලැස්මේ දක්වා නොතිබුණි.

**21.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 11 | 06 |
| (ආ) | ද්විතියික මට්ටම | 20 | 13 | 07 |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 11 | 09 | 02 |
| | එකතුව | 48 | 33 | 15 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 15 ක් සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**22.** **මිලෝදා ආයතනයේ 2013 මැයි 31 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

**22.1.1** **විගණන විෂය පථය**

මිලෝදා ආයතනයේ 2013 මැයි 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**22.1.2** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**22.1.3** **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**22.1.4** **මිලෝදා ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කිරීම**

මිලෝදා ආයතනයේ පැවති මූල්‍යමය වත්කම් එනම් ස්ථාවර තැන්පතු රු.96,500,000 ක්, ලැබිය යුතු පොළී රු.1,617,384 ක්, අතැති මුදල් රු.1,364,393 ක්, සුළු මුදල් අත්තිකාරම් හා ඉන්ධන අත්තිකාරම් රු.10,000 ක් සමඟ මුළු වත්කම් රු.99,491,776 ක් හා රු.82,289 ක් වූ බැරකම් සමඟ රු.99,409,487 ක ශුද්ධ වත්කම් හා පැරණි රේගු ගොඩනැගිල්ල පිළිසකර කිරීම සඳහා මූල්‍ය

කළමනාකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙන් ලැබී තිබූ රු. 151,319,381 ක අරමුදල් යොදා ගෙන 2014 අගෝස්තු 23 දිනැති අංක අමප/12/1129/504/100 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව 2013 මැයි 17 දින සිට මෙම ආයතනය 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කර තිබුණි.

මිලෝදා ආයතනය ඈවර කිරීමේදී රු. 1,082,127 ක ස්ථාවර වත්කම්, රු. 210,414 ක සේවක ණය හා රු.663,590 ක සේවක පාරිතෝෂිත අරමුදල් නව සමාගමට පවරන බව දන්වා තිබුණද නව සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එකී වත්කම් හා බැරකම් පවරාගෙන නොතිබුණි.

**22.1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 22.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**22.2 මූල්‍ය ප්‍රකාශන**

**22.2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 22.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 මැයි 31 දිනෙන් අවසන් මාස 05 ක කාලය සඳහා මිලෝදා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 05 ක කාලය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**22.2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**22.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ට පටහැනිව හා ස්ථාවර වත්කම් වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් රු.1,082,128 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු අතර, ආයතනයේ වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියද ගිණුම් සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**22.2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සාමාගමට කිසිදු මූල්‍යමය නොවන වත්කමක් පවරා දීමට කටයුතු කර නොමැති බව දක්වා තිබුණද ගිණුම් ප්‍රතිපත්ති 6 ප්‍රකාර ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා දරා තිබූ රු.3,758,873 ක හා රු.1,082,128 ක ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන වත්කම් ලෙස නව සමාගමට පැවරීමකින් තොරව පුනරාවර්තන වියදම් ලෙස ලාභයට එරෙහිව ලියා හැර තිබුණි.

**22.2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ශේෂය සහ ලෙජර ගිණුම්වල දක්වා තිබූ ශේෂය අතර පහත සඳහන් වෙනස්කම් පැවතුණි.

| වියදම් වර්ගය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලෙජර ගිණුම් අනුව ශේෂය |
|---|---|---|
| | රු. | රු. |
| යෝජිත නව මිලෝදා ගොඩනැගිල්ල සඳහා දරන ලද වියදම | 4,055,288 | 5,619,121 |
| යල්පැන ගිය අමු ද්‍රව්‍ය | 153,452 | - |

**22.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ 4 වන ගිණුම් ප්‍රතිපත්තිය ප්‍රකාර රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.613,295 ක් හා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් කලින් ලැබී තිබූ පාඨමාලා ගාස්තු ලෙස ආයතනයේ තැන්පත් කර තිබූ රු.2,838,980 ක ගාස්තු බේරුම් කරන ලද ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**22.2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 753 (1) | භාණ්ඩ නිකුත් කිරීමේ නියෝග පිළියෙල කර එහි මුල් පිටපත භාණ්ඩ සමඟම භාණ්ඩ භාරගන්නා නිලධාරියාට යවා දෙවන පිටපත භාණ්ඩ නිකුත් කළ නිලධාරියා භාරයේ තබා ගත යුතු වුවත්, රු.15,118,141 ක් වටිනා ස්ථාවර වත්කම් පැවරීම්වලට අදාලව එසේ කටයුතු කර නොතාබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 753 (2) | භාණ්ඩ ලැබුණ කල්හි එම භාණ්ඩ භාර ගන්නා නිලධාරියා විසින් ලැබීම් ඇණවුමක් පිළියෙල කර මුල් පිටපත භාණ්ඩ භාර ගන්නා නිලධාරියාට යවා දෙවන පිටපත තමාගේ භාරයේ තබා ගත යුතු වුවත් ඉහත වටිනාකමින් යුතු ස්ථාවර වත්කම් සඳහා ලැබීම් නියෝග ලබා ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 373 (1) | මෙම ආයතනයේ 2013 මැයි 31 දිනට පැවති රු.10,000 ක අතුරු අග්‍රිම ශේෂය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර නව මිලෝදා ආයතනයට මාරු කර තිබුණි. |

**(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

| | |
|---|---|
| 2005 ජුලි 13 දිනැති අංක 30 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල හෝ වෙනත් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබේනම් එම මුදල් 2005 අගෝස්තු 01 දින සිට ගිණුම් අංක 4670 දරන රාජ්‍ය ආයතන වල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ තැන්පත් කළ යුතුව තිබුණද, ඊට පටහැනිව රු.96,500,000 ක් මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය සිදු කර තිබුණි |

## 22.3. මූල්‍ය සමාලෝචනය

### 22.3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 මැයි 31 දිනෙන් අවසන් මාස පහක කාල පරිච්ඡේදය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,358,377 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,975,277 ක් විය. මෙම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට පුහුණු වැඩසටහන් ආදායම අඩුවීම, පොලී ආදායම අඩුවීම සහ යෝජිත නව මිලෝදා ආයතනය පිහිටුවීම වෙනුවෙන් වැය කර තිබූ රු.4,841,000 ක ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ආයතනයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබීම හේතු වී තිබුණි.

### 22.3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

| විස්තරය | 2012 | 2013 මාස 05 ක් සඳහා |
|---|---|---|
| | රු. | රු. |
| පුහුණු සහ අධ්‍යාපන සේවාවල ආදායම් | 19,107,900 | 1,873,000 |
| පුහුණු සහ අධ්‍යාපන සේවාවල ඍජු වියදම් | (4,199,891) | (519,550) |
| පුහුණුවීම් මඟින් ලද දායකත්වය | 14,908,009 | 1,353,450 |
| පරිපාලන හා වෙනත් පොදු කාර්ය පිරිවැය | (22,203,072) | (9,150,598) |
| පුහුණු සහ අධ්‍යාපන සේවාවලින් ලද අලාභය | (7,295,063) | (7,797,148) |
| වෙනත් ආදායම් | 11,270,340 | 5,438,771 |
| ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය) | 3,975,277 | (2,358,377) |
| දායකත්ව අනුපාතය (සියයට) | 78 | 75 |

ආයතනය විසින් පවත්වා තිබූ පුහුණු සහ අධ්‍යාපන සේවාවලින් 2012 වර්ෂයේ රු.7,295,063 ක සහ 2013 වර්ෂයේ මුල් මාස 05 ක කාල පරිච්ඡේදය තුළ රු.7,797,148 ක අලාභයක් සිදු වී තිබුණි. 2012 වර්ෂයේ සියයට 78 ක් හා 2013 වර්ෂයේ සියයට 75 ක දායකත්ව අනුපාතයක් පුහුණු සහ අධ්‍යාපන සේවාවලින් ලැබී තිබුණද, පොදු කාර්ය පිරිවැය ඉහළ යාම නිසා මෙම අලාභයන් සිදු වී තිබුණි. 2012 වර්ෂයේ සහ 2013 වර්ෂයේ මුල් මාස 05 ක කාල පරිච්ඡේදය තුළ

ලැබී තිබූ පිළිවෙලින් රු.11,270,340 ක හා රු.2,358,377 ක පොලී හා වෙනත් ආදායම් නිසා 2012 වර්ෂයේ රු.3,975,277 ක ලාභය හා 2013 වර්ෂයේදී රු.2,358,377 ක අලාභයක් දක්වා අඩුවී තිබුණි.

**22.4 මෙහෙයුම් සමාලෝචනය**

**කාර්යසාධනය**

2013 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස 04 ක කාල පරිච්ඡේදය තුළ ආයතනය, පුහුණු සහ අධ්‍යාපන සේවා වැඩසටහන් 11 ක් පවත්වා රු.1,873,000 ක ආදායමක් උපයා තිබූ අතර එම ආදායම ඉපැයීම වෙනුවෙන් ඍජු වියදම් ලෙස රු.519,550 ක් වැය කර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ පැවැත්වීමට අපේක්ෂාකරන පුහුණු සහ අධ්‍යාපන සේවා වැඩසටහන් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් ආයතනයේ අරමුණ ඉටුවන පරිදි වැඩසටහන් පැවැත්වුවේද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

**22.5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**22.5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ආයතනය විසින් කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2013 මැයි 31 දිනෙන් අවසන් මාස 05 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**22.5.2 අයවැය ලේඛනමය පාලනය**

ආයතනයේ අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**22.6 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුව තිබුණි.

(අ) ස්ථාවර වත්කම්

(ආ) පොදුකාර්ය පිරිවැය

**23. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

**23.1.1 විගණන විෂය පථය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 14 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 23.1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 23.1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ජනරජයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 23.1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 23.2.4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 23.2 මූල්‍ය ප්‍රකාශන

### 23.2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 23.2.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 23.2.2 මූල්‍ය කාර්යසාධනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය කාර්යසාධනය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| 2013 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව | | 2013 වර්ෂය තථ්‍ය | 2012 වර්ෂය තථ්‍ය |
|---|---|---|---|
| රු.මිලියන | | රු.මිලියන | රු.මිලියන |
| | **ආදායම** | | |
| 239,518.0 | ආදායම් බදු | 205,665.6 | 172,593.1 |
| 577,959.1 | දේශීය භාණ්ඩ හා සේවා බදු | 498,526.3 | 462,164.1 |
| 234,723.0 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 219,451.3 | 210,539.3 |
| 1,052,200.1 | බදු ආදායම | 923,643.2 | 845,296.5 |
| 140,026.0 | බදු නොවන ආදායම හා වෙනත් | 142,604.2 | 151,520.4 |
| **1,192,226.1** | **ආදායම්වල එකතුව (අ)** | **1,066,247.4** | **996,816.9** |
| | **අඩුකළා : වියදම්** | | |
| 308,290.0 | වැටුප්, වේතන හා වෙනත් සේවා ප්‍රතිලාභ | 306,889.2 | 272,620.0 |
| 135,586.8 | වෙනත් භාණ්ඩ හා සේවා | 130,477.0 | 110,014.4 |
| 379,556.9 | සහනාධාර, ප්‍රදානයන් හා මාරු කිරීම් | 351,387.7 | 326,576.3 |
| 486,485.9 | පොළී ගෙවීම | 464,529.4 | 408,986.7 |
| 1,064.7 | වෙනත් පුනරාවර්තන වියදම් | 225.6 | 133.3 |
| **1,310,984.3** | **මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (ආ)** | **1,253,508.9** | **1,118,330.7** |
| **118,758.2** | **ආදායම් හිඟය (අ) - (ආ)** | **187,261.5** | **121,513.8** |

| | | | |
|---|---|---|---|
| 544,988.7 | රාජ්‍ය ආයෝජන | 455,578.2 | 471,088.8 |
| **663,746.9** | **අයවැය හිඟය** | **642,839.7** | **592,602.6** |
| | **අයවැය හිඟය මූල්‍යනය** | | |
| 201,068.2 | විදේශ ණය ගැනිම් | 183,317.2 | 365,698.4 |
| (113,000.0) | විදේශ ණය ආපසු ගෙවිම | (94,895.9) | (152,898.7) |
| 88,068.2 | ශුද්ධ විදේශ ණය ගැනීම් | 88,421.3 | 212,799.7 |
| 20,000.0 | විදේශ ප්‍රදානයන් | 15,859.0 | 16,070.8 |
| **108,068.2** | **විදේශ මූල්‍ය දායකත්වයේ එකතුව** | **104,280.3** | **228,870.5** |
| 1,118,893.5 | දේශිය බැංකු නොවන ණය ගැනිම් | 1,089,696.2 | 725,869.3 |
| (634,000.0) | දේශිය ණය ආපසු ගෙවිම් | (607,623.0) | (449,915.1) |
| 484,893.5 | ශුද්ධ දේශිය ණය ගැනිම් | 482,073.2 | 275,954.2 |
| 16,825.0 | ණය අයකර ගැනිම | 15,968.5 | 16,409.1 |
| 800.0 | ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් | 280.3 | 831.1 |
| - | තැන්පතු ගිණුම්වල හා බැරකම්වල ශුද්ධ වෙනස්විම | 7,639.6 | 22,160.9 |
| - | මුදල් හා ආසන්න මුදල්වල වැඩිවිම/(අඩුවීම) | 32,597.8 | 48,376.8 |
| **610,586.7** | **මුළු මූල්‍යකරණයේ එකතුව** | **642,839.7** | **592,602.6** |

### 23.2.3 මූල්‍ය තත්ත්වය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අවසානයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්කම් හා බැරකම් පිළිබඳ සැසඳීමක් පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | 2013 | 2012 |
| | රු.මිලියන | රු.මිලියන |
| **මූල්‍ය වත්කම්** | | |
| රජයේ නිලධාරීන්ට ණය | 23,012.2 | 24,034.4 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් | 9,229.9 | 9,052.2 |
| සාමාජික ගාස්තු | 3,517.2 | 3,517.2 |
| ණය දිම් | 370,618.1 | 323,121.6 |
| රජය සතු ව්‍යාපාරවල රජයේ දායකත්වය | 212,976.3 | 176,600.8 |
| මුද්දර තොග ගිණුම | 971.0 | 1,010.3 |
| **මූල්‍ය වත්කම්වල එකතුව** | **620,324.7** | **537,336.5** |

**බැරකම්**
**---------**

| | | |
|---|---|---|
| බැංකු අයිරාව | 137,076.8 | 104,479.0 |
| මහ බැංකු අත්තිකාරම් | 109,271.8 | 111,291.8 |
| විදේශ ණය චක්‍රීය අරමුදල | 22,586.7 | 22,183.4 |
| විවිධ අරමුදල් | 1,386.5 | 1,456.7 |
| රජයේ ණය ගැනීම් | 5,996,496.3 | 5,408,759.8 |
| තැන්පතු හා අනෙකුත් බැරකම් | 83,410.4 | 75,756.0 |
| රජයේ දෙපාර්තමේන්තු සමඟ වන මෙහෙයුම් ගිණුම | (4,905.3) | (3,963.1) |
| විවිධ ගිණුම් | (380.5) | (2,107.7) |
| | --------------- | ------------- |
| **මුළු බැරකම්** | **6,344,942.7** | **5,717,855.9** |
| අවිනිශ්චිත අවස්ථා අරමුදල | 140.0 | 140.0 |
| | --------------- | ------------- |
| බැරකම් හා අවිනිශ්චිත අවස්ථා අරමුදලේ එකතුව | 6,345,082.7 | 5,717,995.9 |
| | -------------- | -------------- |
| **මූල්‍ය වත්කම් ඉක්මවූ මුළු බැරකම් හා අවිනිශ්චිත අවස්ථා අරමුදල් ශේෂය** | **5,724,758.0** | **5,180,659.4** |
| | ======== | ======== |
| ඒකාබද්ධ අරමුදල - සමුච්චිත හිඟය | 312,477.1 | 272,239.7 |
| භෞතික වත්කම්වල මුළු ආයෝජනය හා සමුච්චිත ශුද්ධ ආදායම් හිඟය | 5,412,281.1 | 4,908,419.7 |
| | -------------- | --------------- |
| | **5,724,758.2** | **5,180,659.4** |
| | ======== | ======== |
| අසම්භාව්‍යයන් සඳහා බැඳීම් | **362,923.5** | **401,411.0** |

**23.2.4 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය බැංකුවකින් 2012 සහ 2013 වර්ෂවලදී අත්තිකාරම් වශයෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු. මිලියන 6,000 ක් හා රු. මිලියන 2,000 ක් 2012 හා 2013 වර්ෂවල ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** රාජ්‍ය ව්‍යවසායන් දෙකක නිශ්චිත ව්‍යාපෘති දෙකක් සඳහා ගිවිසුම් දෙකක් මගින් එකතුව රු.මිලියන 75,045 ක විදේශ ණය ලබාගෙන තිබුණි. එම විදේශ ණය හා ණය සේවාකරණය අදාල රාජ්‍ය ව්‍යවසායන් වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණද, එකී ණය ශේෂ තවදුරටත් ජනරජයේ විදේශ ණය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ)** 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිළි කිරීමේ සටහන් අංක 26 මගින් දක්වා තිබුණු හෝටල් කර්මාන්තය සංවර්ධනය සඳහා දෙනු ලැබූ ඉඩමක් වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 19,817 ක්ද, 2013 ජනවාරි 01 දින වනවිට එයින් ඉපයූ ආදායම වූ රු. මිලියන 3,329 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 23,146 ක ශේෂයක් රජයේ ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. මිලියන 5,560 ක් ගෙවීම් කිරීමෙන් පසු 2013 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 17,586 ක ශේෂයක් පැවතුණි.

**(ඈ)** විදේශ ණය ගැනීම්, දේශීය ණය යටතේ වූ සංවර්ධන බැඳුම්කර පියවීම් හා ගිණුම්ගත නොකළ ණය ශේෂ ලෙස 2013 දෙසැම්බර් 31 දිනට ජනරජයේ මූල්‍ය

ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂය හා පවත්වා තිබුණු ලෙජර් සහ ණය වාර්තා අනුව පැවති රු.මිලියන 39,054 ක වෙනස විනිමය වෙනස්වීම් ලෙස දක්වා තිබුණද, ඒ බව නිශ්චිතව තහවුරු කිරීමට කළමනාකරණය අපොහොසත් විය.

**(ඉ)** පළාත් සභා විසින් උපයනු ලබන ආදායම් හා ඒ මත දරන ලද වියදම් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

**23.2.5** බැංකු අයිරාව
---------------

මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු. මිලියන 137,077 ක් වූ අතර එහි සංයුතිය මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 21 හි දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 21 හි සඳහන් බැංකු ගිණුම් 12 න් එකක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම (8020) වන අතර, එම ගිණුමෙහි අන්තර්ගත ගිණුම් 10 න් 3 ක වූ අයිරා ශේෂය රු.මිලියන 165,697 ට බැංකු ගිණුම් 7 ක වාසි දායක ශේෂය රු. මිලියන 8,268 ක් හිලව් කිරීමෙන් පසු අයිරා ශේෂය රු.මිලියන 157,429 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. අංක 8020 දරන ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට සත්‍ය අයිරා ශේෂය පසුගිය වර්ෂයේ අයිරා ශේෂයට වඩා රු.මිලියන 15,510 කින් වැඩි වී තිබුණි.

(ආ) ඉහත (අ) හි සඳහන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ බැංකු අයිරා ශේෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 10,262 ක පොලියක් ගෙවා තිබූ අතර එය ඉකුත් වර්ෂයේ ගෙවන ලද පොලිය වූ රු.මිලියන 7,604 ට වඩා රු.මිලියන 2,658 කින් හෙවත් සියයට 35 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි.

(ඇ) බැංකු අයිරා ශේෂයට ගැලපුම් කර ඇති භාණ්ඩාගාර අනුමත අග්‍රිම ගිණුමේ (7002) රු.මිලියන 27,603 ක හර ශේෂයට රු.මිලියන 488 ක බැර ශේෂය හිලව් කිරීමෙන් පසු රු.මිලියන 27,115 ක් ලෙස ගණනය කර දක්වා තිබුණි. එම ශේෂය තුළ නිරවුල් නොවූ වසර 1 සිට 17 දක්වා කාල පරාසයකට අයත් එකතුව රු. මිලියන 1,482 හර ශේෂයන් සහ එකතුව රු.මිලියන 464 බැර ශේෂයක් අන්තර්ගත වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2013.12.31 දිනට ශේෂය | | ශේෂය පැවත එන වර්ෂය |
|---|---|---|---|
| | හර | බැර | |
| | රු. | රු. | |
| 7002/0000/00/0336/97 | 92,369,760 | - | 1997 |
| 7002/0000/00/0075/97 | 53,575,400 | - | 1997 |
| 7002/0000/00/0377/98 | 161,096,408 | - | 1998 |
| 7002/0000/00/0332/99 | 101,591,142 | - | 1999 |
| 7002/0000/00/0328/00 | 200,405,060 | - | 2000 |
| 7002/0000/00/0035/08 | 63,350,921 | - | 2008 |

| | | | |
|---|---|---|---|
| 7002/0000/00/0035/09 | 32,271,945 | - | 2009 |
| 7002/0000/00/0035/10 | 675,170,151 | - | 2010 |
| 7002/0000/00/0035/11 | - | 463,557,480 | 2011 |
| 7002/0000/00/0035/12 | 101,950,473 | - | 2012 |
| 7002/0000/00/0333/12 | 2,931 | - | 2012 |
| | ----------------- | ---------------- | |
| | 1,481,784,191 | 463,557,480 | |
| | ========== | ========= | |

((ඈ) ප්‍රතිපූර්ණ කළ හැකි විදේශාධාර සඳහා වූ භාණ්ඩාගාර අනුමත අග්‍රිම ගිණුමේ (7003) 2013 දෙසැම්බර් 31 දිනට හර ශේෂය වූ රු.70,101,042 ට බැර ශේෂය වූ රු.15,000 හිලව් කිරීමෙන් පසු රු.70,086,042 ක් ලෙස ගැලපුම් කර තිබුණි. එම ශේෂය තුළ නිරවුල් නොවූ වර්ෂ 08 ත් වර්ෂ 13 ත් අතර කාල පරාසයකට අයත් රු.38,401,706 ක හර ශේෂ 5 ක් හා රු. 15,000 ක බැර ශේෂයක් අන්තර්ගත වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2013.12.31 දිනට ශේෂය** | | **ශේෂය ජනිත වූ වර්ෂය** |
|---|---|---|---|
| | **හර** | **බැර** | |
| | **රු.** | **රු.** | |
| 7003/0000/00/0372/03 | 20,000,000 | - | 2003 |
| 7003/0000/00/0043/04 | - | 15,000 | 2004 |
| 7003/0000/00/0043/05 | 14,286,931 | - | 2005 |
| 7003/0000/00/0043/01 | 11,358 | - | 2001 |
| 7003/0000/00/0047/00 | 4,043,282 | - | 2000 |
| 7003/0000/00/0043/02 | 60,135 | - | 2002 |
| | --------------- | ----------- | |
| **එකතුව** | **38,401,706** | **15,000** | |
| | ======== | ====== | |

**23.2.6 පොදු තැන්පත් ගිණුම**

බැරකම් යටතේ, තැන්පතු සහ අනෙකුත් බැරකම් ලෙස රු. මිලියන 83,410 ක ශේෂයක් දක්වා තිබුණි. මේ පිළිබඳ විස්තර දැක්වෙන මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 26 හි, භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ (අංක 6000) ශේෂය ලෙස රු. මිලියන 77,109.9 ක් දක්වා තිබුණි. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම ශේෂය පහත දැක්වෙන පරිදි විය.

| තැන්පතු වර්ගය | හර ශේෂය | බැර ශේෂය | ශුද්ධ බැර ශේෂය |
|---|---|---|---|
| | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ඇප තැන්පත් | - | 152.3 | 152.3 |
| ටෙන්ඩර් තැන්පත් | - | 30.4 | 30.4 |
| විවිධ තැන්පත් (පැරණි) (6000-3) | 2 | | (2) |
| සැස්ථා හා අරමුදල් ( | - | 1,222 | 1,222 |
| රජයට පවරා ගන්නා ලද ආයතන ආ ) | - | 111.2 | 111.2 |
| අරමුදල් (මණ්ඩල) | - | 28,134.9 | 28,134.9 |
| අතිරික්ත අරමුදල් | - | 252.4 | 252.4 |
| ක්ෂය සංචිත අරමුදල් ක | - | 153.1 | 153.1 |
| තාවකාලික ණයට ගැනීම් තු (පරිපාලන ණය) | - | 14,083.7 | 14,083.7 |
| විදේශාධාර ප්‍රදාන රු | - | 3,141.8 | 3,141.8 |
| ප්‍රතිපාදන තැන්පත් | 0.6 | - | (0.6) |
| පෞද්ගලික ආයතන විසින් කරනු ලබන තැන්පත් | - | 88.1 | 88.1 |
| පළාත් සභා වෙත ආදායම් ප්‍රේෂණ ය | - | 1,594.4 | 1,594.4 |
| පොදු තැන්පත් ත | - | 28,146.9 | 28,146.9 |
| වෙනත් | - | 0.7 | 0.7 |
| **එකතුව** 7 7 | **2.6** | **77,111.9** | **77,109.3** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

,
111.9 ක බැර ශේෂයෙන් එකතුව රු. මිලියන 2.6 හර ශේෂ ගැලපීමෙන් පසු පොදු තැන්පත් ගිණුමේ හර ශේෂය රු. මිලියන 77,109.3 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2009 ඔක්තෝබර් 29 දිනැති අංක 200/2009 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2009 නොවැම්බර් 01 දිනට පසුව පැරණි ගිණුම්වලට, කිසිදු තැන්පතුවක් බැර නොකර එම ගිණුම්වල පවතින ශේෂ නිරවුල් කිරීමෙන් පසු එම පොදු තැන්පත් ගිණුම් අහෝසි කළ යුතු වුවද එකතුව රු.මිලියන 2 ක හර ශේෂයක්ව පැවැති තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් එසේ සිදු කර නොතිබුණි.

### 23.2.7 පාඩු හා හානි

2013 වර්ෂයේ පාඩු හා හානි වටිනාකම රු.225,621,581 වන අතර, එය ඉකුත් වර්ෂයේ පාඩු හා හානි වටිනාකම වූ රු.133,266,321 ට වඩා රු.92,355,260 ක වැඩිවීමක් හෙවත් සියයට 69.3 ක වැඩි වීමකි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා හානි ලෙස රු.225,621,581 ක ශේෂයක් සඳහන් කර තිබුණි. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2013 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම්වල ඩී.ජී.එස්.ඒ.7(1) ප්‍රකාශවල සඳහන් පාඩු හා හානි ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. විගණිත දිනය වූ 2014 අප්‍රේල් 21 දිනට විගණනය වෙත ලැබී තිබූ ශීර්ෂ 46 කට අදාල විසර්ජන ගිණුම්වල ඩී.ජී.එස්.ඒ.7(1) ප්‍රකාශවල දක්වා තිබූ හානි හා පාඩු වටිනාකම රු.249,045,257 ක් වී තිබුණි.

## 23.2.8 ස්ථාවර වත්කම් ගිණුම් තැබීම

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මූලධන ප්‍රතිපාදන යටතේ, ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම් හා එකතු කිරීම් සඳහා එකතුව රු.219,283,847,951 ක් උපයෝජනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රජය සතු ස්ථාවර වත්කම් වටිනාකම් වෙන් වශයෙන් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම ගිණුම් පිළියෙල කිරීමේදි අනුගමනය කර තිබූ සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් බැහැර කිරීම් ගණනය නොකිරීමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුවද ස්ථාවර වත්කම්වල සත්‍ය අගය මූල්‍ය ප්‍රකාශන මඟින් පිළිබිඹු නොවීය. සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සහ එකතු කිරීම් වටිනාකම් පිළිවෙලින් රු.27,336,766,157 ක් හා රු.191,947,081,794 ක් විය.

(ආ) කල්බදු යටතේ වාහන මිලදී ගැනීම් සඳහා ගෙවන ලද 1,885,267,693 ක් ''වාහන සඳහා එකතු කිරීම්'' තුළ අන්තර්ගත වී තිබුණි.

## 23.2.9 රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය

-----------------------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනට රජය සතු ව්‍යාපාර 125 ක මුළු ප්‍රාග්ධන දායකත්වය රු.212,976,260,878 කි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජය සතු ව්‍යාපාර 125 න් 14 ක රජය විසින් ආයෝජන කර තිබූ එකතුව රු.461,505,280 ක ප්‍රාග්ධනයට දායකවීම එම ව්‍යාපාරවලින් සනාථ කරගෙන නොතිබුණි.

(ආ) රජය සතු ව්‍යාපාර 12 ක එකතුව රු.124,269,630,593 ක් මහා භාණ්ඩාගාරය විසින් දායක වී තිබූ බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම ව්‍යාපාර ආයතන විසින් තහවුරු කර තිබුණු ප්‍රාග්ධන දායකත්වයේ එකතුව රු.160,536,354,844 ක් විය. ඒ අනුව එම ආයතන 12 ට අදාළව ප්‍රාග්ධන දායකත්ව ප්‍රමාණය රු.36,266,724,251 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) රජය සතු ව්‍යාපාර 125 න් 08 කට අදාළව එකතුව රු.35,828,544,856 ක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධනයට දායක වී තිබූණු බව මූල්‍ය ප්‍රකාශනවල

දක්වා තිබුණත් එම ව්‍යාපාර ආයතන විසින් තහවුරු කරන ලද ප්‍රාග්ධන දායකත්වයේ එකතුව රු.30,727,606,329 ක් විය. ඒ අනුව, එම ආයතන 08 ට අදාළව අඩුවෙන් තහවුරු කර තිබූ ප්‍රාග්ධන දායකත්වයේ එකතුව රු.5,100,938,527 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රාග්ධනයට රු.1,636,043,832 ක්වූ රජයේ ප්‍රාග්ධන දායකත්වය 2013 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට "මිහින් ලංකා" පුද්ගලික සමාගමේ ප්‍රාග්ධන ශේෂ සනාථ කිරීමට අනුව, රජය සතු කොටස් වටිනාකම රු.5,140,610,810 කි. එම කොටස් ප්‍රාග්ධනයට අමතරව රජය සතු ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස සනාථ කර තිබූ මුදල රු.2,807,419,946 කි. මෙම ප්‍රාග්ධන අත්තිකාරම් මුදල ජනරජ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර නොතිබුණි.

### 23.2.10 ප්‍රාග්ධන දායකත්වයට ආදායම් ලැබීම්

රජයට අයත් ආයතන 62 ක්, වැවිලි සමාගම් 24 ක්, සංවර්ධන බැංකු 02 ක් හා ඇමරිකානු ඩොලර්වලින් ප්‍රකාශිත සංස්ථා 3 ක් වශයෙන් වූ ආයතන 91 ක කොටස් ප්‍රාග්ධනයේ එකතුව රු.82,900,260,159 ක් ආයෝජනය කර තිබුණද, එකතුව රු.33,750,711,417 ක් ආයෝජනය කර තිබුණු ආයතන 38 කින් පමණක් සමාලෝචිත වර්ෂයේදී රු.4,768,286,280 ක ලාභාංශ ලැබී තිබුණි. එම ලාභාංශ මුදල මුළු ආයෝජන වටිනාකමින් සියයට 6 කටත් වඩා අඩු ප්‍රමාණයක් වී තිබුණි.

### 23.2.11 විදේශ ණය හා විදේශ ප්‍රදාන

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විදේශ ණය සහ විදේශ ප්‍රදාන ලෙස පිළිවෙලින් රු.201,068,225,000 ක් හා රු.12,952,025,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ ප්‍රතිශෝධිත විදේශ ණය ඇස්තමේන්තුවට වඩා රු.40,487,118,000 ක හෙවත් සියයට 16.8 කින් හා විදේශ ප්‍රදාන රු.416,303,000 ක හෙවත් සියයට 3.1 කින් අඩු වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ විදේශ ප්‍රදාන සඳහා වූ මූලික ඇස්තමේන්තුව රු.20,000,000,000 ක් දක්වා රු.7,047,975,000 කින් වැඩි කර ප්‍රතිශෝධිත කර තිබුණි. විස්තර පහත සටහනෙහි දැක්වේ.

| | වාර්ෂික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | තථ්‍ය ලැබීම් | වියදම් සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදන | වාර්ෂික වියදම් | ඉතිරිය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විදේශ ණය | 201,068,225,000 | - | 183,317,158,351 | 214,151,792,146 | 185,654,462,497 | 28,497,329,649 |
| විදේශ ප්‍රදාන | 12,925,025,000 | 20,000,000,000 | 15,858,996,167 | 19,026,786,134 | 14,847,556,499 | 4,179,229,635 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියදම් මූල්‍යකරණය සඳහා විදේශ ණය උපයෝගි කරගෙන ප්‍රතිපාදන සැලසීමේදී ඇස්තමේන්තුගත විදේශ ණය ප්‍රමාණයට වඩා රු.13,083,567,146 වැඩියෙන් වියදම් සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සත්‍ය විදේශ ණය ලැබීම් රු. 183,317,158,351 වුවද, ශීර්ෂ 41 ක් යටතේ උපයෝජනය කර තිබුණු මුළු ප්‍රතිපාදනය රු.185,654,462,497 ක් වී තිබුණි. ඒ අනුව ලැබුණු ණය ප්‍රමාණය රු.2,337,304,146 කින් ඉක්මවා විදේශ ණය මගින් උපයෝජනයන් කිරීමේ නිවැරදිභාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) ශීර්ෂ 11 ක් යටතේ විදේශ ණය මූල්‍යකරණය යටතේ රු.4,464,592,366 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන මූල්‍යකරණය යටතේ ශීර්ෂ 14 කට රු.1,430,339,955 ක් ප්‍රතිපාදනය සළසා තිබුණත්, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඌන උපයෝජිතව පැවතිණි.

(ඉ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පිළියෙල කරනු ලබන 854-1 වාර්තාව අනුව 2013 වර්ෂයේදී ණය ගිවිසුම් 11 කට අදාළව ලැබී තිබුණු රු.14,718,564,079 ක විදේශ ණය ගිණුම් ගත වී නොතිබුණි.

(ඊ) පහත දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශනයේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාව අනුව ආපසු ගෙවිය යුතු ණය ශේෂය හා වර්ෂය තුළ පියවා ඇති ණය මුදල් අතර වෙනසක් පැවතුණි. ගිණුම් නොසැසඳීම් නිසා නිවැරදි ගිණුම් ශේෂය කුමක්ද යන්න විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | 854 – 1 වාර්තාව අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ගෙවිය යුතු ණය ශේෂය | 2,491,067,436,322 | 2,756,270,641,876 | 265,203,205,554 |
| වර්ෂය තුළ ගෙවූ ණය මුදල | 94,895,887,005 | 105,625,648,033 | 10,729,761,028 |

(උ) ණය ගිවිසුම් 36 කට අදාලව ලැබී තිබූ විදේශ ණයවල වටිනාකම රු.65,976,391,933 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ 854 -1 වාර්තාවේ එකී ණය ගිවිසුම්වලට අදාලව රු.133,885,346,910 ක ණය ලැබී ඇති බව සඳහන් කර තිබුණි. මේ නිසා විදේශ ණය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල රු.67,908,954,977 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඍ) 2011 ජූනි 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2011 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය චීන සමාගමකින් ණය පදනම මත ඇමරිකානු ඩොලර් මිලියන 115.8 ක් වූ ඉදි කිරීම් උපකරණ ඒකක 725 ක් මිලදී ගෙන තිබුණු අතර, ඒ සඳහා ගෙවීම් 2013 වර්ෂය දක්වා මූලධන ප්‍රතිපාදන යටතේ සිදු කර තිබුණි. අනුමැතිය ලබා දුන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 3.2 වගන්තිය ප්‍රකාරව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය, චීන සමාගම සමඟ ණය ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත්, එවැනි ණය ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර රාජ්‍ය ණයක් ලෙසද මෙම මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව විදේශ ප්‍රදානවල වටිනාකම රු.15,858,996,167 ක් වී තිබුණි. එය සංශෝධිත විදේශ ණය ප්‍රදාන අගය වූ රු.20,000,000,000 ට වඩා රු.4,141,003,833 කින් අඩු වී තිබුණි. එහෙත් ව්‍යාපෘති 73 කට ලැබී තිබුණු විදේශ ප්‍රදාන රු. 6,020,393,784 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර නොතිබුණි.

### 23.2.12 අත්තිකාරම් ගිණුම

2012 අංක 23 දරන විසර්ජන පනත මගින් පනවන ලද ගිණුම් සීමාවන් නොසළකා විෂය අංක 30601 දරන අත්තිකාරම් කටයුත්තේදී රු.570,000,000 ක් වූ උපරිම වියදම් (හර) සීමාව ඉක්මවා රු.1,274,671,550 ක් වැය කර තිබුණි.

## 23.3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 23.3.1 රාජ්‍ය ආදායම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රජයේ මුළු ආදායම රු.බිලියන 1,303 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව රජයේ මුළු ආදායම රු. බිලියන 1,212 දක්වා රු. බිලියන 91 කින් අඩු කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 7 ක් වී තිබුණි. 2013 වර්ෂයේ තථ්‍ය ආදායම විදේශ ප්‍රදාන සමග රු. බිලියන 1,082 ක් විය. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුව රු. බිලියන 130 ක අධි ඇස්තමේන්තුවක් වී තිබුණි.

(ආ) සංශෝධනයන් සිදු කරන ලද ආදායම් සංකේත 50 ක ආදායම් ඉපයීම එම සංශෝධන මට්ටමටද වඩා එකතුව රු. මිලියන 184,257 කින් අඩු වී තිබුණි.

(ඇ) 2013 වර්ෂයට අදාල පහත සඳහන් ආදායම් සංකේත 19 හි, රැස් කිරීම් ඉකුත් වර්ෂයට වඩා අඩු වී තිබුණි.

| ආදායම් සංකේතාංකය | ආදායම් විස්තරය | සමාලෝචිත වර්ෂයට අදාල ලැබීම් (2013) | ඉකුත් වර්ෂයට අදාල ලැබීම් (2012) | ආදායම් අඩු වීම | ආදායම අඩුවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 10:02:01:04 | ආනයන බදු | 96,590 | 99,469 | 2,879 | 3 |
| 10:02:05:03 | ඛණිජ තෙල් නිෂ්පාදන බදු | 27,131 | 28,466 | 1,335 | 5 |
| 10:02:05:99 | වෙනත් බදු | 2,516 | 3,336 | 820 | 24 |
| 10:03:02:00 | පැවරුම් බද්ද | 1,146 | 1,253 | 107 | 8 |
| 10:03:04:00 | කොටස් ගනුදෙනු බද්ද | 289 | 592 | 303 | 51 |
| 10:03:07:03 | පෞද්ගලික දැව ප්‍රවාහන බද්ද | 56 | 59 | 3 | 5 |
| 10:01:03:00 | ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු බද්ද | 458 | 513 | 55 | 11 |
| 10:01:04:00 | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද | 61,506 | 70,111 | 8,605 | 12 |
| 10:04:03:99 | ගාස්තු හා වෙනත් බදු | 255 | 344 | 89 | 26 |
| 10:04:04:00 | ආර්ථික සේවා ගාස්තු බද්ද | 6,596 | 14,864 | 8,268 | 56 |
| 20:02:01:04 | ප්‍රාදේශීය වතු සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී | 695 | 771 | 76 | 10 |
| 20:02:03:00 | ලාභ | 30,400 | 42,214 | 11,814 | 28 |
| 20:03:01:00 | දෙපාර්තමේන්තුමය විමසීම් | 143 | 180 | 37 | 21 |
| 20:03:02:13 | විභාග හා අනෙකුත් ගාස්තු | 156 | 263 | 107 | 41 |
| 20:03:02:14 | මෝටර් රථ ප්‍රවාහන යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 6,525 | 6,578 | 53 | 0.8 |
| 20:03:02:17 | ඇගළුම් සඳහා දේශීය විමසුම් මත ගාස්තු | 91 | 105 | 14 | 13 |
| 20:03:03:00 | දඩ මුදල් හා රාජසන්තක කිරීම | 2,274 | 5,137 | 2,863 | 56 |
| 20:05:01:00 | මහ බැංකුවේ ලාභ | 26,350 | 43,000 | 16,650 | 39 |
| 20:05:99:00 | ජාතික ලොතරැයි මණ්ඩලය හා වෙනත් | 2,173 | 2,223 | 50 | 2 |

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 35 ක සංශෝධිත ආදායම් ඇස්තමේන්තු අගයන් ඉක්මවා එකතුව රු.මිලියන 99,463 ක් ආදායම් රැස් කර තිබුණි. ආදායම වැඩිවීම් පරාසයන් සළකා බලන විට තාත්වික ඇස්තමේන්තුවක් සිදු වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 21 ක මුල් ආදායම් ඇස්තමේන්තු හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තු අතර ඉහළ විචලතාවයක් පැවතුණි.

(ඊ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ හිඟ හිටි ආදායම් වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී හිඟ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණු රු.7,785,285,540 ක ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් වී නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| **ආදායම් සංකේතය** | **විස්තරය** | **හිඟ ආදායම** |
|---|---|---|
| | | රු. |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 334,852,341 |
| 2002.02.01 | පොලිය - ණය දීම | 3,157,778,924 |
| 2002.02.99 | පොලිය - වෙනත් | 90,277 |
| 2003.02.99 | විකුණුම් ගාස්තු - විවිධ | 5,098,993 |
| 2003.99.00 | විකුණුම් ගාස්තු - අනෙකුත් ලැබීම් | 13,000 |
| 2006.04.00 | ප්‍රාග්ධන ආදායම් ණය ආපසු අය කර නොගැනීම | 4,287,452,005 |
| | **එකතුව** | **7,785,285,540** |

## 23.3.2 රාජ්‍ය වියදම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. 2013 වර්ෂය සඳහා රාජ්‍ය වියදම සඳහා ප්‍රතිපාදන 2012 අංක 23 දරන විසර්ජන පනතින් සළසා තිබුණි. ඒ අනුව ශීර්ෂ 202 ක් සඳහා රු.බිලියන 827 ක් පුනරාවර්තන වියදම් සඳහාද, රු.බිලියන 560 ක් මූලධන වියදම් සඳහාද වශයෙන් එකතුව රු.බිලියන 1,387 ක ප්‍රතිපාදන සළසා තිබුණි. පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු පුනරාවර්තන වියදම රු.බිලියන 463 ක් ද මූලධන වියදම රු.බිලියන 717 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 1,180 ක වියදමක්ද සමාලෝචිත වර්ෂයේ දැරිය යුතු විය. ඒ අනුව රාජ්‍ය වියදම් සඳහා රු.බිලියන 2,567 ක ප්‍රතිපාදන 2013 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ දක්වා තිබුණි. මීට අමතරව විශේෂ නීති සේවා සඳහා අතිරේකව ලබාදුන් රු.බිලියන 36 ක ප්‍රතිපාදන සමඟ 2013 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදනය රු.බිලියන 2,603 ක් විය. පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 02 සංවර්ධන වැඩසටහනට පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන 37 ක්ද මූලධන වියදම් සඳහා රු. බිලියන 37 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 74 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී අදාලව රු.1,310,984,362,030 ක් පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදනය කර තිබූ අතර ඉන් රු.1,253,508,957,764 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.57,475,404,266 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 4.4 ක් වී තිබුණි. මූලධන වියදම් සඳහා රු.1,291,988,759,988 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.1,158,097,060,349 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.133,891,699,639 ක්වූ මූලධන ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථයක් මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 10.4 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශීර්ෂ 60 ක පුනරාවර්තන වැය විෂයයන් 23 ක් සඳහා සළසා තිබුණු රු.1,451,483,366 ක ප්‍රතිපාදන හා ශීර්ෂ 97 ක මූලධන වැය විෂයන් 15 ක් සඳහා සළසා තිබුණු රු.11,915,542,020 ක ප්‍රතිපාදනද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

(ආ) ශීර්ෂ 126 ක පුනරාවර්තන වැය විෂයන් 28 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.134,657,421,551 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.89,567,307,166 කයෝජනය කර තිබුණි. ඒ අනුව රු.45,090,114,385 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 33 ක් වී තිබුණි. ශිර්ෂ 126 වැය විෂයයන්ගේ ඌන ප්‍රතිපාදන උපයෝජනය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 99 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

| **ඉතිරිවීම් පරාසය** | **මුළු ප්‍රතිපාදනය පුනරාවර්තන** | **මුළු වියදම පුනරාවර්තන** | **ඉතිරිවීම්** |
|---|---|---|---|
| **සියයට** | **රු.** | **රු.** | **රු.** |
| 76 සිට 99 | 565,142,243 | 84,909,677 | 480,232,566 |
| 51 සිට 75 | 1,892,732,126 | 824,937,103 | 1,067,795,023 |
| 26 සිට 50 | 132,199,547,182 | 88,657,460,386 | 43,542,086,796 |
| එකතුව | 134,657,421,551 | 89,567,307,166 | 45,090,114,385 |

(ඇ) ශීර්ෂ 172 ක මූලධන වැය විෂයන් 16 කට සළසා තිබුණු රු.153,731,989,732 ක ප්‍රතිපාදනයෙන් රු.78,751,069,172 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.74,980,920,559 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය අදාළ ශීර්ෂවල වැය විෂයයන් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

| ඉතිරිවීම් පරාසය | මුළු ප්‍රතිපාදනය මූලධන | මුළු වියදම මූලධන | ඉතිරිවීම් |
|---|---|---|---|
| සියයට | රු. | රු. | රු. |
| 76 සිට 99 | 17,387,273,776 | 1,426,346,194 | 15,960,927,582 |
| 51 සිට 75 | 41,032,556,818 | 16,732,314,091 | 24,300,242,727 |
| 26 සිට 50 | 95,312,159,137 | 60,592,408,887 | 34,719,750,250 |
| **එකතුව** | **153,731,989,731** | **78,751,069,172** | **74,980,920,559** |

(ඇ) විසර්ජන ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැඩසටහන් 02, ව්‍යාපෘති 02 යටතේ සළසා තිබූ අතිරේක ප්‍රතිපාදනවලින්, පුනරාවර්තන වියදම් සඳහා බලපත්‍ර 41 කින් මාරු කර තිබූ රු.7,065,300,607 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා බලපත්‍ර 100 කින් මාරු කර තිබූ රු.19,045,007,779 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට නැවත පවරා ගෙන තිබුණි.

**23.3.3 අයවැය හිඟය**

සමාලෝචිත වර්ෂයේ ජනරජයේ සංශෝධිත අයවැය හිඟය රු.බිලියන 664 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ සංශෝධිත අයවැය හිඟයට වඩා රු.බිලියන 14 කින් එනම් සියයට 02 කින් වැඩි වී තිබුණි. 2013 මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය අයවැය හිඟය රු.බිලියන 643 ක් වූයෙන් එය ඇස්තමේන්තු අයවැය හිඟයට වඩා රු.බිලියන 21 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 7.4 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**23.3.4 ජනරජයේ බැරකම්**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ජනරජයේ මුළු බැරකම රු.මිලියන 6,344,943 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ ජනරජයේ මුළු බැරකම වූ රු.මිලියන 5,717,857 සමඟ සැසඳීමේදී රු.මිලියන 627,086 ක හෙවත් සියයට 11 ක පමණ වැඩි වීමකි. එම වැඩිවීම විස්තරාත්මකව පහත දැක්වේ.

| බැරකම | දෙසැම්බර් 31 දිනට ශේෂය 2013 | 2012 | වෙනස (අඩුවීම)/ වැඩිවීම | වෙනස අඩුවීම/වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| බැංකු අයිරාව | 137,077 | 104,479 | 32,598 | 31.2 |
| මහ බැංකු අත්තිකාරම් | 109,272 | 111,292 | (2,020) | 1.8 |
| විදේශ ණය සක්‍රීය අරමුදල | 22,587 | 22,183 | 404 | 1.8 |
| විවිධ අරමුදල් | 1,386 | 1,457 | (71) | 4.9 |
| රාජ්‍ය ණය ගිණුම් | 5,996,496 | 5,408,760 | 587,736 | 10.9 |
| තැන්පතු හා අනෙකුත් බැරකම් | 83,410 | 75,756 | 7,654 | 10.1 |
| රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ගිණුම | (4,905) | (3,963) | (942) | 23.8 |
| විවිධ ගිණුම් | (380) | (2,107) | 1,727 | 85.4 |
| | 6,344,943 | 5,717,857 | 627,086 | 10.9 |